# රණවිරුවා

2023 මාර්තු • 253 කලාපය



## රණබිමේ හරඹ පෑ විරුවන්ගේ සරඹ

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් හා ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක යුද්ධ හමුදා මූලස්ථානයේ හටපිරිස් අමතයි











ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානි සාගල රත්නායක මහතා පසුගිය මාර්තු 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක නිරත වූහ. එහිදී, යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී පිළිගැනීමේ කතාව පැවැත්වීමෙන් අනතුරුව එම දෙපල යුද්ධ හමුදා සාමාජිකයන් ඇමතූහ.

ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් යුද්ධ හමුදා මූලස්ථානයේ හටපිරිස් අමතමින් පැය 24 පුරා කැපවීමෙන් රාජකාරීන් සිදුකරන සියලුම හමුදා සාමාජිකයින්ට සිය ස්තුතිය පුදකරමින් ඔවුන්ගේ විනයගරුකභාවය ඇගයීමට ලක්කළේය. එමෙන්ම, යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සියලුම සුබසාධන පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ වෘත්තීය ප්‍රගමනය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිත ක්‍රියාමාර්ගයන් පිළිබඳව ද පැහැදිලි කළේය. අනතුරුව, එම දෙපල එහි රැස්ව සිටි පිරිස සමඟින් පසුගිය කාලයේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා යුද්ධ හමුදාව සිදුකරන ලද සුවිශේෂී කාර්යභාරය පිළිබඳව වැඩිදුරටත් අදහස් හුවමාරු කරගත්හ.



# ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමන් සහ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක මිහිඳු සෙත් මැඳුරේ සංචාරයක

ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජේ‍යෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා පසුගිය මාර්තු 24 වන දින අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරේ නේවාසිකව ප්‍රතිකාර ලබන රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා සංචාරයක නිරත වූහ. මිහිඳු සෙත් මැඳුර සුවතා නිකේතන පරිශ්‍රය වෙත සපැමිණි එම දෙපල වෙත හටපිරිස් විසින් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පුදකිරීමෙන් අනතුරුව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්, යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ මිහිඳු සෙත් මැඳුර සේනාවිධායක බ්‍රිගේඩියර් ටීඑස් බාලසූරිය එක්ව උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ.





සංචාරයේ නිරත එම දෙපල එහි වාට්ටු වෙත ගොස් රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන වීරෝදාර රණවිරුවන් 28 දෙනකුගේ සුවදුක් විමසා බලමින් එම රණවිරුවන්ගේ ප්‍රතිකාර සහ පුනරුත්ථාපන කටයුතු පිළිබඳව ද ඔවුනගේ අවශ්‍යතා පිළිබඳවද සොයාබැලූහ.



# "යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සරඹ හා පියවර කෝඳු තරඟාවලිය - 2022"







"යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු සරඹ හා පියවර කෝඳු තරගාවලිය - 2022" ඉකුත් මාර්තු 14 වන දින පනාගොඩ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු සරඹ භූමියේදී පවත්වනු ලැබිය. එහි ජයග්‍රාහී කණ්ඩායම් සඳහා සම්මාන ප්‍රදානය කිරීමේ අවස්ථාවට යුද්ධ හමුදා පිරිස් පරිපාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයෙන් ප්‍රධාන අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

ප්‍රේක්ෂකයන් සහ සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම උත්සවයේදී යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් සහභාගී වූ සරඹ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරනු ලැබූ සරඹ සහ තූර්යවාදක අංග උත්සවයට ගෙනදුන්නේ අලංකාරවත් බවක් සහ අභිමානයකි.

යුද්ධ හමුදා සාමාජිකයින්ගේ විනය සහ පැවැත්ම උසස් මට්ටමින් පවත්වාගෙන යාමේ ඉසව්වක් ලෙස යුද්ධ හමුදාව තුළ අන්තර් රෙජිමේන්තු සරඹ, තූර්යවාදක හා පියවර කෝඳු තරගාවලිය පැවැත්වේ.

එම අවස්ථාව සඳහා දිවයින පුරා පිහිටි පාසල් 21 ක සිසු සිසුවියන් විශාල පිරිසක් ද ඉතා උද්යෝගයෙන් සහභාගී වූ අතර, මෙවැනි තරගයක් නැරඹීමට එලෙස පාසල් සිසු සිසුවියන් පිරිසක් සහභාගී වූ පළමු අවස්ථාව මෙය වීම විශේෂත්වයකි. යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ නිලධාරීන්, සෙසුනිලයන් සහ තවත් ආරාධිතයින් රැසක් ද මෙම අවස්ථාවට එක්වූහ.











තරඟාවලියේ "දක්ෂතම පිරිමි සරඹ කණ්ඩායම" ලෙස ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවත්, දෙවන ස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවත්, තෙවන ස්ථානය ගැමුණු හේවා රෙජිමේන්තුව විසින් හිමිකරගනු ලැබීය. තවද, "දක්ෂතම කාන්තා සරඹ කණ්ඩායම" ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය ප්‍රථම ස්ථානය දිනාගනිද්දී එහි දෙවන ස්ථානය හිමිවූයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායටය.

තරඟාවලියේ "දක්ෂතම කණ්ඩායම් අණදෙන නිලධාරී" ලෙස ශ්‍රී ලංකා පාබල හමුදාවේ කපිතාන් ඒටීඩබ්ලිව්පී හේවගේ ද, දෙවන සහ තෙවන ස්ථාන පිළිවෙලින් ගැමුණු හේවා බලකායේ කපිතාන් එම්ජ්එල්පීඑම් මුතුආරච්චි සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ කපිතාන් ඩබ්ලිව්එම්එච්එස්බී වීරකෝන් දිනාගනු ලැබූහ. තවද, "දක්ෂතම කණ්ඩායම් අණදෙන නිලධාරිනී" ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ කපිතාන් ඩීඑච්ඩී වීරසේකර සම්මාන හිමිකර ගනිද්දී එහි දෙවන ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකායේ ලුතිනන් ඩීආර්එච් දංගම්පොලට හිමිවිය.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව තරඟාවලියේ "දක්ෂතම පියවර කෝඩු කණ්ඩායම" ලෙසත්, ගැමුණු හේවා බලකාය හා ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය පිළිවෙලින් එහි දෙවන සහ තෙවන ස්ථාන හිමිකර ගත්තේය. තවද, ගැමුණු හේවා රෙජිමේන්තුවෙහි බළලත් නිලධාරී II පෙරේරා ටීපීඑස්කේ තරඟාවලියේ "දක්ෂතම සරඹ උපදේශක" වූ අතර, එහි දෙවන ස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවෙහි බළලත් නිලධාරී II ජයකොඩි එල්බී වෙතද, තෙවන ස්ථානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායෙහි බළලත් නිලධාරී II කරුණාරත්න ජීපීජීඑන් වෙතද හිමිවූහ.





# නොහැක්කක් නොමැති මෙහෙවරට ජවබල පිරි තරුණ එකතුවක්






දුෂ්කර හා අභියෝගාත්මක පුහුණුවකින් පසු "මෙරූන් හිස්වැසුම්" පැළඳූ කමාන්ඩෝ භටයින් 265 දෙනකු සහ "දිගුදුර විහිදුම්" මෙහෙයුම් සඳහා වෙහෙසකර පුහුණුවක් ලැබූ යුද්ධ හමුදා සාමාජිකයන් 85 දෙනකුගේ විසිර යෑමේ උත්සවයක් ඉකුත් මාර්තු 15 වන දින කුඩාඔය කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල් පරිශ්‍රයේදී උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි.

කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් පීජීපීඑස් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී වූයේය. අත්දැකීම්වලින් බහුල ප්‍රවීණයන් සහ උපදේශකවරුන් ලබාදුන් ගුරුහරුකම් මධ්‍යයේ අද්විතීය හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙම උත්සවයේදී අංක 51 ඒ, බී, සී සහ ඩී පුහුණු පාඨමාලාවන් සාර්ථකව අවසන් කළ නිලධාරීන් 4 දෙනකු හා සෙසුනිලයින් 261 දෙනකු සමඟ "දිගුදුර විහිදුම්" පුහුණු පාඨමාලා අංක - 17 සාර්ථකව හැදෑරූ නිලධාරීන් 5 දෙනකු සහ සෙබළු 80 දෙනකු විසිර ගියහ.



එහිදී, විසිරගිය කමාන්ඩෝ භටයින්ගෙන් සැදුම්ලත් සම්මාන පෙළපාළියේ හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය යුද්ධ හමුදාධිපති වෙත පුදකළහ. පසුව, දුෂ්කර වූ විශේෂිත පුහුණුවක් හදාරා විශිෂ්ටයන් අතර විශිෂ්ටයකු වෙමින් දේශයේත්, ජාතියේත් වගකීම් ඉටුකිරීමට "නොහැක්කක් නොමැත" යන ආදර්ශ පාඨය පෙරදැරිව කමාන්ඩෝ රෙජිමේන්තුව සමඟ එක්වූ අභීත පුතණුවන්ට කමාන්ඩෝ ලාංඡනය ඔවුන්ගේ දෙමාපියන්ගේ සහ ළඟම ඥාතීන්ගේ සුරතින් පැළඳවූහ. පුරා මාස 18 ක කාලයක් තිස්සේ පැවති මෙම පුහුණු පාඨමාලාවේදී විශිෂ්ට දක්ෂතා දැක්වූ කමාන්ඩෝ භටයින් වෙත කුසලාන සහ සහතිකපත් පිරිනැමීම ඉන් අනතුරුව සිදුවිය.

එම උත්සවයේ සමාප්තියත් සමඟින් කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ පිහිටි යුද්ධ හමුදා පැරෂුට් පතිත කලාපයේදී පැවති "දිගුදුර විහිදුම්" පුහුණු පාඨමාලාවේ විසිරයෑමේ පෙළපාළිය ආරම්භ කෙරිණි. මෙම අවස්ථාවට තවත් වැදගත්කමක් එක්කරමින් කමාන්ඩෝ රෙජිමේන්තුවේ අභිමානවත් 43 වන සංවත්සර දිනයට සමගාමීව එම රෙජිමේන්තු සාමාජිකයින් වෙත විශේෂ සම්මාන කිහිපයක් ද පිරිනැමිණ. මෙම අවස්ථාවේ සුවිශේෂීත්වයක් වූයේ කමාන්ඩෝ සෙබළුන් ඔවුන්ගේ යුද පුහුණු හැකියාවන් මැනවින් ප්‍රදර්ශනය කරමින් විශේෂ සජීවී සංදර්ශනයක්ද ඉදිරිපත් කිරීමය. එහිදී, කමාන්ඩෝ භටපිරිස් සැඟවුණු වෙඩික්කරුවන්ගේ ඉලක්කගත කිරීම්, ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීම, ප්‍රතිත්‍රස්ත සටන්, කේ - 9 සුනඛ සංදර්ශන සහ නිදහස් ආර පැරෂුට් සංදර්ශන ආදී අංග රැසක් ඉදිරිපත් කරමින් මෙම අවස්ථාවට සහභාගීවූවන් විස්මයට පත් කළහ. මෙම විසිරයෑමේ පෙළපාළිය නැරඹීම සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ 1 බලකායේ බලකාධිපති, ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක ඇතුළු ආරාධිතයින් රැසක්ද එක්වූහ.





# යුද්ධ හමුදාධිපති ඒකක අණදෙන නිලධාරීවරුන් අමතයි





යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු, පසුගිය මාර්තු 10 වන දින මාර්ගගත තාක්ෂණය ඔස්සේ අණදෙන නිලධාරීන් අමතමින් වෘත්තීය කාර්යභාරයන්හි යාවත්කාලීන කිරීම, රාජකාරි භූමිකාව වැනි කරුණු පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකළේය. මෙම දේශනයේදී විනය විරෝධී ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීම, නීති විරෝධී හා සමාජ විරෝධී භූමිකාවන්ට සම්බන්ධ නොවීම, සමාජ මාධ්‍ය අනිසි ලෙස භාවිතා නොකිරීම, එහි බලපෑම සහ ප්‍රතිවිපාක යනාදී කරුණු පිළිබඳ යුද්ධ හමුදාධිපති විසින් දැනුවත් කරන ලදී. එසේම අණදෙන නිලධාරීන් යටතේ සේවයේ නියුතු භටපිරිස්ද ඒ සබැඳිව දැනුවත් කරන ලෙසද උපදෙස් ලබාදුන්නේය. රටේ ජනතාව සහ රට ආරක්ෂා කරගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට සහයෝගය දැක්විය යුතු බවත් රට තුළ සාමය සහ සහජීවනය පවත්වාගෙන යාමට අවශ්‍ය දායකත්වය ලබාදෙන ලෙසත් එතුමන් වැඩිදුරටත් අවධාරණය කළේය.

---

# යුද්ධ හමුදාධිපති ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) භටපිරිස් අමතයි






යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු පසුගිය මාර්තු 14 වන දින සන්ධ්‍යාවේ ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සහ ඒ යටතේ ස්ථාපිත රෙජිමේන්තු මධ්‍යස්ථාන ඇතුළු සියලුම යුද්ධ හමුදා කඳවුරුවල සේවයේ නියුතු භටපිරිස් ඇමතුවේය.

එහිදී, යුද්ධ හමුදාධිපති විසින් සියලුම යුද්ධ හමුදා සාමාජිකයන්ගේ විනය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සහ යුද්ධ හමුදාව සතු වත්මන් කාර්යභාරයන් සඳහා පවතින අභියෝග පිළිබඳවද දැනුවත් කළේය. එසේම පුහුණුව, සැලසුම් කිරීම සහ පුරෝකථනය කිරීම තුළින් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ ඇති වැදගත්කම පිළිබඳවද එහිදී වැඩිදුරටත් අවධාරණය කරන ලදී. තවද, යුද්ධ හමුදා සාමාජිකයන් වෙනුවෙන් දුෂ්කරතා මධ්‍යයේ වුවද ක්‍රියාත්මක කරනු ලබන සුබසාධන ව්‍යාපෘති අඛණ්ඩව ඉදිරියටත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරනු ලබන බව ද එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කළේය. එසේම, රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සහය දැක්වීමේ අවශ්‍යතාවය පිළිබඳවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ රටේ මහජනතාවගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා සියලු යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සහයෝගය අවශ්‍ය වන බවත් පැවසීය.

පනාගොඩ යුද්ධ හමුදා ක්‍රීඩා සංකීර්ණයේ දී පැවති මෙම දේශනය සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති ඇතුළු ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.

# එතෙර මෙහෙයට යන සාමසාධක හටකණ්ඩායමෙන් ගෞරවාචාර





ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකායේ (UNIFIL) ශ්‍රී ලංකා යුද්ධ හමුදා 14 වන මුලස්ථාන ආරක්ෂක හට කණ්ඩායම (SLFPC) නියෝජනය කරමින් සාමසාධක රාජකාරීන් සඳහා දිවයිනෙන් පිටත්වීමට නියමිත යුද්ධ හමුදා හටබණ්ඩය ඉකුත් පෙබරවාරි 28 වන දින උදෑසන පනාගොඩ පිහිටි ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත හමුදා ගෞරවාචාර පිරිනමනු ලැබූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක සහ යුද්ධ හමුදා කාලතුවක්කු හමුදාවේ බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූගේ ගෞරවනීය පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි යුද්ධ හමුදාධිපති එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආරක්ෂක හටකණ්ඩායම සහභාගී වීම සංකේතවත් කරමින් ජාතික ධජය, එක්සත් ජාතීන්ගේ ධජය, යුද්ධ හමුදා ධජය සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ධජය එක්සත් ජාතීන්ගේ අතුරු බලකායේ අණදෙන නිලධාරී වෙත භාරදෙනු ලැබීය.






ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකායෙහි (UNIFIL) සාමසාධක රාජකාරීන් සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආරක්ෂක හට කණ්ඩායම (SLFPC) ඉකුත් මාර්තු 02 වන දින උදෑසන දිවයිනෙන් පිටත්වූහ. විවිධ රෙජිමේන්තු රැසක් නියෝජනය කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආරක්ෂක කණ්ඩායම නිලධාරීන් 10ක් සහ සෙසුනිලයින් 115 දෙනකුගෙන් සමන්විත අතර, ඊට ලුතිනන් කර්නල් ඩීපීඅයිටී කළුඅග්ගල අණදීම සිදුකරන අතර, මේජර් ඩබ්ලිව්එම්සීකේ වන්නිනායක දෙවන අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබයි. මෙම ආරක්ෂක හටකණ්ඩායම සඳහා මත්ද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍ය සහ බිම්බෝම්බ හඳුනාගැනීම පිළිබඳව මනා පුහුණුවක් ලබා ඇති සුනඛයින් 4 දෙනකුද ඇතුළත් වේ. යුද්ධ හමුදාධිපති නියෝජනය කරමින් යුද්ධ හමුදා විදේශ මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් පීපීජ් පෙරේරා එච්ඩීඑම්සී පීඑස්සී ඇතුළු යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකු දිවයිනෙන් පිටත්ව යන ආරක්ෂක හට කණ්ඩායම වෙත සුබපැතුම් පිරිනැමීමට ගුවන් තොටුපළ වෙත පැමිණ සිටියහ.

# යුද්ධ හමුදා බිම්බෝම්බ ඉවත් කිරීමේ පළමු කාන්තා කණ්ඩායමට නිල ලාංඡන හිමිගැන්වේ





ජාත්‍යන්තරව පිළිගත් "මානුෂීය බිම් වෙඩි කෙත් නිසැක කිරීමේ පාඨමාලා අංක - 01" සාර්ථකව අවසන් කළ යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායමේ සාමාජිකාවන් වෙත නිල ලාංඡන පැළඳවීම ඉකුත් මාර්තු 22 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් සිදුවිය. 2021 දෙසැම්බර් මාසයේදී බූඔය ඉංජිනේරු බලසේනා මූලස්ථානයේදී සහ යාපනය, මයිලඩි ප්‍රදේශයේ පිහිටි 10 වන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානයේදී පැවති මානුෂීය බිම්වෙඩි කෙත් නිසැක කිරීමේ පාඨමාලාව සාර්ථකව හැදෑරූ නිලධාරිනියන් තිදෙනකු සහ සෙබළියන් 51 දෙනකුගෙන් යුත් කණ්ඩායමක් සඳහා එහිදී යුද්ධ හමුදාධිපති විසින් සංකේතාත්මකව නිල ලාංඡන පළඳවනු ලැබීය.

ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ අධීක්ෂණය මත අවසන් අදියර සඳහා පෙනී සිටීමෙන් පසු මෙම කණ්ඩායම ක්ෂේත්‍ර මෙහෙයුම් ඇතුළත්ව පවත්වනු ලැබූ බිම්බෝම්බ ඉවත් කිරීමේ පාඨමාලාවේ අවසන් අදියර සඳහා මේ වසර ආරම්භයේදී සහභාගී වූහ. පාඨමාලාව හැදෑරූ එම සෙබළියන් වෙත එම පාඨමාලාවට හිමි නිල ලාංඡන පැළඳවීම සඳහා යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක සමඟින් ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති සහ ශ්‍රී ලංකා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී, ඉංජිනේරු සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑච්එල්ජී අමරපාල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ද එක්වූහ.

බිම්බෝම්බ ඉවත් කිරීමේ පාඨමාලාව සම්පූර්ණ කළ කාන්තා නිලධාරිනියන් තිදෙනෙක් සහ සෙසුනිලයන් 51 දෙනෙක් මේ වනවිට යාපනය, මයිලඩි ප්‍රදේශයේ බිම්බෝම්බ ඉවත් කරන ප්‍රදේශයේ එම කටයුතුවල නිරතව සිටිති. අනාගතයේදී, එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරීන්හි බිම්බෝම්බ ඉවත් කිරීමේ අත්දැකීම් හා දැනුම ලබාගැනීම සහ එය වර්ධනය කරගැනීම සඳහා පිරිමි සොල්දාදුවන් සමඟ කටයුතු කිරීමේ අවස්ථාව ඔවුන් වෙත හිමිවේ. වසරකට අධික කාලසීමාවක් පුරාවට පැවති මෙම පාඨමාලාවේ ප්‍රථම අදියර 2021 දෙසැම්බර් මස 30 දින බූඔය ඉංජිනේරු බලසේනා මූලස්ථානයේදී ආරම්භ වූ අතර 2022 ජූනි මස 6 දින යාපනය, මයිලඩි ප්‍රදේශයේ පිහිටි 10 වන ක්ෂේත්‍ර ඉංජිනේරු බලකා මූලස්ථානයේදී පාඨමාලාවේ දෙවන අදියර ආරම්භ කෙරිණි.



# ගජබා රෙජිමේන්තු ප්‍රවීණයන්ගේ සංගමයේ වාර්ෂික මහසභා රැස්වීම

ගජබා රෙජිමේන්තු ප්‍රවීණයන්ගේ සංගමයේ වාර්ෂික මහසභා රැස්වීම පසුගිය මාර්තු 26 වන දින බත්තරමුල්ලේ පිහිටි "අපේ ගම" පරිශ්‍රයේදී විශ්‍රාමික නිලධාරීන් සහ සෙසුනිලයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. මෙම අවස්ථාව සඳහා සම්භාවනීය ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික) සහභාගී විය. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඇතුළු එම රෙජිමේන්තුවේ ප්‍රවීණයන්, ජ්‍යෙෂ්ඨ කණිෂ්ඨ විශ්‍රාමික නිලධාරීන් සහ සෙසුනිලයන් 300 කට අධික පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

මෙම වාර්ෂික මහසභා රැස්වීමේදී, ප්‍රවීණයන් වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන සුබසාධන ව්‍යාපෘතීන් සහ තවත් කරුණු පිළිබඳව සාකච්ඡා කෙරුණු අතර එහිදී, එම අවස්ථාවට විශේෂ ආරාධිතයකු ලෙස සහභාගී වූ ගජබා රෙජිමේන්තු ප්‍රවීණයන්ගේ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු ද වන යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් එම සංගමය වෙතින් සිදුකරනු ලබන සුබසාධන ව්‍යාපෘතීන් සඳහා මූල්‍ය පරිත්‍යාගයක්ද සිදුකරන ලදී.










# ප්‍රශංසනීය සේවය අගයා "යුද්ධ හමුදාධිපති ප්‍රණාම සහතික"



පුහුණු උපදේශකවරුන්ගේ විශිෂ්ට සේවය ඇගයීමට ලක්කරමින් උපදේශකවරුන් 16 දෙනකු වෙත "යුද්ධ හමුදාධිපති ප්‍රණාම සහතික පත්‍ර" පිරිනැමීම පසුගිය මාර්තු මස 08 වන දින සිදුකෙරිණ. ජාතික ශිෂ්‍යභට බලකාය වෙත ජනාධිපති වර්ණ ප්‍රදානෝත්සවයේදී පුහුණු උපදේශකයින් ලෙස විශිෂ්ට කාර්යභාරයක් ඉටුකරනු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරින් 15 දෙනකු වෙත එහිදී මෙම ඇගයීම් සහතිකපත්‍ර ප්‍රදානය කරනු ලැබිය. යුද්ධ හමුදාවට බැඳුණු දින සිට නොකැලැල් සේවාවක් ඉටුකරනු ලබන 22 වන පාබල සේනාංකයේ රියදුරකු වෙතද එම අවස්ථාවේදී ඇගයීම් සහතිකයක් ප්‍රදානය කිරීම විශේෂත්වයකි.

මෙම අවස්ථාව සඳහා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී, ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඑස් ෆොන්සේකා යූඑස්පී පීඑස්සී සහ පිරිස් පරිපාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේජ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී පීඑස්සී අයිජී ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයට අභිමන් සෙවණක්





පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ අභිනවයෙන් ඉදිකරනු ලැබූ කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉකුත් මාර්තු 14 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් සුබ මොහොතින් විවෘත කෙරිණි.

එහි අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ඇතුළු එම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ නිලධාරීන්ගේ උණුසුම් පිළිගැනීම් මධ්‍යයේ එම අවස්ථාවට සපැමිණි යුද්ධ හමුදාධිපති නව කාර්යාල ගොඩනැගිල්ල විවෘත කිරීමෙන් අනතුරුව, එහි සෑම අංශයක් පිළිබඳවම නිරීක්ෂණය කරනු ලැබීය. එහිදී, යුද්ධ හමුදා සාමාජිකයින් විසින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකාර්මික කටයුතුවල ප්‍රගතිය හා අනෙකුත් පරිපාලනමය කටයුතු පිළිබඳව යුද්ධ හමුදාධිපති ගේ ඇගයුමට භාජනය විය. යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් ලබාදුන් මාර්ගෝපදේශයන් ඇගයීමට ලක්කරමින් එහි අධ්‍යක්ෂ විසින් යුද්ධ හමුදාධිපති වෙත එහිදී විශේෂ සමරු තිළිණයක් ද ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාවට යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකා බලකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද එක්වූහ.

# සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය යුද්ධ හමුදාධිපති ගේ නිරීක්ෂණයට

සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් බීකේජීඑම්එල් රොද්‍රිගෝ ආර්එස්පී පීඑස්සී අයිජී ගේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එම විද්‍යාලයේ වත්මන් තත්ත්වය පිළිබඳ සොයාබැලීමේ අරමුණින් පසුගිය මාර්තු 23 වන දින සංචාරයක නිරත විය.

එම විද්‍යාල පරිශ්‍රයට අලංකාරයක් සහ ගාම්භීර බවක් එක්කරමින් එහි ස්ථාපිත කරනු ලැබූ ප්‍රදර්ශනාත්මක ටී - 55 යුද ටැංකිය සහ මිලිමීටර් 130 කාලතුවක්කුව නිරාවරණය කිරීමද යුද්ධ හමුදාධිපති ගේ සුරතින් සිදුවිය. එම ටී - 55 යුද ටැංකිය භාවිතයෙන් ඉවත් කිරීමට පෙර වර්ෂ 1996 සහ 1997 කාලය තුළ "සත්ජය" සහ "ජයසිකුරු" මෙහෙයුම්වලදී කොටි ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය සඳහා භාවිතා කරන ලදී. මිලිමීටර් 130 වර්ගයේ කාලතුවක්කුවද භාවිතයෙන් ඉවත් කිරීමට පෙර 2009 මැයි මාසයට ප්‍රථම උතුරු නැගෙනහිර ප්‍රදේශයේ පැවැති මානුෂීය මෙහෙයුම් සඳහා භාවිතා කර ඇත. යුද්ධ හමුදාධිපති එහි සේනාවිධායක සමගින් එම විද්‍යාලයේ ශිෂ්‍ය නිලධාරීන්ගේ පංති කාමර, දේශීය හා විදේශීය උපාධි අපේක්ෂකයන්ගේ නවාතැන් පහසුකම්, විභාග ශාලා, ආහාර ලබාගන්නා ස්ථාන සහ අනෙකුත් පහසුකම්ද නිරීක්ෂණය කළහ.





# යුද්ධ හමුදාධිපති නැගෙනහිර භටපිරිස් අමතයි



ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ආරාධනයකට අනුව එම බලප්‍රදේශයේ සේවයේ නියුතු භටපිරිස් හමුවීමේ අරමුණින් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් මාර්තු මස 30 වන දින සංචාරයක නිරත විය. ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ ස්ථාපිත සියලුම සේනාංක, බලසේනා සහ ඒකකයන් නියෝජනය කරමින් මෙම අවස්ථාවට සහභාගී වූ නිලධාරීන් සහ සෙබළුනිලයන් ආමන්ත්‍රණය කිරීමටද යුද්ධ හමුදාධිපති එහිදී අමතක නොකළේය.





# යුද්ධ හමුදා ත්‍රෛභාෂා විද්‍යුත් පුවත්පත එළිදැක්වේ






යුද්ධ හමුදා මූලස්ථානයේ ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සම්පාදනය කළ පළමු ත්‍රෛභාෂා විද්‍යුත් පුවත්පත වන "යුද හමුදා දෙසතිය" එළිදැක්වීම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් මාර්තු 01 වන දින සිදුකරනු ලැබිය. මෙමගින් යුද්ධ හමුදාව විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් පිළිබඳ සියලුම යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කෙරෙනු ඇත. දෙසතියකට වරක් ප්‍රකාශයට පත්කරන මෙම විද්‍යුත් පුවත්පත දිවයින පුරා රාජකාරියෙහි නියුතු සියලුම යුද්ධ හමුදා භටපිරිස් සහ විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින්ගේ ස්මාර්ට් ජංගම දුරකතනය වෙත බෙදාහැරීම සිදුකෙරේ.

යුද්ධ හමුදා ජනමාධ්‍ය අධ්‍යක්ෂ සහ යුද්ධ හමුදා මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් අයිඑච්එම්ආර්කේ හේරත් යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් නව ත්‍රෛභාෂා විද්‍යුත් පුවත්පත පිළිබඳ සිදුකළ කෙටි හැඳින්වීමකින් පසුව එම විද්‍යුත් පුවත්පත යුද්ධ හමුදාධිපති විසින් එළිදක්වන ලදී. නවීන තාක්ෂණයත් සමගින් නිරන්තරයෙන් යාවත්කාලීන වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු ඩිජිටල් ද්වාරයෙන් එළිදැක්වීම සඳහා මේ වනවිටත් යුද්ධ හමුදා නිල වෙබ් අඩවියක් (www.army.lk), ජාතියේ ආරක්ෂකයා (Defenders of the Nation) නමින් Facebook ගිණුමක්, Twitter ගිණුමක්, Instagram ගිණුමක් සහ Youtube නාලිකාවක් පවත්වාගෙන යනු ලබයි.

# යුද්ධ හමුදාවේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීමට මොරටුව විශ්වවිද්‍යාලයේ සහාය





යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් සිදුකරන ලද ආරාධනයකට අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එන්.ඩී. ගුණවර්ධන ඇතුළු විද්වතුන් කණ්ඩායමක් ඉකුත් මාර්තු 22 වන දින යුද්ධ හමුදා මූලස්ථානයට පැමිණ සුහද සාකච්ඡාවකට එක්වූහ. ශීඝ්‍රයෙන් වෙනස්වන තාක්‍ෂණයත් සමග අත්වැල් බැඳගෙන ඉදිරියට යා හැකි පරිදි යුද්ධ හමුදාවේ තාක්ෂණික අංශ, පර්යේෂණ සහ සංවර්ධන අංශ තවදුරටත් දියුණු කිරීම සඳහා විශේෂඥ උපදේශන ලබාගැනීම සහ ගවේෂණ කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම මෙහි අරමුණයි.

මෙම සාකච්ඡාව සඳහා ප්‍රධාන සංඥා නිලධාරී, පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්‍ෂ, තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ, පර්යේෂණ විශ්ලේෂණ යෝජනා සහ සංවර්ධන ශාඛාවේ ප්‍රධානී, කාලතුවක්කු බලසේනාවේ බලසේනාධිපති, 10 වන කාලතුවක්කු හමුදාවේ සහ 12 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ අණදෙන නිලධාරීන් සහභාගී වූ අතර, ඔවුන් මොරටුව විශ්වවිද්‍යාලයේ විද්වතුන් සමග අනාගතයේදී සිදුකළ යුතු උපායමාර්ගික සැලැසුම් පිළිබඳව අදහස් හුවමාරු කරගන්නා ලදී.

මෙම අවස්ථාව සඳහා මොරටුව විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් ඉංජිනේරු පීඨයේ පීඨාධිපති මහාචාර්ය කේටීඑම්යූ හේමපාල මහතා, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු පීඨයේ ප්‍රධානී ආචාර්ය රංග රොද්‍රිගෝ මහතා, යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ මහාචාර්ය ආර්ජ්ආර්සී ගෝපුර මහතා, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය එස්ආර් මුණසිංහ මහතා, යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ මහාචාර්ය හිමාන් පුංචිහේවා මහතා සහ ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු පීඨයේ ආචාර්ය ඒජ් පැස්කුවෙල් මහතා ද සහභාගී වූහ.

# හවායි ආරක්ෂක අධ්‍යයන ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ උපාධිධාරීන් අතර හමුවක්



ආරක්ෂක අධ්‍යයන සඳහා වූ හවායි ආරක්ෂක අධ්‍යයන ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ (APCSS) හිටපු උපාධිධාරීන් පිරිසක් පසුගිය පෙබරවාරි 27 වන දින රත්මලාන ගුවන් හමුදා කඳවුරේදී සාකච්ඡාවක නිරත වූහ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනි ජූලි චන්ග් (Julie Chung) මැතිනිය සහභාගී වූවාය. අනාගතයේදී කලාපීය ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා වන උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය "අධ්‍යාපනය, සහසම්බන්ධතාවය සහ බලාත්මක කිරීම" යන කරුණු පිළිබඳ එහිදී සාකච්ඡා කෙරිණ.

හවායිහි ආරක්ෂක අධ්‍යයන ආසියා ශාන්තිකර මධ්‍යස්ථාන මගින් වර්තමානයේ සහ අනාගතයේදී නායකයින්ට මුහුණදීමට සිදුවිය හැකි තර්ජන සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි විවිධ පසුබිම් සහිත මානව සම්පත සහජීවනය සහ දැක්මකින් යුතුව අනන්‍ය ඉදිරි දර්ශනයක් ගොඩනැගීමට සවිබල ගැන්වීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද, ගුවන් හමුදාධිපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ‍ද එක්වූහ. යුද්ධ හමුදාපති ආරක්ෂක අධ්‍යයන ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ උපාධිධාරියෙකු වීම එහි විශේෂත්වයකි.

# විජයබාහු තතු විත්ති ඇතුළත් ග්‍රන්ථයක් යුද්ධ හමුදාධිපති වෙත පිළිගැන්වේ

විජයබාහු පාබල රෙජිමේන්තුව විසින් සංස්කරණය කරන ලද තොරතුරු ඇතුළත් ග්‍රන්ථයක් එම රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායක සහ අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී විසින් ඉකුත් මාර්තු මස 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත පිළිගන්වන ලදී. විජයබාහු පාබල රෙජිමේන්තුවේ ආරම්භයේ සිට මේ දක්වා සිදුවූ විකාශනය, යටිතල පහසුකම් සංවර්ධනය, යුද පිටියේ අසමසම ජයග්‍රහණ, රණවිරුවන්ගේ නිර්භීතකම, ධෛර්යය සහ විශේෂයෙන් මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් රණවිරුවන්ගේ අප්‍රමාණ දායකත්වය සහ මානුෂීය මෙහෙයුමේ ලද ජයග්‍රහණ ඇතුළත්ව මෙම ග්‍රන්ථය සම්පාදනය කොට ඇත.



විජයබාහු පාබල රෙජිමේන්තුවේ කර්නල් සේනාවිධායකගේ මඟපෙන්වීම සහ අධීක්ෂණය මත එම රෙජිමේන්තුවේ බ්‍රිගේඩියර් පීඑස් සුහාත් සංජීව ආර්එස්පී පීඑස්සී ඇතුළු කර්තෘ මණ්ඩලයක් විසින් මෙම ග්‍රන්ථය සංස්කරණය කරනු ලැබූහ.

# ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපතිනිය, යුද්ධ හමුදාධිපති හමුවෙයි



ශ්‍රී ලංකාවේ ඉතාලි තානාපතිනි අතිගරු රීටා ගිවුලියානා මැනේලා (HE Rita Giuliana Mannella) මහත්මිය ඉකුත් මාර්තු මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූවාය.

මෙම සුහද හමුවේදී, දෙරට අතර පවතින අන්‍යෝන්‍ය සහයෝගීතාවය සහ ද්විපාර්ශ්වික සබඳතාවයන් තවදුරටත් වැඩිදියුණු කරගැනීමේ හැකියාව පිළිබඳ කරුණු සාකච්ඡා කෙරිණි. මෙම හමුව සමාප්තියේදී යුද්ධ හමුදාධිපති විසින් තනාපතිනිය වෙත සමරු තිළිණයක් ප්‍රදානය කරමින් රාජ්‍යතාන්ත්‍රික ප්‍රයත්නයන් සාර්ථක කරගැනීම වෙනුවෙන් ඇය දක්වන දායකත්වයට සිය සුබපැතුම් එක්කළේය.

# ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකගේ සේවය ඇගයේ



නුදුරේදී ධුරයෙන් නික්මයන ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් කේආර්පී රොවෙල් ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී යූඑස්ඒසීජීඑස්සී (විශ්‍රාමික) ඉකුත් මාර්තු 14 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූයේය. යුද්ධ හමුදාව වෙනුවෙන් ඉටුකරනු ලැබූ අනභිභවනීය සේවාව සම්බන්ධයෙන් සහ විශ්‍රාම ගැනීමෙන් පසුවත් ආරක්ෂක අංශ සඳහා අවශ්‍ය නවෝත්පාදන නිපැයුම් ඉදිරිපත් කරමින් දැක්වූ දායකත්වය වෙනුවෙන් යුද්ධ හමුදාධිපති විසින් ඔහු වෙත සිය ප්‍රශංසාව පුද කරන ලදී. 2009 මැයි මාසයට පෙර කුරිරු ත්‍රස්තවාදයට එරෙහිව පැවැති මානුෂීය මෙහෙයුම පැවති සමයේදී තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පැවති අභියෝගයන් පිළිබඳව ද මෙම සුහද හමුවේදී යුද්ධ හමුදාධිපති සිහිපත් කළේය.

# ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ අධ්‍යක්ෂ ජෙනරාල් යුද්ධ හමුදාධිපති හමුවේ



රියර් අද්මිරාල් පූජිත විතාන යූඑස්පී එන්ඩියූ ඉකුත් මාර්තු 02 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය. මෙම හමුව තුළ මුහුදේ දී නීතිය ක්‍රියාත්මක කරන ආකාරය සහ සමුද්‍ර සම්පත්වල තිරසාර කළමනාකරණය හා සංවර්ධනය වෙනුවෙන් සිදුකරනු ලබන වැඩසටහන් ක්‍රියාවලිය පිළිබඳ යුද්ධ හමුදාධිපති දැනුවත් කළේය.

මුහුදුබඩ ප්‍රදේශවල සිදුවන නීති විරෝධී ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා ඒකාබද්ධ මෙහෙයුම් පුහුණු දියත් කිරීම පිළිබඳව ද මෙහිදී යුද්ධ හමුදාධිපති විසින් කරුණු අවධාරණය කරන ලදී. ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකාය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එම බලකාය මුහුදේ නීතිය ක්‍රියාත්මක කරන ආයතනයක් වන අතර, ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාපවල නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙන නැව්, යාත්‍රා සහ පුද්ගලයින් සෙවීමට සහ අත්අඩංගුවට ගැනීමට නීතිමය බලය එම බලකාය වෙත පවරා ඇත.

# මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායීතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානයේ (*MINUSMA*) උපදේශක කණ්ඩායමක් යුද්ධ හමුදාධිපති හමුවෙති


මාලි රාජ්‍යයේ බහුවිධ ඒකාබද්ධ ස්ථායිතාවය ඇති කිරීමේ මෙහෙයුම් මූලස්ථානයේ (*MINUSMA*) උපදේශක කණ්ඩායම ඉකුත් මාර්තු 21 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ. සාමසාධක රාජකාරීන් සඳහා දිවයිනෙන් පිටත්වීමට නියමිත "ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංග්‍රාමික රථ ආරක්‍ෂක හටබණ්ඩය බී - 1" සාමසාධක මෙහෙයුම් සඳහා ඇති සූදානම නිරීක්‍ෂණ කරමින් එම එක්සත් ජාතීන්ගේ උසස් ඇගයීම් සහ උපදේශක කණ්ඩායමේ සාමාජිකයන් සියලුම සංග්‍රාමික ප්‍රවාහන උපකරණවල (*CCE*) තාක්‍ෂණික ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් පිළිබඳ සොයාබැලීමට නියමිතය.



එහිදී, ඔවුන් 1 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකායෙහි ඉංජිනේරු අංගය, ඇඹිලිපිටිය යුද්ධ හමුදා ඉංජිනේරු පාසල, උඩවලව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපළ සහ ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය යන ස්ථානවල ඉකුත් මාර්තු 20-25 යන දිනයන්හිදී නිරීක්‍ෂණ සංචාරයක නිරතවෙමින් යුද්ධ හමුදාව විසින් නිෂ්පාදනය කරන ලද යුද උපකරණ, සංග්‍රාමික වාහන සහ උපාංග, බිම්බෝම්බ ඉවත් කිරීමේ උපකරණ, පුපුරණ ද්‍රව්‍ය නිෂ්ක්‍රීය කිරීමේ උපකරණ, සැපයුම් සහ වෛද්‍ය උපකරණ, බැරැක්ක භාණ්ඩ ආදිය පරීක්‍ෂා කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සාමසාධක දූත මණ්ඩල රාජකාරී සඳහා පළමුවරට යුද්ධ හමුදා හටපිරිස් යෙදවීමට පෙරද එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙවැනි යෝග්‍යතා පිරික්සුම් වැඩසටහනක් පවත්වන ලදී. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ (*UNDPKO*) නියමකර ඇති පරිදි දූත මණ්ඩල අවශ්‍යතා සපුරාලීම සඳහා යුද්ධ හමුදාවේ යෝග්‍යතාවය පරීක්‍ෂා කිරීම සහ එහි යෝග්‍යතා කොන්දේසි සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම මෙහි අරමුණයි.

# නික්මයන සේනාවිධායකගේ සේවය යුද්ධ හමුදාධිපති ගේ පැසසුමට





නුදුරේදී ධූරයෙන් නික්මයන ජාතික ආරක්ෂක විද්‍යාලයේ හිටපු සේනාවිධායක මේජර් ජෙනරාල් කේජ්ඩී අමල් කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී (විශ්‍රාමික) ඉකුත් මාර්තු 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූයේය.

මෙම සුහද හමුව අතරතුරදී, ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක ලෙස යුද්ධ හමුදාව වෙනුවෙන් සිදුකරනු ලැබූ අපරිමිත සේවයන් ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක විද්‍යාලයේ ප්‍රථම සේනාවිධායක ලෙස කරනු ලැබූ සේවයන් යුද්ධ හමුදාධිපති ගේ ඇගයීමට ලක්විය.

# ආහාර සුරක්ෂිතතා ව්‍යාපෘති යුද්ධ හමුදාධිපතිගේ ඇගයීමට





යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සිදුකරන සංචාරයේ දෙවන අදියර ලෙස ගල්කන්ද පිහිටි යුද හමුදා ගොවිපළ පරිශ්‍රයේ 3 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන කුකුළු පාලන සත්ත්ව ගොවිපළ නිරීක්ෂණය කරනු ලැබුවේය. ඉදිරියේදී කුකුළු පාලනය යුද්ධ හමුදාව යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් ගොවිපළවල ආරම්භ කිරීමට නියමිතව ඇති අතර, යුද්ධ හමුදා සාමාජිකයන්ගේ ආහාර සඳහා අවශ්‍ය සම්පූර්ණ බිත්තර ප්‍රමාණය එම ගොවිපළවල් තුළින් නිෂ්පාදනය කරගැනීමට අපේක්ෂා කෙරේ.

පසුව කන්දකාඩු යුද්ධ හමුදා ගොවිපළ වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති 3 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය යටතේ නිෂ්පාදනය කරනු ලබන කැලෑ සලාක මලු නිෂ්පාදන, කිරි නිෂ්පාදන, කිරි සැකසුම් ඒකකය සහ ගව ගොවිපළ ඇතුළු බහුවිධ ව්‍යාපෘතීන් ද නිරීක්ෂණය කළේය. රටේ ආහාර සුරක්ෂිතතාව වෙනුවෙන් කැපවන හටපිරිස් තවදුරටත් දිරිමත් කරමින් හොඳම කළමනාකාරීත්වයෙන් යුතු ගොවිපළ සහ ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) යටතේ කෘෂිකාර්මික කටයුතුවල නිරත හොඳම යුද්ධ හමුදා සාමාජිකයා වෙත මූල්‍ය ත්‍යාග සහ තවත් විශේෂ ත්‍යාග යුද්ධ හමුදාධිපති විසින් එහිදී ප්‍රදානය කරනු ලැබීය.

# යුද්ධ හමුදාධිපති 22 වන පාබල සේනාංකයේ සංචාරයක

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සංචාරයේ නිරත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය මාර්තු 31 වන දින ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පිහිටි 22 වන සේනාංක මූලස්ථානයේද සංචාරය කළේය. එම සේනාංක මූලස්ථානය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත එහිදී ගජබා රෙජිමේන්තු හටපිරිස් හමුදා සම්ප්‍රදායානුකූල කඳවුරු මුරයේ ගෞරවාචාරය පුදකිරීමෙන් අනතුරුව එම සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබීය.

සිය සංචාරයේදී එහි යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් ආමන්ත්‍රණය කළ යුද්ධ හමුදාධිපති දුෂ්කර කාලසීමාවක් තුළ සියලු ජනවාර්ගිකයන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව සිය වෘත්තියෙහි ගෞරවය සහ විනය ආරක්ෂා කරගනිමින් කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීම පිළිබඳව සියලුම යුද්ධ හමුදා සාමාජිකයන් වෙත සිය ස්තූතිය පුදකළේය. එමෙන්ම, විවිධ සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරත පුද්ගලයින්ගේ ක්‍රියාවන්ට හසුනොවී උදාර සේවය ඉදිරියටත් මවුබිම වෙනුවෙන් ලබාදෙන ලෙස ද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය. මෙම අවස්ථාවට ආරක්ෂක සේනා ආඥාපති (නැගෙනහිර) මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී සහ එම බලප්‍රදේශයේ සේවයේ නියුතු නිලධාරීන් රැසක්ද සහභාගී වූහ.





# මව් විදුහලෙන් උපහාර ලැබ



කොළඹ මහානාම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින් වන යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ත්‍රිවිධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිව්දෙනකු වෙත උපහාර පුදකිරීමේ උත්සවයක් පසුගිය මාර්තු 02 දින එම විද්‍යාලයේදී පැවැත්විණි. එහිදී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් ටීඑස් සලෙයි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී රියර් අද්මිරාල් ජයන්ත කුලරත්න, ශ්‍රී ලංකා නාවික හමුදා කාර්යය මණ්ඩල සහ නාවික සැපයුම් අංශයේ අධ්‍යක්ෂ රියර් අද්මිරාල් චන්දන රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත එලෙස බුහුමන් පුදනු ලැබිය.

එහිදී, එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් එදවස එම විද්‍යාලයේ දීප්තිමත් සිසුන් ලෙස විද්‍යාලයට ගෞරවයක් අත්කරදුන් ආකාරයද වර්තමානයේ ඔවුන්ගේ හමුදා භූමිකාවද ඇගයුමට පාත්‍රවිය. මහානාම විද්‍යාලයේ දරුවන්ගේ සහභාගීත්වයෙන් ආදි ශිෂ්‍ය සංගමය, විදුහල්පති, හිටපු විදුහල්පතිවරුන් සහ ගුරුභවතුන් විසින් සංවිධානය කරනු ලැබූ මෙම උත්සවයට එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සමකාලීන මිතුරන් රැසක්ද එක්වූහ.

# රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයන්හි සංචාරයක

යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පසුගිය මාර්තු 06 සහ 11 යන දිනයන්හි යාපනය ප්‍රදේශයේ ස්ථාපිත පාබල හමුදා ඒකකයන්හි සංචාරයක නිරත විය. එහිදී, 3, 7, 9, 10, 11, 16, 17 හා 20 යන පාබල හමුදා ඒකක ඔහුගේ නිරීක්‍ෂණයට බඳුන් විය. සිය සංචාරය තුළ එම ඒකකයන්හි ක්‍රියාන්විත හා පාලන රාජකාරී මෙන්ම හටපිරිස්වල අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ හෙතෙම එම ඒකකවල සියලු නිලයින් අමතන්නටද අමතක නොකළේය.





*යාපනය ඒකක සංචාරයන් අතරතුරදී*

# ජල පිරිපහදු යන්ත්‍රයක් සෙබළ අයිතියට



අනුරාධපුර, මිහින්තලේ පිහිටි 6 වන ශ්‍රී ලංකා පාබල හමුදා ඒකකයෙහි හටපිරිස් සඳහා පැවති දිගුකාලීන අවශ්‍යතාවයක් සපුරාලමින් එහි සවිකරන ලද ජල පිරිපහදු කිරීමේ යන්ත්‍රයක් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් පසුගිය මාර්තු 06 දින විවෘත කෙරිණි.

# උතුම් ගුණයට පැතුම් කළඹක්





පසුගිය ජනවාරි මස 11 දින හොරොව්පොතාන මහජන බැංකුවේ *ATM* යන්ත්‍රය තුළ දමාගොස් තිබූ රුපියල් 70,400.00 ක මුදල් සහිත පාර්සලයක් එහි හිමිකරු වෙත නැවත ලබාදීමට 5 වන (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුවට අයත් ලාන්ස් කෝප්‍රල් ආර්කේඩීඑස් ධීරසිංහ යන අය විසින් ක්‍රියා කරන ලදි. තත් සෙබළා සිදුකළ එම ආදර්ශමත් ක්‍රියාව අගයනුවස් පසුගිය මාර්තු 08 වන දින ඔහුව සිය කාර්යාලය වෙත කැඳවූ යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ඔහු වෙත ප්‍රණාම ප්‍රසාද උපහාර ඇගයීම් සහතිකයක් ප්‍රදානය කොට ඔහුව කෝප්‍රල් නිලයටද උසස් කරනු ලැබීය. යුද්ධ හමුදාවටද අභිමානයක් ගෙනදෙමින් සිවිල් සමාජය හා යුද්ධ හමුදාව අතර හොඳහිත වර්ධනය කිරීම වෙනුවෙන් එම උතුම් ක්‍රියාව සිදුකළ රණවිරුවාට 'රණවිරුවා' ද මෙසේ සුබපැතුම් එක්කරයි.

# විරුදරු ප්‍රණාම මූලාධාර ප්‍රදානෝත්සවය - 2023





ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේවයේ නියුතු මෙන්ම ක්‍රියාන්විත හේතූන් මත මියගිය සාමාජික සාමාජිකාවන්ගේ හා සිවිල් මහත්ම මහත්මීන්ගේ දූ දරුවන් අතරින් 2019 සහ 2020 වර්ෂවල අපොස (උ/පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල වරම් ලැබූ දූ දරුවන් 47 දෙනකු සඳහා මූල්‍යාධාර ප්‍රදානෝත්සවයක් පසුගිය මාර්තු 23 වන දින එම මූලස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම මූල්‍යාධාර ප්‍රදානය සඳහා ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවේ මූල්‍ය දායකත්වය හිමිවිය. වාර්ෂිකව පැවැත්වෙන මෙම මූල්‍යාධාර ප්‍රදානය සඳහා රුපියල් ලක්‍ෂ තිස්දෙකක මුදලක් රණවිරු දූ දරුවන් වෙත ශිෂ්‍යත්ව වශයෙන් පරිත්‍යාග කරන ලදී.



එම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් තුසිත සිල්වා කේඑස්පී ඇතුළු ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ නිලධාරීන් රැසක්ද, ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව නියෝජනය කරමින් එහි ප්‍රධාන තොරතුරු තාක්‍ෂණ නිලධාරී අලෝක ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කළමනාකාර රවී මෙදිස් ඇතුළු නියෝජිතයින් පිරිසක් ද සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන් මෙන්ම ශිෂ්‍යත්වලාභී දරු දැරියන්, දෙමාපියන් ඇතුළු සම්භාවනීය අමුත්තන් පිරිසක් මේ අවස්ථාව සඳහා සහභාගී වූහ.

# අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික ආසේමු (වන්නි) සංචාරයක





යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඉකුත් මාර්තු 13 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (වන්නි) හි සංචාරයක නිරතවිය. එහිදී, එම බලප්‍රදේශයේ ක්‍රියාත්මක රාජකාරි, පුහුණුවීම් හා වෙනත් පාලන කරුණු සම්බන්ධයෙන් සේනාංකාධිපතිවරුන් හා අනෙකුත් නිලධාරීන් සමග ගෙතෙම සාකච්ඡාවකද නිරතවිය.

# 1 බලකායේ බලකාධිපති කඳවුරු සංචාරයක





1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඉකුත් මාර්තු 11 සහ 13 යන දිනයන්හි 58 වන පාබල සේනාංකයේ සහ විශේෂ බලකා බලසේනා මූලස්ථානයේ නිල සංචාරයක නිරතවිය. එහිදී, බලකාධිපති වෙත හිමිවූයේ ගෞරවනීය පිළිගැනුමකි. සිය සංචාරයේදී එම සේනාංකයේ හා බලසේනාවේ භටපිරිස්වල රාජකාරි ස්වභාවය මෙන්ම ක්‍රියාත්මක හා පාලන අවශ්‍යතා පිළිබඳ සොයා බැලූ හෙතෙම ඔවුන් අමතන්නටද අමතක නොකළේය. අනතුරුව සියලු නිල තේ පැන් සංග්‍රහයකටද එක්වූ බලකාධිපති ක්‍රියාත්මකයන්හි මතක ආවර්ජනය කරමින් සුහද කතාබහකද නිරතවිය.

# විරු දිරියෙන් නව සෙවනක්

යාපනය දිස්ත්‍රික්කයේ, කෝලන්කට්ටි ග්‍රාම නිලධාරී වසමට අයත් කීරමලේ ප්‍රදේශයේ වෙසෙන ආරුමුගම් චන්ද්‍රසේකරම් මහතාගේ පවුලේ සාමාජිකයින් වෙත නව නිවසක් භාරදීම ඉකුත් මාර්තු මස 7 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑච්එස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහභාගී විය. එහි ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා විග් නඩරාජා මහතා මූල්‍ය දායකත්වය ලබාදී ඇති අතර, 9 (සෙව්) ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරීගේ අධීක්‍ෂණය යටතේ අවශ්‍ය තාක්‍ෂණික හා ඉංජිනේරු දැනුම, ශ්‍රම දායකත්වය 511 වන පාබල බලසේනාවේ භටපිරිස් විසින් ලබාදෙනු ලැබූහ.



# සුහදත්වය වර්ධනයට ක්‍රිකට් තරඟාවලියක්





යාපනය ආරක්ෂක සේනා ආඥාපතිගේ උපදෙස් මත එම මූලස්ථානය, ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) සහ ඒ යටතේ ස්ථාපිත ඒකකයන්හි යුද්ධ හමුදා සාමාජිකයින් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් 3 වන ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් සංවිධානය කරන ලද ක්‍රිකට් තරගාවලියක් ඉකුත් පෙබරවාරි 27 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ක්‍රීඩාංගනයේදී පැවැත්විණ.

මෙම ක්‍රිකට් තරගාවලිය සඳහා කණ්ඩායම් 14 ක් තරග වැදුනු අතර, එහිදී, 3 වන සංඥා බලකාය සහ 4 වන වෛද්‍ය බලකා කණ්ඩායම අවසන් තරගයට සුදුසුකම් ලැබීය. එහිදී 4 වන වෛද්‍ය බලකා කණ්ඩායම පිරිමි අංශයේ ශූරතාවය හිමිකරගනු ලැබූ අතර, කාන්තා අංශයේ ශූරතාවය 7 වන යුද්ධ හමුදා කාන්තා බලකාය විසින් දිනාගන්නා ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබීඑස් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහභාගී වූ අතර, එහි සහතිකපත් ප්‍රදානෝත්සවය සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති මේජර් ජෙනරාල් ඒසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක්ද එක්වූහ.

# ශ්‍රවණාධාර කට්ටලයක් පරිත්‍යාග කෙරේ

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හි රාජකාරි නියුතු 4 වන කාන්තා බලකායට අයත් සෙ/ආර්100680 ලා/කෝ වීරක්කොඩි ඩබ්ලිව්අයිඑස්අයි යන කොනොනිගේ දීර්ඝකාලීන ශ්‍රවණාබාධයකින් පෙලෙන සොහොයුරාට රුපියල් 140,000.00 ක් වටිනා ශ්‍රවණාධාර කට්ටලයක් පරිත්‍යාග කිරීම ඉකුත් පෙබරවාරි 28 වන දින සිදුකෙරිණ.

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ මූලිකත්වයෙන් සිදුකළ මෙම මාහැඟි කටයුත්ත සඳහා "සසරින් එතෙරට" පදනම විසින් මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.



# වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ රිදී ජුබිලිය අභිමානවත්ව





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) හි 25 වන සංවත්සරය අති උත්කර්ෂවත් අන්දමින් එහි ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මාර්තු 18 වන දින අභිමානවත්ව සැමරිණ. එහිදී, එම ආරක්ෂක සේනා මූලස්ථානය යටතේ ස්ථාපිත 1 වන ගජබා රෙජිමේන්තු භටපිරිස් විසින් ආඥාපති වෙත බුහුමන් පුදනු ලැබීය. අනතුරුව යුද්ධයේදී මියගිය සහ රණඝිතයට පත් රණවිරුවන් සිහිපත් කිරීම සඳහා කඳවුරු පරිශ්‍රයේ ඇති රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමටද එක්වූ ආඥාපති, එහි සියලු නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතීමෙන් පසු සියලු නිල දිවා භෝජන සංග්‍රහයකටද එක්විය.

# උමං ලෙන් කෞතුකාගාරයක් සඳහා මුල්ගල තැබේ



පොලොන්නරුව ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථානයේ අභිනවයෙන් ඉදිවන උඩුමහල් සදහම් මන්දිරය සහ උමං ලෙන් කෞතුකාගාරය සඳහා මුල්ගල තැබීම ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සීගේ සුරතින් ඉකුත් මාර්තු 09 වන දින සුබ මොහොතින් සිදු කෙරිණ.

තවද, මෙම ඓතිහාසික අවස්ථාව සඳහා 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ජී කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ඇතුළු රාජ්‍ය නිලධාරීන් සහ දායක දායිකාවන් විශාල පිරිසක්ද සහභාගී වූහ.

# පහසුකම් සංකීර්ණයක් විවෘත කෙරේ






ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී විසින් ඉකුත් පෙබරවාරි 26 වන දින 233 වන පාබල බලසේනාවේ නව පහසුකම් සංකීර්ණයක් විවෘත කරන ලදි. එම බලසේනාවේ සහ ප්‍රදේශයේ සිවිල් ප්‍රජාවගේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක් සපුරාලීම අරමුණු කරගෙන ඉදිකරන ලද මෙම පහසුකම් සංකීර්ණය කරනවෑම්හලක් සහ වෙළඳ සංකීර්ණයකින් සමන්විතය. මෙම අවස්ථාවට 23 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 233 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 9 වන කාලතුවක්කු හමුදාව, 6 වන ගජබා රෙජිමේන්තුව සහ 3(සේවා) කෘෂි හා පශු සම්පත් බලකායට අයත් අණදෙන නිලධාරීවරු ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# උපකරණ මාස්ටර් ජෙනරාල් ආසේමු (නැගෙනහිර) සංචාරයක





උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ආර්ඩබ්ලිව්ඩබ්ලිව්එච්ජේබී වනිගසේකර යූඑස්පී ඉකුත් මාර්තු 03 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) නිල සංචාරයක නිරතවූහ. මෙම සංචාරයේදී ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී එන්ඩීසී විසින් එම නිලධාරීන් උණුසුම් අයුරින් පිළිගත් අතර, එහිදී ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර)ට වැදගත් සැපයුම් ගැටළු පිළිබඳ සාකච්ඡා කෙරුණු අතර, එම ප්‍රදේශයේ සැපයුම් කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අදහස් හා යෝජනා ද සලකා බැලිණ.

# සිංහ රෙජිමේන්තු අධිපති ඒකක නිරීක්ෂණ චාරිකාවක





ශ්‍රී ලංකා යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් සහ සිංහ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පසුගියදා 10 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ඒකක සංචාරයක නිරතවිය. එහිදී එම ඒකකයේ හටපිරිස්වල ක්‍රියාන්විත හා පාලන කටයුතු මෙන්ම ඔවුනගේ අවශ්‍යතා පිළිබඳවද හෙතෙම සොයාබැලිය. ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ද එම අවස්ථාවට එක්විය.

# ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති සිය බලප්‍රදේශයේ සංචාරයක



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සිය බලප්‍රදේශයේ සේවයේ නියුතු හටපිරිස්වල සුවදුක් සොයාබැලීමේ අරමුණින් ඉකුත් මාර්තු මස 13 වන දින 681 වන පාබල බලසේනාව සහ ඒ යටතේ ස්ථාපිත ඒකකයන්හි ක්ෂේත්‍ර සංචාරයක නිරත වූයේය.

එහිදී හෙතෙම වලෙයි ප්‍රදේශයේ පිහිටි 9 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවද වලෙයි, නාවික හමුදා කඳවුරේ ස්ථාපිත රේඩාර් ඒකකය ද නිරීක්ෂණය කළේය. පසුව, උදයාර්කට්ටුකුලම් ප්‍රදේශයේ පිහිටි 6 වන ගැමුණු හේවා බලකාය වෙත ගොස් එම ඒකකයේ හටපිරිස් සමගින් සුහදව අදහස් හුවමාරුවකද නිරත වූයේය. සිය සංචාරයේ සමාප්තිය සනිටුහන් කරමින් ආඥාපති 681 වන පාබල බලසේනාව වෙතද ගියේය. මෙම සංචාරය සඳහා 68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 681 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, අණදෙන නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්



573 වන පාබල බලසේනාව යටතේ සේවයේ නියුතු හටපිරිස් කිලිනොච්චිය භාරතීපුරම් විද්‍යාලයේ ඉගෙනුම ලබන විවිධ දුෂ්කරතා මධ්‍යයේ දිවිගෙවන සිසුන් 50 දෙනෙකු වෙත පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් මාර්තු මස 17 වන දින 9 වන විජයබාහු පාබල රෙජිමේන්තු මූලස්ථානයේදී ක්‍රියාත්මක කරන ලදී. අත්තනගල්ල රජමහා විහාරවාසී බුකැන්දයායේ චන්ද්‍රරතන හිමියන්ගේ සම්බන්ධීකරණයෙන් "ලක්දරු යාත්‍රාව" ව්‍යාපෘතිය මෙම වැඩසටහන සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාදුන්නේය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී සහභාගී විය.

# ආරක්‍ෂක සේනා (බටහිර) ආඥාපති නිරීක්‍ෂණ චාරිකාවක





ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් පෙබරවාරි 28 වන දින පනාගොඩ යුධ හමුදා කඳවුරේ පිහිටි 1 වන ශ්‍රී ලංකා යුද හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සංචාරයක නිරත විය. එහිදී ආඥාපති එම බළඇණියේ කාර්යභාරය පිළිබඳව අණදෙන නිළධාරී විසින් පැවැත්වූ සවිස්තරාත්මක දැනුවත් කිරීමකටද සහභාගී විය. ඉන්පසු එහි නිලධාරීන් සමඟ කෙටි සාකච්ඡාවක නිරත වූ හෙතෙම, සෙබළුන් අතර විනය පවත්වා ගැනීම, බළඇණි පරිපාලන කටයුතු සහ ශ්‍රේෂ්ඨ සොල්දාදුවකු ලෙස හැසිරිය යුතු ආකාරය වැනි විවිධ වැදගත් කරුණු පිළිබඳව අවධාරණය කළේය. ඉන් අනතුරුව කඳවුරු පරිශ්‍රයේ ස්ථාන කිහිපයක් නිරීක්ෂණය කළ ආඥාපති එහි නිලධාරීන් සහ සෙසුනිලයින් සමඟ සුහදව අදහස් හුවමාරු කරගැනීමටද අමතක නොකළේය.

# දස වසක අභිමන් සමරා





ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ස්ථාපිත කර ඉකුත් මාර්තු 13 වන දිනට වසර 10 ක් සපිරිණ. ඒ නිමිත්තෙන් එහි ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ පූර්ණ මගපෙන්වීම මත උත්සව මාලාවක් පැවැත්විණ. ඒ අනුව ඉකුත් මාර්තු 03 වන දින බණ්ඩාරවෙල අබේගොඩ සිරිසඟබෝ ළමා නිවාසයේ දරුවන් උදෙසා දිවා ආහාර වේලක් ලබාදුන් අතර, දියතලාව ආයුර්වේද පළාත් මහ රෝහලේ අධ්‍යක්ෂිකා වෛද්‍ය තුෂාරි වන්නිආරච්චි මහත්මියගේ ඉල්ලීමකට අනුව එම රෝහල් පරිශ්‍රය සුද්ධ පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් ද පවත්වනු ලැබීය. 23 වන ගජබා රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ආඥාපති වෙත සංවත්සර දිනයේදී කඳවුරු සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක්ද පිළිගන්වන ලදී. ආඥාපති එහිදී හටපිරිස් ඇමතීමටද කටයුතු කළ අතර සියලු නිල සුහද හමුව සඳහා ද හෙතෙම එක්විය.

# ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති බලසේනා සංචාරයක



ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ඉකුත් මාර්තු 21 වන දින 112 වන පාබල බලසේනාවේ සහ 2 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ සංචාරයක නිරතවිය. එහිදී, හෙතෙම කඳවුරු භූමියේ රුක් රෝපණයක් සිදුකර සමූහ ඡායාරූපයකටද පෙනීසිටියේය. මෙම අවස්ථාවට 112 වන පාබල බලසේනාධිපති මෙන්ම ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# සොළොස් වසක අභිමන් සමරා




57 වන පාබල සේනාංකයේ 16 වන සංවත්සරය ඉකුත් පෙබරවාරි 26 වන දිනට යෙදීතිබූ අතර, එයට සමගාමීව සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි 24 වන දින වැඩසටහන් මාලාවක් පැවැත්විණ. එහිදී, සංඝයා වහන්සේලා වෙත සාංඝික දානයක් පිරිනමා සියලුම රණවිරුවන් හට සෙත්පතන ලදී. තවද සේනාංකාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, රුක් රෝපණය සහ දිවාභෝජන සංග්‍රහයක් පැවැත්වීමද සංවත්සර දිනයේ වැඩසටහන් අතර කැපීපෙනෙන අංග විය.

# අභිමානවත් තුන්වන සංවත්සරය




573 වන පාබල බලසේනාවේ 3 වන සංවත්සරය ඉකුත් පෙබරවාරි 15 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් පසුගිය පෙබරවාරි 02 වන දින බලසේනාධිපති බ්‍රිගේඩියර් එස්ඩබ්ලිව්ආර් ප්‍රසන්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති වැඩසටහන් අතර සම්මාන ආචාර පෙළපාලිය, සියලුනිල දිවා භෝජන සංග්‍රහය මෙන්ම මහා සංඝරත්නය වැඩමවා පැවති බෝධිපූජා පිංකම ප්‍රධාන විය.

# 593 වන පාබල බලසේනාව සංවත්සරය සමරයි





593 වන පාබල බලසේනා මූලස්ථානයේ 14 වන සංවත්සරය ඉකුත් පෙබරවාරි 15 වන දිනට යෙදී තිබිණ. ඒ නිමිත්තෙන් පැවති වැඩසටහන අතර බලසේනාධිපති වෙත කඳවුරු සම්මාන මුරයක් සහ ආචාර පෙළපාලියක් පිරිනැමීම, සියලුනිල දිවා භෝජනය ප්‍රධාන විය. තවද, එදිනම කඳවුර වෙත මහා සංඝරත්නය වැඩම කරවා බෝධිපූජා පිංකමක් පවත්වා මියගිය රණවිරුවන්ට පිං අනුමෝදන් කොට දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන් හට සෙත්පැතීමද සිදුකරන ලදී. තවද, ඉකුත් පෙබරවාරි 16 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට කිරි ආහාර පූජා කිරීමෙන් අනතුරුව වට්ටප්පලෙයි කන්නකි අම්මාන් කෝවිලේදී පැවැත්වූ ආශිර්වාද පූජාවද සංවත්සර දින වැඩසටහන් අතර සුවිශේෂී තැනක් ගත්තේය.

# වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණයක්




22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ අදහසකට අනුව ඉකුත් මාර්තු 11 වන දින ත්‍රිකුණාමලය රොටරැක්ට් සමාජයේ සහයෝගය ඇතිව එම පාබල සේනාංකය විසින් වෘත්තීය මාර්ගෝපදේශන සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. විශේෂයෙන්ම පාසල් හැරගිය ප්‍රදේශයේ තරුණ තරුණියන් නොමඟයාම වළකා යහපත් වෘත්තීයකට ඔවුන් යොමුකිරීමේ අරමුණින් මෙම වැඩමුළුව සංවිධානය කෙරිණ. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ජාතික වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන මධ්‍යස්ථානයේ වෘත්තීය උපදේශකවරියක වන චන්දිමා රුද්‍රිගු මහත්මිය විසින් මෙම සම්මන්ත්‍රණය මෙහෙයවන ලද අතර, ඊට පාසල් හැරගිය සිසුන් 150 කට අධික සංඛ්‍යාවක් සහභාගී වූහ.

# 64 වන පාබල සේනාංකයෙන් හිසට සෙවණක්

643 වන පාබල බලසේනාධිපතිගේ මගපෙන්වීම යටතේ ඔහුගේ හිතමිතුරන්ගේ සහ පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය ඇතිව 64 වන පාබල සේනාංක බලප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී ජේ ඇන්ටනිදාස් මහතා වෙත නිවසක් ඉදිකරදෙනු ලැබීය. 8 වන කාලතුවක්කු හමුදාවේ ශ්‍රම දායකත්වය මත දින 60 ක් වැනි කෙටි කාලයක් තුළ මෙම නිවස ඉදිකරදීම විශේෂත්වයකි. 64 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේඑන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ ප්‍රධානත්වයෙන් එම නිවස අදාළ නිවැසියන් වෙත භාරදීම සිදුකෙරිණ.



# ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති රෝහල් සංචාරයක




ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී එන්ඩීසී ඉකුත් පෙබරවාරි 11 වන දින 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ සහ යුද්ධ හමුදා රෝහල මින්නේරියෙහි කඳවුරු සංචාරයක නිරතවිය. මෙම සංචාරයේදී 5 වන වෛද්‍ය බලකායේ සහ මින්නේරිය යුද්ධ හමුදා රෝහලෙහි දැනට පවතින ගැටලු සහ භකාස අවශ්‍යතාවයන් පිළිබඳව ආඥාපති විසින් ඒකක අණදෙන නිලධාරීන් සමඟ සාකච්ඡා කරන ලදී. තවද, යුද්ධ හමුදා රෝහල මින්නේරියෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් සොයාබලා ඔවුන්ට ත්‍යාග පාර්සල් බෙදාදීමක්ද එදින ආඥාපති අතින් සිදුකෙරිණ.

# රුවන්වැලි මහා සෑ රදුන්ගේ වැලි මළුවේ වැලි ඇතිරීමේ පුජෝත්සවය





අනුරාධපුර රුවන්වැලි මහා සෑ රදුන්ගේ වැලිමළුවෙහි වැලි ඇතිරීමේ පුජෝත්සවය ඉකුත් මාර්තු 03, 04 හා 05 යන දිනයන්හිදී පැවැත්විණ. ඒ සඳහා ආරක්ෂක සේනා (වන්නි) ආඥාපතිගේ උපදෙස් මත 21 වන පාබල සේනාංක මුලස්ථානය හා ඒ යටතේ ඇති බලසේනාවන්හි භටපිරිස් හා ඉදිරි නඩත්තු පෙදස (උතුරුමැද) භටපිරිස් 250 ක් දායකත්වය ලබාදුන්හ. මෙහිදී, පුරා දින 03 ක් මුල්ලේ වැලි කියුබ් 400 කට අධික ප්‍රමාණයක් පිරිසිදු කොට සම්පුර්ණ වැලි මළුව ආවරණය වන සේ වර්ග මීටර් 400 කට අයත් ප්‍රදේශයක අතුරන ලදී.

# පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක්





"ගුණ නැණ බෙලෙන් යුතු මතු පරපුරක් උදෙසා" යන උදාර පරමාර්ථය පෙරදැරිව "අතහිත" සමාජ සත්කාරක පදනම විසින් එහි සංවිධායක ප්‍රසාද් ලොකුබාලසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා යුද විද්‍යාලයේ කාර්ය මණ්ඩලයේද සහභාගීත්වය ඇතිව ඉකුත් මාර්තු 14 වන දින මොණරාගල දිස්ත්‍රික්කයේ අවම පහසුකම් සහිත පාසල් කේන්ද්‍රකර ගනිමින් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්විණ. ඒ අතරින් මො/ගෝනගංආර කණිෂ්ඨ විද්‍යාලයේ, මො/ජනාසංඛ ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලයේ සහ මො/නැරුල කණිෂ්ඨ විද්‍යාලයේ 1 වන ශ්‍රේණියේ සිට 10 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන දරුවන් හට රුපියල් 3500.00 ක වටිනාකමකින් යුත් පාසල් උපකරණද බෙදාදෙනු ලැබීය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා යුද විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඑම්බී යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය.

# අභිමානවත් 15 වන සංවත්සරය සමරමින්

2 වන ශ්‍රී ලංකා රයිෆල් බලකායේ 15 වන සංවත්සරය පසුගිය පෙබරවාරි 15 වන දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් එම බලකා මූලස්ථානය පිහිටි බුද්ධංකෝට්ටේ කඳවුරු පරිශ්‍රයේදී අභිමානවත් සැමරුම් උත්සවයක් පවත්වන ලද්දේ ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ඒඑම්එච්එම්කේ වැලිගේපොල පීඑස්සී ශ්‍රීලසසබ ගේ ප්‍රධානත්වයෙනි.



## "ඉන්ද්‍රසර" ළමා නිවාසයට යුද්ධ හමුදාවෙන් පරිත්‍යාග



දෙහිඅත්තකණ්ඩිය "ඉන්ද්‍රසර" නිවාස ළමා සංවර්ධන මධ්‍යස්ථානය වෙත අත්‍යාවශ්‍ය උපාංග ලබාදීම හා ප්‍රදේශයේ ආබාධිත සිසුවකු හට රෝද පුටුවක් පරිත්‍යාග කිරීම ඉකුත් මාර්තු 08 වන දින සිදුකෙරිණ. 532 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්‍ෂණය යටතේ සංවිධානය වූ මෙම ප්‍රජා වැඩසටහන අවසානයේ සියලුම දරුවන් වෙත දිවා ආහාර වේලක්ද ලබාදෙන ලදී. මෙම වැඩසටහන සඳහා "යුතුකම පුණ්‍යායතනය" විසින් අනුග්‍රහය දැක්වූ අතර, ගයාමිවැල්ල යන මහත්මිය විසින් රෝදපුටුව සඳහා දායකත්වය ලබාදී තිබිණ. බ්‍රිගේඩියර් ජීඩීඑස්එම් අල්විස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් රැසක් මෙම අවස්ථාවට සහභාගී වූහ.

## මී මැසි පාලනය පිළිබඳ වැඩමුළුවක්





23 වන පාබල සේනාංකයේ මාණ්ඩලික නිලධාරීන් විසින් සංවිධානය කළ මී මැසි පාලනය පිළිබඳ වැඩමුළුවක් පූනානි බළඇණි පුහුණු පාසලේ එළිමහන් දේශන පරිශ්‍රයේදී ඉකුත් පෙබරවාරි 21 සහ 22 යන දිනවල පැවැත්විණ. මෙම වැඩමුළුව සඳහා ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර), 23 වන පාබල සේනාංකය, 3 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව, 1 වන කමාන්ඩෝ රෙජිමේන්තුව සහ 2 වන ශ්‍රී ලංකා සේවා බලකායට අයත් භටපිරිස් සහභාගී වූහ. මෙම වැඩමුළුව සඳහා "බිඟු සම්පත් සුරැකීමේ සංවිධානයේ" ලේකම් තිස්ස බණ්ඩාර තඹවිට මහතා සහ එම සංවිධානයේ කාර්මික ශිල්පී නුවන් කීර්ති යන මහත්වරු සම්පත් දායකයින් ලෙස සහභාගී වී සිය විශේෂඥ දැනුම ලබාදුන්හ.

## ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලා අංක 63 සාර්ථකව අවසන්






යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් මත යුද්ධ හමුදාවෙහි සාමාන්‍ය සෙබළ, ලාන්ස් කෝප්‍රල් සහ කෝප්‍රල් නිලයේ අයවලුන්ගේ උපදේශන හැකියාව වර්ධනය කිරීම සඳහා පසමුඅම සහ පුහුණුඅම අධීක්‍ෂණය යටතේ සටන් පුහුණු පාසල - අම්පාර වෙතින් සංවිධානය කරන ලද ඉගැන්වීමේ ක්‍රමවේදය පාඨමාලාව අංක 63 ඉකුත් පෙබරවාරි 08 වන දින සිට මාර්තු 04 වන දින දක්වා පැවැත්විණ. මේ සඳහා යුද්ධ හමුදාවේ නිත්‍ය සහ ස්වේච්ඡා ඒකක වෙතින් සිසු සිසුවියන් 197 දෙනකු සහභාගී වූ අතර, එහි සමාප්ති දේශනය එම පුහුණු පාසලෙහි සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්පී මුණිපුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සිදුකරන ලදී. එහිදී, එම පාඨමාලාවේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට 7 වන පොලිස් සේවා බලකායට අයත් සෙ/681817 ලා/කෝ බංඩාර ඩබ්ලිව්එම්කේඩී යන කොනොනි සමත්විය.

# "ඇය දැයේ අභිමානයයි" සේවා වනිතා ජාත්‍යන්තර කාන්තා දින සැමරුම



ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් "ඇය දැයේ අභිමානයයි" යන තේමාව පෙරදැරි කරගත් විශේෂ වැඩසටහනක් ඉකුත් මාර්තු 08 වන දින සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබීය.

යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ පූර්ණ අධීක්ෂණයෙන් සංවිධානය වූ මෙම වැඩසටහන සඳහා *MR Media Solution* ආයතනය වෙතින් සිය අනුග්‍රහක දායකත්වය හිමිවිය. මෙම අනගි අවස්ථාව සඳහා යුද්ධ හමුදාවේ සක්‍රිය සේවයේ නියුතු කාන්තා නිලධාරිනියන්, සෙබලියන් හා රණවිරු බිරින්දෑවරුන් 300 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගී වූහ.



මෙම වැඩසටහන් කාලසීමාවේදී ඉතා හරවත් දේශන හා වැඩමුළු රාශියක් සංවිධානය කර තිබූ අතර, ප්‍රවීණ රූපලාවණ්‍ය ශිල්පිනී චාන්දනී බණ්ඩාර මහත්මිය විසින් රූපලාවණ්‍ය වැඩමුළුවක් හා සිංගර් ශ්‍රී ලංකා ආයතනය විසින් ගෘහ විදුලි උපකරණ භාවිතය පිළිබඳ හරවත් වැඩමුළු පවත්වන ලදී. එහිදී කූසපත් ඇදීමෙන් තෝරාගත් ජයග්‍රාහිකාව වෙත මැහුම් පාඨමාලාවක් සඳහා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කිරීම සුවිශේෂී අවස්ථාවක් විය. තවද සෞඛ්‍ය, මුදල් කළමනාකරණය සහ කාන්තා සවිබල ගැන්වීම යන තේමා යටතේ ආරාධිත දේශකයින් විසින් දේශන පැවැත්වූ අතර, කාර්යක්ෂමතාව, ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා පුද්ගලික ගති ලක්ෂණ වර්ධනය කිරීම, ජීවිතයේ සාර්ථකත්වය හා වැඩිදියුණු කිරීම සඳහා ධනාත්මක ආකල්ප ශක්තිමත් කිරීම අරමුණු කරගෙන "ජීවිතය අරන්" කණ්ඩායම විසින් අර්ථවත් සංගීතමය වැඩසටහනක්ද සිදුකරන ලදී.



එසේම, ජාත්‍යන්තර සිංහ සාමාජයේ දිස්ත්‍රික්ක 306 සී 1 සිංහ කාන්තා සංසදය විසින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය වෙත ජූකී මැෂින් 05 ක්ද පරිත්‍යාග කරන ලදී.

තවද ලෝක කාන්තා දින සැමරුම් වැඩසටහනට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් පාලනය වන පනාගොඩ රූපලාවන්‍යාගාරයේ කාන්තා සෙබලියන්ගේ නේවාසික පහසුකම් සඳහා නවතමයෙන් ප්‍රතිසංස්කරණය කර ඉදිකරන ලද හටනිවාසය විවෘත කිරීමද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සුරතින් සිදුකළාය.



මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන්, *MR Media Solution* ආයතනයේ සභාපති රෝහිත ජයසිංහ, ජාත්‍යන්තර සිංහ සමාජයේ දිස්ත්‍රික්ක 306 සී 1 සිංහ කාන්තා සංසදයේ සභාපතිනි නිල්මිණී කුමාරසිංහ, ජනනම් අයාතනයේ මහාචාර්ය එම් සදානන්දන් යන මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක්ද සහභාගී වූහ.

# සංඥා බලකා සේවා වනිතා ශාඛාවෙන් හිසට සෙවණක්

2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සංඥා බලකායට අයත්, ස්නායු ආබාධයකට ලක්ව මේ වනවිට සක්‍රිය සේවයේ යෙදී සිටින සෙ/2සි00761 ලා/කෝ මොහොට්ටි එම්එම්ආර්එම්කේ ආර්එස්පී යන කොනොනිහට නිවසක් ඉදිකර භාරදීම ඉකුත් පෙබරවාරි 27 වන දින එම බලකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ශෂිකා හේරත් මහත්මියගේ සුරතින් සිදුවූවාය. මෙම කොනොනිවරයා විසින් සංඥා සේවා වනිතා ශාඛාව වෙතින් කරන ලද ඉල්ලීමකට අනුව එහි සභාපතිනියගේ අධීක්ෂණය යටතේ මෙම නිවස සාදා නිමකළ අතර, ඒ සඳහා ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය, සංඥා බලකා සේවා වනිතා ශාඛාව සහ 2 වන (ස්වේච්ඡා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාදී තිබිණ.



# පාබල හමුදා සේවා වනිතා ශාඛාවෙන් ඉගෙනුමට අත්වැලක්





පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනුෂා වීරසූරිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තුවේ සෙසුනිලයින්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ දූවා දරුවන් වෙත පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 25 වන දින පාබල හමුදා රෙජිමේන්තු දේශන ශාලාවේදී පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව කාන්තා දිනය සමරමින්





යුද්ධ හමුදා උපකරණ මාස්ටර් ජෙනරාල් මෙන්ම සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සහ එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් කාන්තා දිනයට සමගාමීව අර්ථවත් වැඩසටහන් මාලාවක් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. එහිදී, මියගිය රණවිරුවන්ගේ බිරින්දෑවරුන්ගේ ජීවිතය නගාසිටුවීම සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම අරමුණු කරගෙන පවත්වන ලද මෙම වැඩසටහන අවසානයේ ත්‍යාග පිරිනැමීමක්ද සිදුකෙරිණ. මෙම අවස්ථාවට සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වැඩ භාරගනිමින්



ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවේ නව සභාපතිනිය ලෙස ශාලිකා එදිරිසිංහ මහත්මිය ඉකුත් මාර්තු 04 වන දින සුබ මොහොතින් රාජකාරි ඇරඹුවාය.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව කාන්තා දිනය සමරයි





ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ඉකුත් මාර්තු 11 වන දින සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සලේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් කළුඅග්ගල පිහිටි අම්බලම උත්සව ශාලාවේදී වැඩසටහනක් පැවැත්විණ. එහිදී සහකාර පොලිස් අධිකාරි නීතිඥ චන්දිමා අරුප්පෙරුම මහත්මිය විසින් අන්තර්ජාලය හරහා කාන්තාවන්ට හා ළමුන්ට සිදුවන සයිබර් අපරාධ පිළිබඳ හරවත් දේශනයක් සිදුකරන ලදී. මෙම අවස්ථාවට එම බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් සහ කාන්තා නිලධාරිනියන් රැසක් සහභාගී වූහ.

# අභිමංසල 3 සුවසහන නිකේතනයේ නිරීක්ෂණ චාරිකාවක්





ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය සහ එහි සාමාජිකාවෝ ඉකුත් පෙබරවාරි 20 වන දින පාන්ගොල්ල පිහිටි අභිමංසල 3 සුවසහන නිකේතනයේ නිරීක්ෂණ චාරිකාවක නිරතවූහ. එහිදී රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් තේපැන් සංග්‍රහයක් පවත්වා ඔවුන් වෙත ත්‍යාග පාර්සල් ද පිරිනැමුණු අතර, එම ආයතනයේ ප්‍රයෝජනය සඳහා තණකොළ කපන මැෂින් 02 ක් පරිත්‍යාග කිරීමද එම සේවා වනිතා සභාපතිනියගේ සුරතින් සිදුවිය.

# සේවා බලකා සේවා වනිතා ශාඛාව කාන්තා දිනය සමරමින්





ලෝක කාන්තා දින සැමරුම පාදක කරගනිමින් සේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ වැඩසටහනක් ඉකුත් මාර්තු 11 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේදී පැවැත්විණ. ඒ සඳහා එම රෙජිමේන්තුවට අයත් නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ බිරින්දෑවරු රැසක් සහභාගී වූහ. එහිදී, රණවිරු බිරිඳක, මවක ලෙස ආත්මාභිමානයෙන් යුතුව ජීවත්වීම උදෙසා ඔවුන් තුළ අභිප්‍රේරණයක් ඇතිකිරීමේ අරමුණින් යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවයේ නියුතු ලුතිනන් කර්නල් සුජිත් චමින්ද විසින් සිදුකළ හරවත් දේශනයක්ද, රූපලාවණ්‍ය වැඩසටහනක් සහ සූපවේදී වැඩසටහනක්ද ඊට ඇතුළත් විය. එම උත්සවය අවසානයේ සහභාගී වූ අයවලුන් හට ත්‍යාග පාර්සල් බෙදාදීමක් සහ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්විණ. මෙම අවස්ථාවට සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මිය ප්‍රධානත්වය දැරුවාය.

# යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛාව වෙතින් පරිත්‍යාගයක්







යුද්ධ හමුදා රෙදිපිලි ගබඩාව වෙතින් 2023 වර්ෂයට අදාලව එහි රාජකාරී කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින් සහ සිවිල් සේවක මහතුන් අතරින් විශේෂ අවශ්‍යතා පවතින පවුල්වල දූ දරුවන් 54 දෙනකු සඳහා පාසල් උපකරණ සහ නිලඇඳුම් රෙදිපිලි බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් පෙබරවාරි 08 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදා රෙදිපිළි ගබඩාවේ සේනාවිධායක ලුතිනන් කර්නල් ආර්ජීසී රූපසිංහ ඒටීඕ සහ එම මහත්මිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවෙන් පුණ්‍ය කටයුත්තක්





විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා රෙජිමේන්තුව යටතේ රාජකාරී නියුතුව සිට විවිධ හේතූන් මත මියගිය රණවිරුවන් සිහිකිරීමක්, රණක්ෂිතයට පත් රාජකාරී නියුතු රණවිරුවන් ඇතුළු ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ට සෙත්පතා බෝධිපූජාමය පිංකමක් හා කාලීන ධර්ම දේශනාවක් ඉකුත් පෙබරවාරි 24 වන දින එම රෙජිමේන්තු මූලික වැඩපළ කටුබැද්ද හිදී පැවැත්විණ. එම රෙජිමේන්තු සේවාවනිතා සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම කටයුත්තට සේවා වනිතා සාමාජිකාවෝ රැසක්ද සහභාගී වූහ.

# පොලිස් හේවා බලකා සේවා වනිතා කාන්තා දින සැමරුම





යුද්ධ හමුදා පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉනෝකා ඉලංගකෝන් මහත්මියගේ මඟපෙන්වීම යටතේ ලෝක කාන්තා දිනයට සමගාමීව සංවිධානය කළ වැඩසටහනක් ඉකුත් මාර්තු 10 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. මෙහිදී, ආචාර්ය කල්පනා අඹේපිටිය මහත්මිය විසින් කාන්තා සවිබල ගැන්වීම සබැඳි දේශනයක් සිදුකළ අතර, අනතුරුව මාදිවෙල සංඝමිත්තා ආරාමවාසී මෙහෙණින් වහන්සේලා දස නමක් උදෙසා දානමය පිංකමක් ද පැවැත්විණ. පොලිස් හේවා බලකා සේවා වනිතා ශාඛාවේ සහ 5 වන පොලිස් හේවා බලකායේ අනුග්‍රාහකත්වය මත පැවති මෙම වැඩසටහන සඳහා කාන්තා නිලධාරිනියන් සහ සෙබළියන් පිරිසක් සහභාගී වූහ.

---

# පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් යෝගා වැඩසටහනක්





ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පොදුසේවා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කළ යෝගා වැඩසටහනක් ඉකුත් මාර්තු 06 වන දින පනාගොඩ පිහිටි යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවැත්විණ. එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය රුචිනා මෙත්තානන්ද මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ මෙම වැඩසටහන ඉන්දියානු යෝගා ආචාර්ය මනෝහරන් ගීතාකුමාරි මිගිලෙප් විසින් පවත්වනු ලැබීය. මේ සඳහා එම සේවා වනිතා ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් ඇතුළු නිලධාරිනියන් සහ සෙබළියන් රැසක් සහභාගී වූහ.

---

# කෘෂි හා පශු සම්පත් බලකා සේවා වනිතා සභාපතිනිය ඒකක සංචාරයක

අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ කෘෂි හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මිය ඉකුත් මාර්තු 05 වන දින 5 (සේව) කෘෂි හා පශු සම්පත් බලකායේ කඳවුරු සංචාරයක නිරත වූහ. එහිදී, එම ඒකකයේ අත්කම් නිර්මාණ ව්‍යාපෘතිය සිදුකරන සෙසුනිලයින්ගේ දක්ෂතා අගයමින් සහතිකපත් ප්‍රදානයක්ද සිදුකළේය. තවද සේවා වනිතාවන් හට ත්‍යාග පිරිනැමීමද, රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව මගින් සිදුකරනු ලබන කාර්යභාරය සබැඳිව පැමිණ සිටි සියලු සාමාජිකාවන් දැනුවත් කිරීමට හා රණවිරු බිරින්දෑවරුන් සමග සුහද පිලිසඳරක යෙදෙන්නටද සභාපතිනිය අමතක නොකළාය.



# බොරුවෙන් තොර ලොවක්



කාර්යාලයක ප්‍රධානියෙක් එක්තරා සේවකයකු අතින් සිදුවූ වරදකට ඔහු ඉදිරියේදීම වෙනත් අයකුට බැන වැදුණේය. වරද කළ සේවකයා නිහඬව සිටියේය.

මෙය හිතාමතා බොරුවක් කීමක් නොවේ. එහෙත් එයද සැබැවින්ම තමා වෙනුවෙන් බොරුවක් කීමට සැලැස්වීමකි. විවිධත්වයෙන් පිරි සංකීර්ණ සමාජයක බොරු කීමෙන් තොරව ජීවත්විය නොහැකිය යන මතයක් තිබේ. ඒ මතයෙහිද කිසියම් සාධාරණත්වයක් තිබේ.

තත්ත්වය එසේ වුවද සමස්තයක් වශයෙන් සලකා බලන විට බොරුවක් කීමෙන් අවස්ථානුකූලව ලබන තාවකාලික ලාභය හෝ වාසියට වඩා ඉන් අත්වන පාඩුව හා අපකීර්තිය ජීවිතයක් කෙරෙහි තදින්ම අහිතකර බලපෑමක් හට ගන්වන බව මනෝවිද්‍යාඥයෝ කියති.

ජූඩිත් මාර්ටින් නමැති ස්විස් ජාතික ලේඛිකාවක විසින් එළිදක්වන ලද "බොරු නොකියා බැරිද?" නම් ග්‍රන්ථයෙන් මේ පිළිබඳව දක්වා ඇති කරුණු අපේ එදිනෙදා ජීවිතයේ ගතිපැවතුම් වඩාත් සමාජශීලී හිතකර මට්ටමකට ගෙනඒමට හොඳම අත්වැලකි.

එක්තරා තරුණියක් තමා හා විවාහ ගිවිස ගෙන සිටි පෙම්වතාට තම වයස පිළිබඳව බොරුවක් කීවාය. වැඩි කරදරයක් නැතිව විවාහය සිදුවුවත් ඇයට තම ප්‍රථම දරු ප්‍රසූතියේදී වෛද්‍යවරුන්ට ඇත්ත කියන්නට සිදුවිය. අනාවරණය වූ අන්දමට ඒ තැනැත්තිය තම සහකාරයාට වඩා අවුරුදු 6 කින් වැඩිමහල් තැනැත්තියකි.

ජීවිතය බෙදාහදා ගන්නට එක්වුණු තමාට ඇය කියූ මේ බොරුව ඉදිරියේදී කියැවීමට ඉඩ ඇති තවත් බොරු රාශියක ආරම්භයක් වන්නට බැරිදැයි කල්පනා කළ සැමියා මඳ කලෙකින්ම ඇයගෙන් දික්කසාද වුණේය.

තමාට කිසිත් ලාභයක් වාසියක් අත් නොවන අන්දමේ කරුණු වලදීද ඇතැම්හු තේරුමක් නැති බොරු කියති. මෙය එක්තරා අන්දමක මනෝ ස්වභාවයකැයි කියනු ලැබේ. අවස්ථාවේ හැටියට අසා සිටින්නන්ගේ කුතුහලය හා අවධානය ඇදගැනීමට මෙවන් බොරු කියන අය නොදැනුවත්වම මානසික බෙලහීනතාවයට පත්වන බව පරීක්ෂණවලදී ඔප්පු වී තිබේ.

බොරුවෙන් අන්‍යයන් මුලා කරන්නට පෙළැඹෙන්නේ අන්‍යයන්ගේ බොරුවලින් බැටකා කරදරයට පත්වන වැඩිදෙනා යයි ද කියනු ලැබේ. මෙහි දී ඇත්තක් තිබෙන්නට බැරි නැත. ඒ කෙසේ වුවද වැඩි වශයෙන් කියැවෙන බොරු එකින් එක හෙළිවන අවස්ථාවද එළැඹෙන බව මෙසේ බොරුවෙන්ම ජීවත්වන අය තේරුම් නොගනිති.

බොරු කීමේ ඇබ්බැහිකම සමස්ත සමාජයක් පුරා පැතිර ගියවිට එය බරපතල ප්‍රශ්නයක් සමාජ උවදුරක් බවට පත්වේ. ව්‍යාපාරික හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පැවැත්මට අතිශයින්ම අවශ්‍ය විශ්වාස දායකත්වය එහි සේවකයන් තුළින් ගිලිහී ගියවිට ආයතනයේ පැවැත්ම අවිනිශ්චිත තත්වයට ඇද වැටෙයි.

ලොව පුරා නගරවල පිහිටුවා ඇති දැවැන්ත වෙළඳායතනවල දහස් ගණන් සේවකයන්ගේ හොර බොරු අල්ලා ගැනීමට ආරක්ෂක සේවා සඳහා කෝටි ගණනින් මුදල් වැය කරන්නට සිදුවන්නේ සේවකයින්ගේ විශ්වාසනීයත්වය පිරිහී ගොස් ඇති නිසාය.

සමාජ ජීවිතයේ ලැබෙන සුව පහසුකම් හා ආදායම් තත්ත්වයන්හි පරතරය පුළුල් වූ විට එය හැකිතාක් දුරට පටුකර ගැනීමට වැඩි දෙනා බොරුව, හොරකම පිටුවහල්කර ගනිති. එහෙත් මෙය තාවකාලික සහනයක් පමණි.

එක බොරුවක් වැරදී ගියතැන බොරු නොකියා ගතකළ අතීතයද එකම බොරුවක් බවට පත්වෙයි.

**බොරුවෙන් අන්‍යයන් මුලා කරන්නට පෙළැඹෙන්නේ අන්‍යයන්ගේ බොරුවලින් බැටකා කරදරයට පත්වන වැඩිදෙනා යයි ද කියනු ලැබේ. මෙහි දී ඇත්තක් තිබෙන්නට බැරි නැත. ඒ කෙසේ වුවද වැඩි වශයෙන් කියැවෙන බොරු එකින් එක හෙළිවන අවස්ථාවද එළැඹෙන බව මෙසේ බොරුවෙන්ම ජීවත් වන අය තේරුම් නොගනිති.**

බොරුවෙන් තොර ලෝකයක් බිහිකර ගැනීමට ඇතැමුන් දකිනා සිහින සැබෑවන්නටනම් දේශපාලන - පාලක ක්ෂේත්‍රයේ ඉහළම තැන්වල සිට පහළම තැන දක්වා උඩු යටිකුරු කරවන තරමේ සමාජ පෙරළියක් සිදු කළ යුතුව ඇතැයි " බොරු නොකියා බැරිද" යන ජූඩිත්ගේ ග්‍රන්ථයේ ඉදිරිපත් කර ඇති අදහස බොරුවක් නොව ඇත්තකි.

- "මනහර" සඟරාව ඇසුරිනි..



## පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ විරුවෝ

### පුදුකුඩිඉරිප්පු හිදී සිදුකරනු ලැබූ

# වීර ක්‍රියාව



**නි/67764 ලුතිනන් ඩබ්ලිව්ඩබ් ජයතිලක පීඩබ්ලිව්වී**

ගැමුණු හේවා බලකාය

සටහන -:
"උත්තමාචාර්ය" ග්‍රන්ථය ඇසුරිනි..

ඓතිහාසික ඌව වෙල්ලස්ස ප්‍රදේශය අතීතයේ පටන් ශ්‍රී ලංකා ද්වීපයට ජාතිමාමක හෙළ පුත්‍රයන් ජනිත කළ වීරයන්ගෙන් පෝෂණය වූ පින් කෙතකි. පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලකයන් විසින් ගෙනගිය කෲරතර පාලනයට එරෙහිව සටන් කරමින් දිවිදුන් විරු පරම්පරාවකින් ඌව වෙල්ලස්ස ඉතිහාසය වර්ණවත්ව ඇත. එම වීර පරපුර අනුව යමින් උපන්බිමේ නිදහස උදෙසා තම දිවි පූජාකළ උත්තම විරුවකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 9 වන ගැමුණු හේවා බළඇණියේ ලුතිනන් ජයතිලක විරුවාණන් හඳුන්වාදිය හැකිය.

බදුලු පුරවරයේ ඌවපරණගම පොලිස් බලප්‍රදේශයේ සුන්දර කඳු වළල්ලක් පාමුල පිහිටා ඇති සුන්දර ගම් පියසකි, රැහින්න. එම ගමේ ගොවිතැන සිය ජීවන උපාය කරගත් වාරන්න දූරයලාගේ නන්දසේන සහ ඔහුගේ ප්‍රිය භාර්යාව වන කොටුවේ ගෙදර ගන්ඇතිලාගේ කරුණාවතී යන දෙපලට දාව වර්ෂ 1985 ක් වූ ඉල් මස 04 වන දින අඹගස්දෝව රජයේ රෝහලේදී වාරන්න දූරයලාගේ ජයතිලක දරුවා මෙලොව එළිය දකී.

එම දෙපළගේ පළමු දරුවා ලෙස මෙලොව එළිය දුටු ජයතිලක දරුවා, කාලයාගේ ඇවෑමෙන් බාල සහෝදර සහෝදරියන් පස් දෙනකුගෙන් සමන්විත පවුලේ වැඩිමල් දරුවා බවට පත්විය.

විහාරස්ථානයේ බෝ සමිඳු වෙතින් නික්මෙන දහම් සුවඳින් ජයතිලක දරුවාගේ සිත පිරීගියේ, ඔහු තුළ ශික්ෂණයද ගොඩනංවමිනි. ගම් පියසේ විහාරස්ථානයේ දහම් පාසල් අධ්‍යාපනය ලත් ජයතිලක දරුවා තම පවුලේ බාල සහෝදර සහෝදරියන්ගේ දහම් පාසල් ගුරුවරයාද විය.

1992 දුරුතු මස ගලහගම ධර්මරාජ මහා විද්‍යාලයට සිප්සතර හැදෑරීම සඳහා ඔහු ඇතුළත් විය. ජයතිලක දරුවා පිළිබඳ මතකයන් අවදි කරමින් එවකට විදුහල්පතිවරයකු වූ ජයසිංහ මහතා ජයතිලක දරුවා පිළිබඳව අදටත් අපේ සිත්තුළ ඉතිරිකර ඇත්තේ විනයගරුක කීකරු පුතකු පිළිබඳ සෙනෙහෙබර මතකයක් බව පැවසුවේ ආඩම්බරයෙනි. පන්ති නායක, ශිෂ්‍ය නායක ආදී පදවි ලබමින් ගුරු සිසුන්ගේ ද ආශිර්වාදය ඇතිව ජයතිලක සිසුවා 2002 වසරේදී පාසල් දිවියට සමුදුන්නේය.

වර්ෂ 2004 වෙසක් මස 11 වන දින ජයතිලක නම් වූ ජාතිමාමක යෞවනයා යුද්ධ හමුදාවට බැඳෙන්නේ, රුදුරු ත්‍රස්තවාදයෙන් පීඩා විඳින ලක්මවගේ දෙනෙතට සතුටු කඳුළක පහස ලබාදීමේ අරමුණෙනි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්වූ පසු, දියතලාව ගැමුණු හේවා බලකා රෙජිමේන්තු පුහුණු පාසලේ ආධුනික පුහුණු පාඨමාලා අංක 40 වෙත ඇතුළත් වී යුද ශිල්පක්‍රම පිළිබඳ හේ දැනුම ලබාගත්තේය. උපදේශකයන්ගේ අණ හා උපදෙස් අකුරටම පිළිගත් ජයතිලකගේ නිහඬ ආධ්‍යාත්මයේ ගැඹුරෙහිම තැන්පත්ව තිබූ දේශවාත්සල්‍යයන් මව්බිම

උදෙසා කැපවෙන එඩිතර බවත් මැනවින් පිළිබිඹු විය. යුද පෙරමුණක දී අවැසි වන ඉලක්කයට වෙඩි තැබීම හා අවස්ථානෝචිත උපක්‍රමශීලී බවද මනාව වර්ධනය කරගත් ජයතිලක, ජයග්‍රාහී අභිමානයත් සමඟ මූලික පුහුණු පාඨමාලාව අවසන්කර 2004 ඉල් මස 02 වන දින විසිරගොස් හෙළ බළමුළු අතරට එක්වන්නේ තම දේශය පිළිබඳ ඉපිලීගිය වීර සිතුවිලි සමුදායක් සිතෙහි රඳවාගෙන, හෙට දවසේ ලක්මෑණියන් හට තමාගෙන් විය යුතු සේවය මෙනෙහි කරමිනි. සිය පාඨමාලාව සාර්ථකව හදාල සෙබළ ජයතිලක ඇතුළත් වනුයේ දෙදහස් පන්සිය වසරක හෙළ විරුවන් ගිය මගෙහි ඉදිරියටම පියමන් තැබීමට "මා නිවත්ත අභික්කම" හෙවත් " නොනැවතී ඉදිරියට" යන උදාන පාඨය අනුව යමින් තුන් සිංහලයම එක්සේසත් කළ වීර දුටුගැමුණු නරපතියාගේ නමට ජීවය ලබාදීම සඳහා ආරම්භ කළ ගැමුණු හේවා බලකායේ ඒකකයක් වන 5 වන ගැමුණු හේවා බළඇණිය වෙතය.

මෙම බළඇණියට ඇතුළත්ව ක්‍රියාන්විත රාජකාරි කරමින් සිටියදී සිය හැකියාවන් සහ කුසලතාවන් විදහාපාමින් එඩිතර මෙන්ම කාර්යශූර රණ සෙබළකු වශයෙන් සිය රාජකාරි කැපවීමෙන් හා ඉතා විශිෂ්ට ලෙස ඉටුකිරීම පිළිබඳ තොරතුරු දැනගන්නා ඉහළ නිලධාරීන්, ඔහුට සාමාන්‍ය සෙබළ තනතුරේ සිට ලාන්ස් කෝප්‍රල් නිලය දක්වා 2008 මැදින් මස 07 වන දින සිට උසස්වීම් ලබාදුන්නේය. මේ කාලය තුළදී ලාන්ස් කෝප්‍රල් ජයතිලක ගැමුණු හේවා බලකායේ දෙවන එක්සත් ජාතීන්ගේ සාමසාධක බළඇණියේ සාමාජිකයකු ලෙස හයිටි රාජ්‍යයේ අඩ වසරක පමණ කාලයක් සේවය කිරීමේ අනගි අවස්ථාව උදාකර ගත්තේ යාපනය, මන්නාරම හා වව්නියාව යන ප්‍රදේශවල රාජකාරි ඉටු කිරීමෙන් පසුවය.

ඔහුගේ සේවය තවත් ඇගයීමට ලක්කරමින් කෝප්‍රල් නිලය දක්වාද ඉන්පසු සැරයන් නිලය දක්වාද පිළිවෙලින් උසස්වීම් ලබන්නේය. මේ කාලය වනවිට පූර්ණභූමි පදක්කම, උතුරු නැගෙනහිර සංග්‍රාමික පදක්කම හා එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් පදක්කමෙන් පිදුම් ලැබීමට තරම් ජයතිලක වසනාවන්ත විය.

සැරයන් ජයතිලකගේ විශේෂ දක්‍ෂතා හා නොකැළැල් සේවය මැනවින් හඳුනාගත් අණදෙන නිලධාරී, අධිකාරීලත් නිලයක් දැරීම සඳහා නිර්දේශ කරන්නේ ඔහුගේ සේවයට කරන ඇගයීමක් වශයෙනි. වර්ෂ 2009 මැදින් මස 30 වන දින අධිකාරීලත් නිලධාරියකු ලෙස පාබල පුහුණු මධ්‍යස්ථානය, මින්නේරිය වෙතින් කෙටිකාලීන පාඨමාලා අංක 02 හදාරා විසිර යන්නේ එම කාලය උතුරේ යුදපිටිය, තරුණ ජවසම්පන්න නිලධාරීන්ගේ සේවය ලැබෙන තෙක් ඉමහත් බලාපොරොත්තුවෙන් සිටි බැවිනි.

ගැමුණු හේවා බලකායේ ප්‍රධානම ප්‍රහාරක බළඇණියක් වූ 9 වන ගැමුණු හේවා බළඇණිය මේ වනවිට අනෙකුත් ප්‍රහාරක බළඇණි සමඟ සතුරු බළමුළු වනසා සටන් බිමෙහි අභීතව ඉදිරියට ගමන් කරමින් තිබූ අවධියයි. ආධුනික තරුණ නිලධාරියකු වූ ජයතිලක රණවිරුවාගේ සේවය ලැබීමත් සමඟ නව ජීවයක් මෙම බළඇණියේ බළමුළු වෙත ගෙනදුන්නේය.

එදා 2009 බක් මස 20 වන දිනය. සුපුරුදු පරිදි ජයතිලක රණවිරුවා තම බලඇණියේ "සී" කණ්ඩායමේ භාණ්ඩහාර නිලධාරියකු වී සිටියේය. මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු ආරක්‍ෂක වළල්ල සංග්‍රාමික වශයෙන් ඉතාමත් වැදගත් මර්මස්ථානයක් විය. ජයතිලක ඇතුළු රණවිරුවන්ගේ සුවහසක් බලාපොරොත්තුව වූයේ බක් මසේ එළඹෙන සිංහල අලුත් අවුරුද්ද වනවිට නිදහස් ශ්‍රී ලංකාවක් ස්ථාපිත කිරීමයි. එම උදාර පැතුම මතින් ජීවය ලද ඔහුගේ අරමුණ වූයේ, පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ ඉදිරි ආරක්‍ෂක වළල්ල සතුරන්ගෙන් මුදාගැනීමය.

මව්බිමේ උදාර රණවිරුවන් උගත් ශිල්ප ඥාණය නිසි යුධෝපායන්ද මැනවින් ප්‍රයෝජනයට ගනිමින් ජලය හා කඩොලාන බහුල ප්‍රදේශයේදී භූමියේ ස්වරූපයට ඉදිරියට ඇදෙමින් ත්‍රස්තවාදී ආරක්‍ෂක වළල්ල තමන් වෙත නතුකර ගත්තේ ත්‍රස්තවාදීන් අපේක්‍ෂා නොකළ තරමේ ප්‍රහාරයක් එල්ල කරමින්ය. එහිදී, ත්‍රස්තවාදීන් ආර්පීජී, මෝටාර් ආදී බර අවි මෙන්ම සුළු අවිද භාවිතා කරමින් සටනේ වාසිය තම පාර්ශ්වයට ගැනීමට වෙහෙසවන ලකුණු මතුවිය. සතුරාගේ පරාජය දැකීමේ සිතුවිල්ලෙන් සටන් මෙහෙයවමින් සිටි ජයතිලක රණවිරුවා යුදබිමේ ඇතිවෙමින් තිබූ බිහිසුණු බව මැනවින් අවබෝධ කරගත්තේ සතුරු බලය අඩපණ කිරීමට තීරණාත්මක තීන්දුවක් ගැනීමට සැරසෙමින්ය.

ත්‍රස්තවාදීන්ගේ දරුණු ප්‍රහාර හමුවේ නායකත්වය හා සටන්කාමීත්වය මනාව සුසංයෝග කළ ජයතිලක රණවිරුවා, දිගටම ත්‍රස්තවාදී බංකර් පෙළට ප්‍රහාර එල්ල කරමින් ඉදිරියට ගියේය. ත්‍රස්තවාදී ප්‍රතිප්‍රහාර ක්‍රමක්‍රමයෙන් වැඩිවෙත්ම ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුව ක්‍රියාකරමින් ත්‍රස්තවාදීන්ගේ බංකරයක් වෙත කඩාපනිමින් තම අත රැඳි අත්බෝම්බ පුපුරවාගෙන සතුරාගේ ඉදිරි ගමන වළක්වාලමින් සටනේ වාසිය තම පාර්ශ්වයට නතුකර ගැනීමට ඔහු ක්‍රියාකළේය. තම ජීවිතය ලක්මවගේ නිදහස වෙනුවෙන් කැපකරමින් උත්තම පූජාවක් සිදුකරන ලද්දේ, විශාල සතුරන් පිරිසක් විනාශකර, ත්‍රස්තවාදී ආරක්‍ෂක වළල්ල සම්පූර්ණයෙන්ම අත්පත්කර ගැනීමට සටන්බිමේ සිය සගයන් මෙහෙයවමින්ය. එසේ සිය සිරුරේ අවසන් ලේ බිඳුව දක්වාම මව්බිමට කැපකළ තවත් විරුවෙක් මව්බිමේ නිදහස උදෙසා යුදබිම තුළ දෙනෙත් පියාගත්තේය. මෙම රණවිරුවාගේ සේවය ඇගයීමවස් ඔහු මියගිය පසු ලුතිනන් නිලය දක්වා උසස් කරන ලද්දේ ඔහුට කරනු ලබන ගෞරවයක් වශයෙනි.

ඒ කළාවූ අමිල සේවය හා ජීවිත පරිත්‍යාගයෙන් මාතෘභූමිය නිදහස් කරගැනීමට උරදීම වෙනුවෙන් නි/67764 ලුතිනන් ඩබ්ලිව්ඩී ජයතිලක නම් රණවිරුවා වර්ෂ 2012 ක්වූ පෙබරවාරි මස 04 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති හා සන්නද්ධ සේවා සේනාධිනායක ගරු මහින්ද රාජපක්‍ෂ මැතිතුමා විසින් යුධ සෙබළකු වෙත ජාතියෙන් පිදිය හැකි වටිනාම, උසස්ම සම්මානය වන පරම වීර විභූෂණය පුදා උපහාර දක්වන ලදී.

එසේ ජාතියට අභීත රණවිරුවකු ලෙස තම පුත්‍රයා කැපකිරීමෙන් සිදුකළා වූ ජාතික මෙහෙවර උදෙසා දැනට ජීවතුන් අතර සිටින ලුතිනන් ඩබ්ලිව්ඩී ජයතිලකගේ ආදරණීය දෙමාපියන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් උත්තම පූජා උපහාරයෙන් පුදනු ලැබිය. ලුතිනන් ඩබ්ලිව්ඩී ජයතිලක රණවිරුවා සිහිවීම පිණිස ඔහු මිහිදන් කළ ස්ථානයේ සොහොන්කොතක් සාදා පවුලේ ඥාතීන් සහ ගම්වාසීන් ගරු බුහුමන් දක්වති.



# ජයසිකුරු මෙහෙයුමේදී ත්‍රස්තවාදීන්ගේ "නොනවතින රැල්ලට" මුහුණදුන් මතක සටහනක්

ජයසිකුරු මෙහෙයුමේ ආරම්භයේ සිට ත්‍රස්තවාදීන් විසින් "ඒ 9" මාර්ගය ඔස්සේ ගමන්ගත් හටපිරිස් සහ ජනකපුර ප්‍රදේශයෙන් නැදුන්කර්නි හරහා පුලියන්කුලම ප්‍රදේශයට ගමන් ගන්නා හටපිරිස්වල ගමන් අඩපණ කිරීමට නොයෙකුත් අවස්ථාවන්හිදී ඔවුන්ගේ පූර්ණ බලය යොදා 55 සහ 53 වන සේනාංක වෙත ප්‍රතිප්‍රහාර එල්ල කළහ. එම ප්‍රහාර ත්‍රස්තවාදීන් විසින් ඔවුන්ගේ "නොනවතින් රැල්ල" ලෙස හඳුන්වාදෙන ලදී. මෙහි මුල්ම ප්‍රහාරය වව්නියාවේ නොච්චිමොටේ පිහිටි 55 වන සේනාංක මූලස්ථානය වෙත 1997 මැයි මස අග එල්ල වූ අතර, ඉන් අනතුරුව 552 වන ඉදිරි උපක්‍රමික මූලයේ ස්ථානගත වූ 120 සැහැල්ලු කාලතුවක්කු ඛතරොයිය වෙත ඔවුන්ගේ දෙවෙනි නොනවතින රැල්ල එල්ල විය.

55 වන සේනාංකය ඕමන්ත නගරයේ බලය තහවුරු කිරීම සඳහා මෙහෙයුම් ආරම්භ කරන අවස්ථාවේදී පුලියන්කුලම ආශ්‍රිතව ඇති වැව්බැම්ම උපයෝගී කරගනිමින් පුලියන්කුලම නගරයට ඇතුළුවීමට ඇති ප්‍රධාන ගමන් මාර්ගය වන "ඒ 9" මාර්ගය සහ පුලියන්කුලම නැදුන්කර්නි මාර්ගය ආවරණය වනසේ ඔවුන්ගේ ආරක්ෂක වළල්ල සකස්කරගෙන ඉතා දරුණු ප්‍රතිරෝධයක් 55 සහ 53 වන සේනාංක වෙත එල්ලකළේය. මේ අවස්ථාවේදී "ඒ 9" මාර්ගය ඔස්සේ ගමන්ගත් 55 වන සේනාංකය පුලියන්කුලම නගරයට තරමක් දුරින් ඔවුන්ගේ ඉදිරි ක්‍රියාන්විත තාවකාලිකව නතරකොට නව උපක්‍රමයක් වශයෙන් නගරය මඟහැර ඉදිරියට ගමන් කිරීමට තීරණය කළේය.

මෙහිදී, 552 වන බලසේනාවට අණදුන් බ්‍රිගේඩියර් සරත් ප්‍රනාන්දු සමඟ එහි බලසේනා උපක්‍රමික මූලයක් පෙරියමඩු වැව ආශ්‍රිතව ස්ථාපිත කෙරිණි. මෙම බලසේනාව ඉදිරි ක්‍රියාන්විත සිදුකිරීම සඳහා සෘජුවම ආධාරක වෙඩිබලය ලබාදීම සඳහා ස්ථාන ගතකරනු ලැබූ මිමී 120 සැහැල්ලු මෝටාර් බලසෙණයට අවශ්‍ය ආරක්ෂාව ලබාදීම සඳහා නැවත ප්‍රතිසංවිධානය වීමට 9 ගජබා රෙජිමේන්තුවේ "ඒ" කණ්ඩායම එහි ස්ථානගත කරන ලදී.

එම "ඒ" කණ්ඩායමේ අණදෙන නිලධාරී ලෙස මේජර් අතිල සිල්වා කටයුතු කළ අතර, ලුතිනන් මදුශාන් හා මා එවකට "ඒ" කණ්ඩායමේ බණ්ඩභාර නිලධාරී වශයෙන් කටයුතු කරනු ලැබූහ.

මෙහිදී, කණ්ඩායමට අණදුන් මේජර් අතිල සිල්වා මෙහි සැහැල්ලු මෝටාර් ස්ථානගත කරඇති භූමියේ උපක්‍රමික වටිනාකම අවබෝධ කරගැනීමෙන් පසු මෙම භූමියේ ආරක්ෂක බංකර නිවැරදිව ඉදිකිරීමටත් නිවැරදි වෙඩි කෝණයන් ලබාදීමත් සිදුකරන ලදී. ජයසිකුරු මෙහෙයුම "ඒ 9" මාර්ගයට සමාන්තරව ගමන්කළ බැවින් ප්‍රධාන ආරක්ෂක වළල්ල ඉතා අඩු ගැඹුරකින් යුතු නිසා ඕනෑම අවස්ථාවක සතුරු ප්‍රහාරයකට ලක්වීමේ අවදානමකට ලක්ව තිබුණි. මෙහිදී, 10 විජයබා රෙජිමේන්තුව නැගෙනහිර දෙසින්ද 6 ගැමුණු රෙජිමේන්තුවේ හටපිරිස් බටහිර දෙසින්ද ස්ථානගත කර නැගෙනහිර හා බටහිර ආරක්ෂක වළල්ල ශක්තිමත් කරන ලදී.

1997 ජූනි මස 10 වන දින "ඒ" කණ්ඩායමේ බණ්ඩභාර නිලධාරී වශයෙන් කටයුතු කළ ලුතිනන් රයිගම නිවාඩුගැනීම නිසා කණ්ඩායමේ අණදෙන නිලධාරී සහ මාත් ආරක්ෂක වළල්ලේ රැඳීසිටියහ. එදින 55 වන සේනාංකයට අයත් හටපිරිස් පුලියන්කුලම් නගරය දෙසට ගමන්කිරීමට උත්සහ කළත් ත්‍රස්තවාදීන්ගේ එම ප්‍රතිරෝදය හමුවේ උපක්‍රමික වශයෙන් පසුබැසීමට අපට සිදුවිය.

එදින රාත්‍රි 2100 පැයට පමණ නැගෙනහිර දෙසින් වෙඩි හඬවල් ඇසීමත් සමඟ ත්‍රස්තවාදීන් විසින් ආරක්ෂක වළල්ල දෙසට දරුණු ට්‍රේසර් වෙඩි සහ බර අවි ප්‍රහාරයක් එල්ල කරන ලදී. එහිදී, අප සතු මිමී 60 මෝටාර් මගින් ආලෝක ධාරා නිකුත් කෙරෙන මෝටාර් බෝම්බ කිහිපයක් ඒ දෙසට යොමුකර බැලීමේදී ත්‍රස්තවාදී සෙබලියන් සහ සෙබළුන් දහසක් පමණ ආරක්ෂක වළල්ල දෙසට ප්‍රහාර එල්ලකරමින් සිටින බව සනාථ විය. ඔවුන් නැගෙනහිර දෙසින් වූ 10 විජයබා ආරක්ෂක වළල්ල අත්පත් කරගෙන ඕමන්තේ නගරයේ කාලතුවක්කු ස්ථානගත කර තිබූ ස්ථානය දෙසට පැමිණෙමින් සිටින බවද නිරීක්ෂණය විය.

මෙහිදී, දරුණු ප්‍රහාර හමුවේ අප ස්ථානගතව සිටි ආරක්ෂක වළල්ලේ කණ්ඩායම් අණදෙන නිලධාරී මේජර් අතිල සිල්වා මියගිය අතර, අප



කණ්ඩායමේ මා ඇතුළු සැරයන් සුනිල් බංඩාර සහ අනෙක් සෙබළුන් පමණක් ඉතුරුවූහ. මෙහිදී, මෙම සිදුවීම පිළිබඳ මා රාත්‍රියේ මූලස්ථානය දැනුවත් කළේය. එවකට ඔමන්තේ පිහිටි 9 ගජබා රෙජිමේන්තු ඒකකයේ 2 වන අණදෙන නිලධාරී ලෙස කටයුතු කළ මේජර් චන්දන වීරකොන් විසින් ඔබ දැනට "ඒ" කණ්ඩායමේ වැඩබලන නිලධාරී අණදෙන වශයෙන් කටයුතු කර තත්ත්වයට උචිත පරිදි ක්‍රියා කරන ලෙස මා හට උපදෙස් ලබාදෙන ලදී.

මෙහිදී, අප ස්ථානගතව සිටි ආරක්ෂක වළල්ලත් නැගෙනහිර ප්‍රදේශයේ වූ 10 විපාරෙ ආරක්ෂක වළල්ලත් අතර වූ ත්‍රස්තවාදීන් සිටි කලාපයට වව්නියාවේ ස්ථානගත කර තිබූ මිමී 130 කාලතුවක්කු ප්‍රහාර එල්ල කරන ලදී. 10 විපාරෙ විසින් සම්පූර්ණයෙන් ආරක්ෂක වළල්ල අතහැර පසුබැස තිබූ හෙයින් ත්‍රස්තවාදීන්ට එම ආරක්ෂක වළල්ලෙන් අප සිටි ආරක්ෂක වළල්ල දෙසට පැමිණීමට පහසු විය.

ත්‍රස්තවාදීහු අප සිටි ප්‍රදේශයට දකුණ පසින් පිහිටි වැව්බැම්ම ආශ්‍රිත ප්‍රදේශයට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන්නට වූහ. එහි තිබූ වැව් බැම්ම ස්වාභාවික පලිහක් ලෙස යොදාගනිමින් එහි සිට ත්‍රස්තවාදීන් 200ක් පමණ අප සිටි ආරක්ෂක වළල්ල දෙසට පැමිණෙන අයුරු අප විසින් එල්ල කරන ලද ආලෝක ධාරා මගින් නිරීක්ෂණය කළ අතර, එහිදී අප සතු එම්පීඑම්ජී මැෂින් තුවක්කු යොදාගනිමින් එල්ල කළ ප්‍රහාර හමුවේ ඔවුන්ගේ ගමන්මග අඩපණ කිරීමට හැකියාව ලැබුණි.

නමුත්, අනෙක් පසින් පැමිණි කොටි සෙබළියෝ වෙඩි තබමින් ඉදිරියට පැමිණ අපගේ නැගෙනහිර ප්‍රදේශයෙන් වූ ආරක්ෂක වළල්ලේ ඉදිරියෙන් වූ කන්සර්ටිනා වැට "බැන්ගලෝටර්පිඩෝ" ආධාරයෙන් පුපුරවා හරින්නට වූහ. ඒ සමගම ක්‍රියාත්මක වූ අප පුද්ගලික අවි, එල්එම්ජී අවි සහ අත් බෝම්බ යොදාගනිමින් ප්‍රහාර එල්ල කිරීම තුළින් සැලකිය යුතු ත්‍රස්තවාදීන් පිරිසක් අඩපණ කිරීමට හැකියාව ලැබුණි. නමුත්, එහිදී ඔවුහු උත්සාහය අත්නොහැර දිගින් දිගටම ආරක්ෂක වැව්බැම්ම දෙසට ප්‍රහාර එල්ල කරන්නට වූහ.

මේ අවස්ථාවේදී වැව්බැම්ම උපයෝගී කරගනිමින් පැමිණි කොටි ත්‍රස්තවාදීන් 552 වන බලසේනාවේ උපක්‍රමික මූලය වෙත පහරදී එම කඳවුරේ ඇති බඩුබාහිරාදිය ඔවුන්ගේ ට්‍රැක්ටර් රථවලට පැටවීමට උත්සාහ කළ අතර, එම අවස්ථාවේදී ඔවුන්ටද ආර්පීජී සහ මැෂින් තුවක්කු ප්‍රහාර එල්ල කරමින් ඔවුන්ගේ එම ක්‍රියාව අඩපණ කරන්නට අප උත්සාහ ගත්තේය. නමුත් ඔවුන්ගෙන් එල්ල වූ දැඩි ප්‍රතිරෝධය හමුවේ එහිදී අපට උපක්‍රමික වශයෙන් පසු බැසීමට සිදුවිය.

මිමී 120 කාලතුවක්කු ස්ථානගත කර තිබූ ස්ථානයටද එහිදී ත්‍රස්තවාදීන් කඩාවැදීමට උත්සාහ දැරූ අතර, එම අවස්ථාවේදී අපගේ වෙඩිබලය ඒ දෙසට යොමුකිරීම තුළින් ඔවුනගේ උත්සාහය ව්‍යාර්ථ කිරීමට මා ඇතුළු කණ්ඩායමට හැකිවූහ. එදින පාන්දර 0330 - 0400 වනවිට ගුවන් හමුදාවට අයත් එම් අයි 24 යානා පැමිණ ආරක්ෂක වළල්ලෙන් පිටතවූ ත්‍රස්තවාදීන් හට දිගින් දිගටම ප්‍රහාර එල්ල කරන ලද අතර, අප බළඇණි මූලස්ථානයේ දෙවන අණදෙන නිලධාරීගේ උපදෙස් මත බලසේනා මූලස්ථානය අවට ප්‍රදේශයට හා ආරක්ෂක වළල්ල දෙසට දිගින් දිගටම කාලතුවක්කු ප්‍රහාර වෙඩි වරුසාවක් මෙන් පතිත කිරීම තුළින් ත්‍රස්තවදීන්ගේ අභිප්‍රායන් ව්‍යාර්ථ කරන ලදී.

මෙහිදී, අප කණ්ඩායමට අයත් සෙබළුන් 08 දෙනකු මිය ගිය අතර, 14 දෙනකු තුවාල ලැබූහ. මිමී 120 කාලතුවක්කු බළගනයට අයත් අවිආයුධ පැහැරගෙන යාමට තිබූ අවස්ථාවද මෙහිදී අප විසින් ව්‍යාර්ථ කරන ලද අතර, ත්‍රස්තවාදීන්ට අයත් පුද්ගලික අවි සහ සැහැල්ලු මැෂින් තුවක්කු 80 කට අධික ප්‍රමාණයක් මෙහිදී අත්පත් කරගන්නා ලදී. වව්නියාවේ සිට එල්ලකරන ලද මිමී 130 මෝටාර් ප්‍රහාර නිසා ත්‍රස්තවාදීන්ගේ ආධාරක හටපිරිස් එම ප්‍රදේශය අතහැර උදෑසන වනවිට පලා ගොස් තිබුණි.

මෙහිදී, රණබිම තුළ දැක්වූ නිර්භීතවභාවය සහ මගපෙන්වීම හේතුකොටගෙන එවකට ඒකක අණදෙන නිලධාරී ලෙස කටයුතු කළ කර්නල් පීජේ වික්‍රමසූරිය විසින් මා හට රණවික්‍රම පදක්කමද අනෙකුත් සියලුම සාමාජිකයන්ට රණශූර පදක්කමද නිර්දේශ කරන ලදී.

සටහන -:
කර්නල් ධම්මික අධිකාරි,
කර්නල් ජනමාධ්‍ය

# රණවිරුවන්ට සෙත්පතා බෝධිපූජා පිංකමක්





2(සේවා) යුද්ධ හමුදා පොදුසේවා බලකායේ අණදෙන නිලධාරී මේජර් පීඩීඑස්එන් ගුණරත්නගේ අදහසකට අනුව ක්‍රියාන්විත/ක්‍රියාන්විත නොවන රාජකාරි ඉටුකර දැයෙන් සමුගත් වීරෝදාර රණවිරුවන් වෙත පිං අනුමෝදනා කිරීම සහ රාජකාරී නියුතු නිලධාරීන්, සෙසුනිලයින් සහ සිවිල් සේවක මහතුන් වෙත දීර්ඝායුෂ ප්‍රාර්ථනා කිරීම වස් තුලවාසී සෙසුනිලයින්ගේ මානසිකත්වය ඉහළ නංවාලීම මෙන්ම ආගමික කටයුතු සඳහා ඔවුන් නැඹුරු කිරීම වෙනුවෙන් ඉකුත් මාර්තු 06 වන දිනට යෙදුණු මැදින් පුර පසළොස්වක පොහොය නිමිත්තෙන් බෝධිපූජා පිංකමක් පවත්වන ලදී.



# Toxic Relationships

## නොගැලපෙන සම්බන්ධතාවයන්ගෙන් මිදීමට

# මනෝවිද්‍යාත්මක අත්වැලක්

පුද්ගලයන් දෙදෙනකු හා පුද්ගල සමූහයක් අතර පවතින බැඳීමක් සම්බන්ධතාවයක් (Relationships) ලෙස හැඳින්විය හැක. මෙම සම්බන්ධයන් ද්විලිංගික හෝ සමලිංගික වශයෙන් දැකිය හැක. එසේ ඇතිවන සම්බන්ධතාවල විශේෂිත වූ **නොගැලපෙන සම්බන්ධතාවයන් Toxic Relationships** ලෙස හඳුනාගත හැක.

නමුත්, මෙවැනි නොගැලපෙන සම්බන්ධතාවයන් විවාහක යුවලක් අතර වුවද ඇතිවිය හැක. තවද, මේ සඳහා ලිංගිකත්වය බලනොපායි. සමලිංගිකයන් අතර වුවද එවැනි සම්බන්ධතාවයක් පැවතිය හැක.

සාමාන්‍ය සම්බන්ධතාවයකදී ශාරීරික වදහිංසා සහ ලිංගික වදහිංසා පමුණුවන්නේනම් ඊට එරෙහිව නීති ක්‍රියාමාර්ග ගතහැකි අතර, මානසිකව වදහිංසා කරනු ලබන මෙවැනි සම්බන්ධතාවයකදී කරනු ලබන හිරිහැර (Emotional Abuse) නිවැරදිව තවත් කෙනකුට නොපෙනෙන බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පවා අපහසුය. එමනිසා මෙවැනි සම්බන්ධතාවයන් **විෂ සහිත සම්බන්ධතාවයක්** ලෙස හඳුන්වනු ලබයි. මන්දයත්, ඒ සඳහා ගොදුරු වන්නට දීර්ඝකාලීනව වදහිංසා විඳීමට සිදුවීම නිසාවෙනි.

### විෂ සහිත සම්බන්ධතාවල ලක්‍ෂණ (Toxic Relatioinships)

මෙවැනි සම්බන්ධතාවයක් ඇති පුද්ගලයින්ගේ ප්‍රධාන ලක්‍ෂණයක් වන්නේ අසාමාන්‍ය ලෙස සැක සිතීම, අධික ලෙස සහකරුවා පාලනය කිරීම. එහිදී, ඔහු අඳින පළඳින විදිහ හා ඇසුරු කරන්නන් පවා සීමා කිරීම. තවද, මෙහි තිබෙන අනු ලක්‍ෂණයක් වන්නේ තම යහළුවන් හා දෙමාපියන් නෑදෑයින්ගේ බැඳීම්වලින් ක්‍රමක්‍රමයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමයි. එහිදී, ඔහුගේ හෝ ඇයගේ අරමුණ වන්නේ "අපි දෙන්නට ඉන්නේ අපි දෙදෙනා පමණක් වන බව" ඒත්තු ගැන්වීම සහ අන්අය ඇසුරු කිරීමට අවස්ථාවක් ලබානොදීමයි.

මෙවැනි කරුණු හේතුවෙන් යම් කෙනකුගේ පුද්ගලිකත්වය නැතිවී යම් රාමුවකට කොටුවන බව ඔබට දැනෙන්නට පටන් ගන්නේනම් එය විෂ සහිත සම්බන්ධතාවයක ලක්‍ෂණයක් බව අවබෝධ කරගත යුතුයි. එහි ඇති තවත් ලක්‍ෂණයක් වන්නේ ඉක්මනින් කේන්තියාම නිසා පරුෂ වචන වුවද භාවිතාකර බැන වැදීමට පෙළඹීමයි. තවද, සමහරවිට තම සහකරු තමාට හානියක් කරයිද? යන්න පවා සිතෙන්නේනම් එය විෂ සහිත සම්බන්ධතාවයක් බව ඔබට තේරුම් ගැනීමට තවත් එක් අවස්ථාවකි. මෙවැනි සම්බන්ධතාවල ඇති තවත් ලක්‍ෂණයක් වන්නේ සහකරුට හෝ සහකාරියට නිතර නිතර පහරදෙන අතර, තවත් දිනෙක ඉතා හොඳින් සලකනු ලබයි. පෙරදින කරන ලද පහරදීම් පවා අමතකකර හොඳින් සිටීමට පටන්ගැනීමයි.

නමුත්, පෙරදින තමන්විසින් කරනලද පහරදීම ගැන නැවත නැවත කතාකිරීමට කැමැත්තක් නොදක්වන අතර, එය මතක්කළ පමණින් නැවත වරක් කෝපවීමට පටන්ගැනීමයි. මෙම තත්ත්වය නිසා ප්‍රශ්නයක් ඇතිවූවිට එය සාකච්ඡාකර විසඳා ගැනීමට කැමැත්තක් නොදැක්වීමද මෙම තත්ත්වයේ සිටින පුද්ගලයන්ගේ ප්‍රධාන ලක්‍ෂණයකි.

### Toxic පුද්ගලයින් සමඟ ජීවත්වන්නේ කෙසේද?

මෙවැනි පුද්ගලයන් සමඟ ඇසුරු කිරීමේදී, ඒ සමාන Toxic ගති ලක්‍ෂණයක් ඇති පුද්ගලයකුට ඔහු සමඟ ගනුදෙනු කිරීම ඉතා පහසු කටයුත්තකි. එසේ වීමට හේතුව ඔවුන් නිතරම හැමදේකටම අඩුපාඩු දකින ගති ලක්‍ෂණය Toxic පුද්ගලයන් අතරින් එවැනි තවත් Toxic පුද්ගලයකු හමුවූ විගස ඔහු හොඳ මිත්‍රශීලී ස්වරූපයෙන් එකිනෙකා සමඟ කතාකරන අතර, අන්අය විවේචනය දෙදෙනාම එකතු වී කිරීමට



**සාමාන්‍ය සම්බන්ධතාවයකදී ශාරීරික වදහිංසා සහ ලිංගික වදහිංසාවලදී ඒ සඳහා නීති ක්‍රියාමාර්ග ගතහැකි අතර, මානසික වදහිංසා කරනු ලබන මෙවැනි සම්බන්ධතාවයකදී කරනු ලබන හිරිහැර (Emotional Abuse) නිවැරදිව තවත් කෙනකුට නොපෙනෙන නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පවා අපහසුය. එම නිසා මෙවැනි සම්බන්ධතාවයන් විෂ සහිත සම්බන්ධතාවයක් ලෙස හඳුන්වනු ලබයි.**

පෙළඹෙයි. එමගින් Toxic ගතිලක්‍ෂණ ඇති පුද්ගලයින් දෙදෙනා හොඳින් මිතුගිලි වියහැක. එමෙන්ම හොඳ පුද්ගලයකු Toxic පුද්ගලයකු සමඟ ජීවත්වීමට සිදුවුවහොත් පළමුවෙන්ම සිදුකළ යුත්තේ ඔහු විසින් Toxic පුද්ගලයා කඩිනමින් නිවැරදිව හඳුනාගෙන ජීවත්වීමයි.

## මෙවැනි තත්ත්වයක් නිසා ඇතිවිය හැකි හානිකර බලපෑම කවරේද?

යම් හේතුවකින් මෙවැනි තත්ත්වයට මුහුනදෙන පුද්ගලයන්ට විශාදය (Depression), කාංසාව (Anxity), ආතතිය (Strees) වැනි රෝගවලට ගොදුරුවිය හැකි අතර, තවද ඔවුන්ගේ සිතුම් පැතුම්වල වෙනසක්ද දැකිය හැක. "මේක මගේ ලැබීම", "කමක් නෑ ඔහු හෝ ඇය මට ඇති දැඩි ආදරය නිසා මෙවැනි දේවල් කරනවා" යන්න සිතන අතර තමන්ට මෙම ප්‍රශ්නයේදී උදව් කිරීමට කිසිම කෙනෙක් නොමැති බවත් තමන්ගේත් වැරදි ඇති යැයි සිතීමට වුවද පෙළඹිය හැකිය. තවද, එවැනි පුද්ගලයින් මත්පැන් මත්ද්‍රව්‍යවලට පෙළඹිය හැක.

## ඉන් මිදීමට ගතයුතු ක්‍රියාමාර්ග

මෙහිදී, ඔබ ගතයුතු පළමු පියවර වන්නේ මෙම සම්බන්ධතාවයේ තවදුරටත් රැඳී සිටිනවාද? නැත්නම් එයින් මිදෙනවාද? යන්න තේරුම්ගත ගැනීමයි.

ඉන් අනතුරුව එම තීරණය කඩිනමින් සිදුකිරීමයි. එහිදී, සමහර විට ඒ සඳහා නීතිමය මැදිහත්වීමක් ලෙස පොලිසියේ උපකාරය අවශ්‍ය විය හැක. තවද, කාන්තා හා ළමා කාර්යාංශයේ උපකාරය ගැනීමට සිදුවිය හැක. නැත්නම් ඔහු හෝ ඇය විවාහකයෙක්නම් උසාවි නියෝගයක් මගින්ද මෙවැනි සම්බන්ධතාවයන්ගෙන් මිදීමට අවශ්‍යනම් නීතිමය නියෝගයක් ලබාගැනීමට සිදුවිය හැකි බව ඔබ දැනුවත් වී සිටීම ඉතා වැදගත්ය.

තවද, අදාළ සම්බන්ධතාවය නැවැත්වීමෙන් අනතුරුව අනෙක් පාර්ශ්වය විසින් නිතර නිතර තවදුරටත් කරදරකාරී ලෙස හැසිරෙනවානම් ආරක්‍ෂක නියෝගයක් වුවද ලබාගත හැක.

තවද, ආර්ථිකමය හා සමාජයීය හේතූන් මත විවාහක පුද්ගලයන් දෙදෙනකුනම් තවදුරටත් විවාහය තුළ රැඳී සිටිනවා යන්න තීරණය කරනවානම් ඔවුන්ට මනෝ වෛද්‍යවරයකුගේ ප්‍රතිකාර ලබාගන්නා අතරතුර උපදේශනය සඳහා මනා පළපුරුද්දක් සහ අත්දැකීමක් ඇති මනෝ උපදේශකවරයකුගේ සහයද ලබාගෙන නිසියාකාරව ජීවිතය කළමනාකරණය කරගත හැකිබව සඳහන්කළ යුතුය. මේ සඳහා තම සහකරු කැමතිකරවා ගැනීම ඉතා අපහසු කාර්යයක් විය හැකි අතර, ස්වකැමැත්තෙන් ප්‍රතිකාර සඳහා යොමු වන්නන් හට "සුමිත්‍රයෝ" වැනි සමාජ සේවා ආයතන මගින්ද නොමිලේ උපදේශන සේවාවද ලබාගත හැක. එසේ නොමැතිනම් දරුණු ගණයේ මානසික රෝගයකින් පෙළෙන්නේනම් ඔහුට නිවැරදි තීරණ ගැනීමට තරම් මානසික සුවතාවයක් නොමැතිනම් එවැනි අවස්ථාවලද නීති උපදෙස් ලබාගැනීමෙන් අනතුරුව ප්‍රතිකාර සඳහා එම පුද්ගලයාගේ කැමැත්තෙන් තොරව වුවද ප්‍රතිකාර සඳහා යොමුකළ හැක. මානසික ගැටලු පිළිබඳව නිතරම ඔබ දැනුවත් කිරීම තුළින් එම ගැටලු හේතුවෙන් නිවැරදි තීරණ ගැනීමට නොහැකිව ක්‍ෂණිකව හදිසි තීරණ ගැනීම වලක්වාලීම මෙම ලිපි මාලාවේ අරමුණ බව නැවත නැවතත් ඔබට සිහිපත් කළ යුතුමය. අප සමඟ ජීවත්වන පුද්ගලයන් සහ ජීවිත කළමනාකරණය කරගැනීමට අත්වැලක් සැපයීම ප්‍රධාන අරමුණ බව සිහිපත් කරන්නෙමු.




සටහන -:
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක
ගරු,
(මනෝවිද්‍යා උපදේශක)
දුරකථන - 0766280942
hemantharathnayake20gr@gmail.com




පසුගිය කලාපය හා සබැඳේ...

# ඩිජිටල් ලෝකයට සාදරයෙන් පිළිගනිමු!

## අන්තර්ජාලය (Internet)

සාමාන්‍ය පුද්ගලයෙක් සමස්ත අන්තර්ජාලයෙන් පරිශීලනය කරනු ලබන්නේ 3% - 4% ක් වැනි සුළු ප්‍රතිශතයක්ය. අන්තර්ජාලය සියයෙන් බෙදූවිට ඉතිරි 95% ක්ම පාහේ සාමාන්‍ය අන්තර්ජාල පරිශීලකයකුට භාවිතා කිරීම කිසිසේත්ම සිදුකළ නොහැක. පහත රූපසටහන මඟින් ඒ පිළිබඳව දළ අදහසක් ලබාගත හැක.




ඉහත රූප සටහන මඟින් දක්වා ඇති පරිදි ප්‍රධාන වශයෙන් අන්තර්ජාලය කොටස් තුනකට බෙදෙනවා.

1. *Surf web (WWW – World Wide Web)* සර්ෆ් වෙබ්.

2. *Deep Web.* ඩීප් වෙබ්.

3. *Dark-Web or Dark-Net* ඩාර්ක් වෙබ් නොහොත් ඩාර්ක් නෙට්.

### 1. Surf web (WWW – World Wide Web) සර්ෆ් වෙබ්

සාමාන්‍ය අන්තර්ජාල පරිශීලකයින් භාවිතා කරන්නේ සර්ෆ් වෙබ් නොහොත් ලෝක ව්‍යාප්ත ජාලයයි. (වර්ල්ඩ් වයිඩ් වෙබ් - *World Wide Web*) ඉහත රූපසටහන අනුව ඔබ අප සියලුදෙනා භාවිතා කරන්නේ අන්තර්ජාලයෙන් 4% වැනි ඉතා කුඩාම කොටසක්ය. මෙහිදී, අප දකිනා ගූගල්, යාහු බින්ග් *(Google,Yahoo, Bing)* වැනි සෙවුම් යන්ත්‍ර සහ මුහුණු පොත, ට්විටර්, යූටියුබ් *(Facebook,Twitter,Youtube)* නොයෙකුත් ආකාරයේ සමාජ මාධ්‍ය වෙබ්අඩවි සහ අප එදිනෙදා වෙළඳ කටයුතු ආදිය සිදුකරගන්නා වෙබ්අඩවි ආදිය මෙම ජාලය තුළ ඇත. ඕනෑම කෙනකුට පහසුවෙන් ඕනෑම වෙබ් බ්‍රව්සර් එකක් හරහා (*Google Chrome,Mozilla Firefox*) මෙම සර්ෆ් වෙබ් වෙත පිවිසිය හැකිය.

## 2. *Deep Web* (ඩීප් වෙබ්)

බැංකු දත්ත මූලාශයන්, හමුදාමය දත්ත, රාජ්‍ය තොරතුරු මූලාශ්‍ර, විශ්ව විද්‍යාලයන්හි දත්ත ගබඩා, පෞද්ගලික දත්ත ගබඩා (උදාහරණ :- ඊමේල් ගිණුම් ආදිය). මෙම ජාලය තුළ විවිධ තොරතුරු ගබඩාකර ඇත. මෙම ඩීප් වෙබ් ජාලය වෙත අප භාවිතා කරනා වෙබ් බ්‍රව්සර් එකක් මාර්ගයෙන් පිවිසීමට නොහැකිය. එනමුත්, ඩීප් වෙබ්හි පවතින ඇතැම් වෙබ් අඩවි වෙත අප භාවිතා කරනා වෙබ් බ්‍රව්සර් එකක් හරහා පිවිසීමට හැකිය. අන්තර්ජාලයෙන් වැඩි ඉඩ ප්‍රමාණයක් ගෙන ඇත්තේ *Deep Web* සඳහා වන අතර, මෙහි තිබෙන දෑ කිසිදු සෙවුම් යන්ත්‍රයක් භාවිතාකර හෝ ලබාගත නොහැකි අතර, අප විසින් යම් කරුණක් පිළිබඳව ගූගල් වැනි සෙවුම් යන්ත්‍රයක් භාවිතයෙන් සෙවීමක් කළවිට ලැබෙන ප්‍රතිඵලය 100% යේ ප්‍රතිශතයෙන් ගත්විට අප දකිනුයේ 1% ක් වැනි සුළු ප්‍රමාණයකි. එමගින් සමස්ත අන්තර්ජාලයේම තිබෙනා විශාලත්වය සහ සංකීර්ණත්වය කෙසේද යන්න අනුමාන කරගත හැකිය.

## 3. *Dark-Web or Dark-Net* ඩාර්ක් වෙබ් නොහොත් ඩාර්ක් නෙට්



ඩීප් වෙබ්වලටත් වඩා ගැඹුරින් ඇති මෙය ඩාර්ක් වෙබ් ලෙස හඳුන්වනු ලබයි. මෙය කෙතරම් භයානක සහ ජුගුප්සාජනක යන්නද පැවසුවහොත් මේ ජාලය තුළ ඩාර්ක් හැකර්වරුන් බහුලව සිටියි. මත්ද්‍රව්‍ය ජාවාරම්, මිනිස් ජාවාරම්, මිනිස් අවයව ජාවාරම්, මිනිමස් වෙළඳාම්, ආයුධ ජාවාරම්, ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාකාරකම් ඇතුළු සියලුම නීතිවිරෝධී වෙළඳාම්, කුලියට මිනීමැරීම්, ළමා අපචාර වෙබ් අඩවි, රතු කාමර *(Red Rooms)* ආදියෙන් පිරී පවතිනවා. මෙහි සිටිනා හැකර්වරුන් ඩාර්ක් හැකර්ලා ලෙස හඳුන්වන අතර, ඔවුන් කිසිදු අනුකම්පාවක් නොමැති මුදල් වෙනුවෙන් තම දෙමව්පියන් පවා අලෙවි කරන තත්ත්වයේ මානසික මට්ටම්වල සිටින අය ලෙස හඳුන්වා දිය හැකිය. මෙවන් පුද්ගලයින් හට අපගේ පුද්ගලික පරිගණකයන්හි ආරක්ෂාව වෙනුවෙන් වෙළඳපලෙන් මිලදී ගන්නා ප්‍රති වෛරස් මෘදුකාංග *(Virus Guards)* පයට පෑගෙනා දූහුවිල්ලක් තරම්වත් අභියෝගයක් නොවේ.

## රතු කාමර *(Red Rooms)*

ඩාර්ක් වෙබ් ගැන සඳහන් කිරීමේදී රතු කාමර නොහොත් රෙඩ් රූම්ස් ගැන විශේෂයෙන්ම සඳහන් කළ යුතුය. රෙඩ් රූම්ස් ගැන පැවසීමට පෙරාතුව මේවාට ඒකරාශීවන අය ගැන සඳහන් කළයුතුය. අප සමාජයේ විවිධ ආකාරයේ මානසික විකෘතිතා ඇති පුද්ගලයින් සිටිනවා. විකෘති ලිංගික ආශාවන් ඒ අතර ප්‍රධාන ස්ථානයක් ගනු ලබනවා. ඒ අතර තවත් පුද්ගලයකු හට වදහිංසා පමුණුවන ආකාරය දෙස බලා සිට තෘප්තියක් ලැබීමට හැකි මානසික මට්ටම්වල සිටින විකෘති ආශාවන්ගෙන් පිරි පුද්ගලයින්ද සිටිනවා. එවැනි පුද්ගලයින් එක්ව සජීවීව පුද්ගලයකුට වදහිංසා පමුණුවා සජීවීව මිනිසුන් මරාදමන අතරම වදදීම සිදුකරන පුද්ගලයා ලවා විවිධ අයුරින් ඔවුන් තෘප්තිමත් වන ආකාරයේ වදහිංසාද පමුණුවන ලෙස අණ කරමින් විනෝදවීමට මොවුන් රෙඩ් රූම් වෙත ඒකරාශී වේ. එම වදයට ලක්වෙන අය අතර කාන්තාවන් පිරිමින් කුඩා දරුවන් සහ සතුන් පවා සිටියි. එපමණක් නොව මේවා පවත්වාගෙන යන පරිගණක හැකර්වරුන් විසින් කුඩා දරුවන් යොදාගනිමින් අසභ්‍ය වීඩියෝ පට නිර්මාණය ඇතුළුව මිනීමස් අනුභවය සහ මිනිසුන්ට ලිංගික වදහිංසා පමුණුවා මරාදැමීම ආදී බොහෝමයක් පිළිකුල් සහගත මෙන්ම කෲරතර දෑ සිදුකරමින් රෙඩ් රූම් *(Red Rooms)* හරහා මහා පරිමාණයෙන් මුදල් උපයනු ලබනවා.



## වයිට් හැකර්ස් *(White Hackers)*

මොවුන් විසින් නිරතුරුවම රාජ්‍ය හෝ පෞද්ගලික අංශයන්හි ඇති පරිගණක පද්ධතීන්ට සහ උපාංග තුළට අනවසරයෙන් පිවිස ඒවායේ ඇති අඩුපාඩුකම් පෙන්වාදෙනු ලබන අතර, ඩාර්ක් හැකර්ස්ලාගේ ක්‍රියාකාරකම්වලට එරෙහිවන එකම ස්වාධීන කණ්ඩායම වනුයේ වයිට් හැකර්වරුන්ය. ඩාර්ක් වෙබ්හි පවතින රෙඩ් රූම් හෙළිදරව් කිරීම, ළමා අපචාර වෙබ් අඩවි අවහිරකර දැමීම ආදී බොහෝමයක් විනාශකාරී දෑ වලට විරුද්ධව කටයුතු කිරීම ආදී වැදගත් කාර්යභාරයක් වයිට් හැකර්ස්ලා විසින් සිදුකරනු ලබයි.

## ඩාර්ක් වෙබ් නිසා සමාජයට සිදුවන විනාශය

ඉහත කී ඩාර්ක් හැකර්ස්වරු සහ විවිධ ජාවාරම්, කුලියට මිනීමැරීම් සිදුකරනා මෙන්ම වදහිංසාවට ලක්වන අය ළමා අපචාරයන්ට ගොදුරුවන දරුවන් ආදී පිරිසත් අප සමාජයේ අප අතරම සිටින අය බව කිවහොත් ඔබ පිළිගන්නවාද? බොහෝවිට එම කටයුතු මෙහෙයවන අය ඔබගේ සහෝදරයකු හෝ දරුවකු, හිතමිතුරකුද විය හැකිය. ඩාර්ක් වෙබ් යනු සාමාන්‍ය කෙනකුට පිවිසිය නොහැකි සේම ඩාර්ක් වෙබ්හි ක්‍රියාකාරකම් මෙහෙවනා පුද්ගලයින්වද අපට නොපෙනේ, ඩාර්ක් වෙබ් තරමටම ඔවුන්ද රහසිගතය. බොහෝවිට මෙම කෲරතර හැකර්ස්වරු මේ ලිපියේ මුලින්ම කියූ ආකාරයට විවිධ පුද්ගලයින්ව අන්තර්ජාලය ඔස්සේ තම ග්‍රහණයට නතුකර ඔවුන් තුළ ඇති විවිධාකාර දුර්වලතාවයන් හඳුනාගෙන විවිධාකාර රහස් හෙළිකරගනිමින් ඔවුන්ට තර්ජනයකොට බියගන්වා තම අභිප්‍රායන් ඉටුකරගැනීමට ඉතා දක්ෂය.

මීලඟ කොටස ඊළඟ කලාපයෙන්...



සටහන -:
සෙ/322441 සැරයන් පෙරේරා එම්ටීවීආර් ආර්එස්ඩී
1 ශ්‍රීලපාහ
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය
බත්තරමුල්ල



# විරිය එඩිබල තෙදට සම ඇති යුදබිමේ ලන්දූ

කාන්තාව යනු නිවසක ශ්‍රියාව යැයි ඇතැම්හු පිළිගනිති. තවත් පිරිසක් එය එලෙස නොපිළිගනිති. උපතේ සිට මරණය දක්වා දැරිවියක්, දියණියක්, යෙහෙලියක්, මවක් ලෙස ඇ මේ විසල් ලොව සියලු භූමිකා තුළ විරාජමානය. යුද්ධ සෙබළියද එලෙසම තම වීර්යය පෙරටුකොටගත් කාන්තා නියෝජනයේ සන්නාමයයි. ඇය රටටම දැරිවියක්, දියණියක් , යෙහෙලියක් සහ මවකි. ලෝකයේ සියලු ස්ත්‍රීන් අතර පෞරුෂ අභිමානය රකින්නිය ඇයයි. විසල් ලොවෙහි සියලු අභියෝග මැද ඇය දිවා රෑ නොබලන්නීය. තම රැකියාව රාජකාරිය පෙරමුණු කරගෙන පවුල නම් වූ දෙවොලෙ රකින්නීය, සරසන්නීය, පුදන්නීය. ඇ මෙම කැපකිරීමට ප්‍රයත්න දරන්නේ ජීවිතයේ නේකවිද වූ දෝමනස්සයන් කරපින්නා ගනිමිනි. බොහෝ කතාවලට පුරාවෘතාන්ත ඇත. ඒවා තුළ ඇ විටෙක වීර කතක් හෝ ජනප්‍රිය කතක් ලෙස පෙලහරපායි. මා ඉදිරිපත් කරන්නට යත්න දරන්නේම ලෝකය ඉදිරියේ සියලු කාන්තාවන් අභිමුව පුරාවෘත පමණක්ම වූ එය කියවන්නට පාඨකයන් නොවූ කාන්තා භූමිකාවක් පිළිබඳවය. ඒ "යුද්ධ සෙබළිය" ගැනය.

පසුගිය කාලවකවානුවේ කොවිඩ් සීමාමායිම් අතික්‍රමණය කරන්නට අප සියල්ලන්ම අපොහොසත් වූ කාලවකවානුවකි. ඒ බොහෝ අවස්ථාවල අප නිරෝධායන ක්‍රියාවලියට යොමුවූයේද පවුල, සමාජය, රට යන සියල්ල පාහේ රෝගයෙන් ආරක්‍ෂා කරන්නටය. මාහට ලබැඳි මිතුරිය හා මම නිරෝධායනයට ලක්වූයේ යුද්ධ හමුදාවට අයත් සියලුම පහසුකම්වලින් පූර්ණ වූ නිරෝධායන මධ්‍යස්ථානයකය. යුද්ධ හමුදා භටපිරිස්හි ශ්‍රම දායකත්වය හා පාලනයට නතු වූ ඒ සෑම නිරෝධායන මධ්‍යස්ථානයක් තුළම වූයේ මානසික සුවය රැඳි පරිසරයකි. එහි මා ද මාගේ යෙහෙලියද සිටියේ නිදහස් මානසිකත්වයකිනි. ලද කෙටි විරාමයකදී ගීතයක් මිමිණීමට පුරුද්දක්ව තිබූ මා සියලු පීඩා දුක්ඛ දෝමනස්සයන් පලවා හැරියේ ලැබෙන එකදු විනාඩියට හෝ දෙකටය. නිරෝධායන මධ්‍යස්ථානය පුරා නිහැඬියාව පැතිරගොස් තිබුණි. මම ආසාවෙන් ගැයීමට පටන්ගත්තේ නිරායාසයෙන් හදට ආ දරු නැලවිලි ගීයකි. ඒ නිරෝශා විරාජිනියගේ "සුදු ඇත් පොව්වෙක්" ගීතයයි. දන්නා සියලු ආකාරයෙන් තාල රකිමින් මා ඒ ගීය ගැයුවාය.

එවෙලේම වේගයෙන් ආ හඬක් මගේ සියලු තාල අභිබවා දෙසවනේ වැකී මා හඬ නිහඬ කිරීමට සමත්විය.

"කෝප්‍රල් ඔයාද සිංදු කියන්නේ..... අනේ එපා කෝප්‍රල්" බැගෑපත්වීමක්දෝ අණදීමක්දෝ ඒ දෙකෙන් කුමක්දැයි මට නිශ්චය කරගන්නට නොහැකි විය.

මම හීරාන්ත වූයෙමි. මාතින් සිදුවූයේ වරදක්ය යන්න මා නොදත්තේය.

ආ... ඇයි කෝප්‍රල් මම ඇසුවෙමි.

ඇ... මා දෙස බලා සිටියා පමණි. මම ඇ දෙස බැලුවෙමි. අසරණව ඇ ඇගේ ළය මඬල මත දෑත් දරා සිටිනු මම දුටුවෙමි.

සමාවෙන්න කෝප්‍රල් මම කීවෙමි. මා කළේ වරදක්යැයි මා දහස්වර පසු තැවුනෙමි.

ඇ තෙත්වන ළැම තුරුලේ දෑත් හොවා කඳුළු පුරවා උන්නාය. උණු ක්ෂීර ධාරා ඇ හැඳසිටි වස්ත්‍රය තෙමා ගලා යනවා මම දුටිමි. මාගේ හෘද සාක්‍ෂියට අනුව මම වැරදිකරුවෙක්මි. මට සමාව අයැදීමට කවුරුන් හෝ නොවේ. මම හදවත නම් උසාවි බිම ඒ අනුවේදනීය නඩුව කැඳවූවෙමි. ඒ මවගේ ආදරය ළඟ මා පරාජිතය. දරුවන් වැදීම පමණක් නොව දරුවන් හැදීමද මවකගේ උතුම්ම කාර්යයකි. තම සුතනන් වෙනුවෙන් ලේ කිරට හැරෙන්නේම ඒ ආදරයේ බල මහිමයෙනි. මා ගැයූ ගීතයේ පද අතර වූ ස්නේහය නිසාදෝ කිරි බොන දරුවකුගේ මවක් වූ ඇයගේ ළමැද තෙත්වී තිබුණි. කොවිඩ් කාලය සහ යුද්ධ කාලය හාත්පසින් වෙනස් වූවද යුද්ධ සෙබළිය මේ සියලු තැන්හි මහමෙරක් සේ දරන්නියක් වග පසක් කළ යුතුය. තිස් වසක් පුරා පැවති මානුෂීය මෙහෙයුමේදී මෙවැනිම මව්වරුන්

තම දරුවන් වෙනුවෙන් කොතෙක් වීර්යයක් දරා ඉන්නට ඇත්දැයි මා හට මෙනෙහි විය.

අප ඇය රැකිය යුතුය. අප ඇයට කෘතඥ විය යුතුය. මතු පරපුරක් රැකිමින් ඇ කරන්නා වූ මෙහෙවර අපි අගයකළ යුත්තෙමු. ජීවිතය, ආදරය සෙනෙහසින් ගලපනා ඇයට අප සවියක් විය යුතුය. ශ්‍රී ලංකා නම් වූ මවගේ ඕවිල්ලේ නැලවුන ඇ ගැහැණු ප්‍රතිමූර්තියේ තේජමාන පිළිබිඹුවයි. ඒ ඕවිල්ලේ පහස ලැබූ ඇ ලක් මාතාව රකින්නීය. ඇ මතු පරපුරට සවිමත් ආදර්ශයකි. මානසික හා කායික ඕනෑම පීඩාවක් දැරීමට සමත් ඇ රක්ෂා කිරීම අප කළ යුත්තේමය. ඉර මැදියමෙන් සඳ මැදියමෙන් එකසේ දෑස් දල්වා සිටින ඇ තම රාජකාරිය, පවුල වෙනුවෙන් ඇප කැප වන්නීය. මතු උපදින නව දිනෙකට ඇ ප්‍රාණය ගෙනෙන්නීය. සෙබළියක් ලෙස සමස්ත රටෙහිම දරුවන් වෙනුවෙන් උපන් කැක්කුමක් ඇ තුළ ඇත. බාධක දුක් කම්කටොලු කොතෙක් ආවද ඇ සවිමත්ය. සීමාමායිම් වැටකඩොලු බිඳ සියල්ල ඇ හදවතින් තරණය කරනා වග මම දනිමි. ලොව පවතින්නේ "අම්මාගේ කිරෙන් සහ හිරුගේ ආලෝකයෙන්" යැයි මැක්සිම් ගොර්කි විසින් දැක්වූ අදහස සපත කරන්නට වෙනත් උපමා කුමක් සඳහාදැයි මම සිහි කරන්නෙමි. ඇයද මවකි. ආදරණීයම මවකි. අවි අතදැරූ ළඳ තරමට සවිමත් කතක් මේ ලොව වේද? නැත. ඒ වීර්යය, එඩි, තෙද, බල කිසිදු තවත් කතකට සමකළ නොහැකිය. බිඳිය නොහැකිය. පසුබට වියයුතු තැනෙක ඇ පසුබට වූවා විනා ඇ පරාජිත නොවන්නීය.

ඇ නව පියවරයක් තබනු නොඅනුමානය. යුද්ධ සෙබළියන් පිළිබඳව, ඔවුන්ගේ ඉවසීම ගැන කොතෙකුත් කතා වෘත්තාන්ත බිහිවී තිබුනද ඔවුන්ගේ කැපවීම ගැන කතිකාවන් අප සමාජයේ අල්ප නොවේද? අපි ඔවුන් ආරක්ෂාකළ යුත්තෙමු. අගයකළ යුත්තෙමු. එය අප සියල්ලන්ගේම වගකීමක් බව පසක්කළ යුතුමය. ඇ ආඩම්බරණීයය. ඇ සාඩම්බරණීයය. ලොව මානුෂීයම හමුදාවේ මානුෂීයම සෙබළියක් වන්නට ඇයද පින්වන්ත වූවාය. ලොව මිලේච්ඡතම ත්‍රස්තවාදීන්ට එරෙහි සටනේදී මානුෂවාදීව සටන් කිරීමට ඇ එක්වූයේ මනුෂ්‍යත්වයට නිගා නොදෙමින් මානව අයිතීන් සුරකිමිනි. ලොව තුළ අනභිභවනීය ඇ වෙනුවෙන් මෙම සටහන තබන්නේ එම අභිමානවත් කුලකයේ මාද හිමිකාරියක් වන නිසාමය.



සටහන:
සෙ/බී103810 කෝප්‍රල් චතුරානී
එච්ඩබ්ලිව්ජී
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

# තරුණ නිලධාරී පාඨමාලා - අංක 67 සී සාර්ථකව අවසන්





යුද්ධ හමුදා පුහුණු පාසල මාදුරුඔය වෙතින් 2023 ජනවාරි 02 වන දින ආරම්භ කරන ලද තරුණ නිලධාරී පාඨමාලා අංක 67 සී ඉකුත් පෙබරවාරි 22 වන දින සාර්ථකව අවසන් විය. සතියේ වැඩකරන දින 46 ක් පුරා පැවති එම පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් 98 දෙනකු සහභාගී වූහ. එහි අවසන් දේශනය එම පුහුණු පාසලේ සේනාවිධායක මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී විසින් සිදුකරන ලදී.

# අල්ලවැව මුස්ලිම් විද්‍යාලයට සූර්යකෝෂ පැනල පරිත්‍යාගයක්





මනුසත් දෙරණ ආයතනය හා මහජන බැංකු ප්‍රධාන ශාඛාවේ මෙහෙවර සංවිධානයේ අනුග්‍රාහකත්වයෙන් 5 (සෙව) ගජබා රෙජිමේන්තු අණදෙන නිලධාරීගේ අධීක්ෂණය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ අල්ලවැව මුස්ලිම් විද්‍යාලය වෙත සූර්යකෝෂ පැනල දෙකක් පරිත්‍යාග කිරීම ඉකුත් මාර්තු 03 වන දින එම විද්‍යාලයේදී සිදුකෙරිණ.



# නිවාඩුව

2009 වසරේ ජූනි වනවිට ත්‍රස්තවාදය අවසන්ව මසකට වඩා ගතව නොතිබුණි. එවකට මා මුලතිව්හි "ඔඩ්ඩන්කුලම්" ප්‍රදේශයේ ඒකක දෙවන අණදෙන නිලධාරිවරයකු ලෙස රාජකාරි භාරගත් අලුතය. යුද්ධය නිමවී තිබුණද "නන්දිකඩාල්", "පුදුමාතලන්" ඇතුළු අවසන් සටන් පැවති භූමියේ අඛණ්ඩ පරීක්ෂා කිරීම් කටයුතු කෙරෙමින් තිබිණ. ත්‍රස්තවාදීන් විසින් වළදමා තිබූ බිම්බෝම්බ, මරඋගුල් පාදමින් ඔවුන් සතුවූ අවිආයුධ සොයමින් භූමිය නිසැකකිරීම එම කටයුතුවල අරමුණ විය. එහිදී, එම ප්‍රදේශයන්හි බොහෝ තැන්වල සඟවා තිබූ අවිආයුධ සේම මුදල්, රත්රන් වැනි වටිනා ද්‍රව්‍ය රැසක්ද සොයාගැනීමට හැකිව තිබිණ. අවසන් මොහොතේ ත්‍රස්තවාදීන් ඔවුන් සතුව තිබූ සියලු භෞතික සම්පත් හැරදමාගොස් තිබූ අයුරු ඉන් ගම්‍ය විය. මේ අතරතුර ක්‍රියාන්විත ප්‍රදේශවල සිට නිවාඩු යන හමුදා සාමාජිකයන්ගේ ගමන්මලු පූර්ණ පරීක්ෂාවකට භාජනය කළයුතු යැයි ඉහළින් නියෝග ලැබී තිබිණ. ත්‍රස්තවාදීන්ට අයත් අවිආයුධ හෝ වෙනත් වටිනා යමක් ආරක්ෂක අංශ සාමාජිකයින් හරහා එම ප්‍රදේශවලින් පිටතට යාහැකිව තිබූ බැවින්, එවැනි නියෝගයක් පැනවීමට හේතු විය. ඒ අනුව මා සිටි කඳවුරෙහි නිවාඩු යන සෙබළුන්ගේද ගමන්මලු පරීක්ෂා කිරීම සිදුවිය.

අප කඳවුරෙහි නිවාඩු යන පිරිස්වල ගමන්මලු පරීක්ෂා කිරීම සිදුකරන ලද්දේ එහි පිහිටි මුරහල තුළදීය. එක්තරා දිනෙක මා එහි යන අවස්ථාවේ නිවාඩු ලැබූ නිවෙස්බලා යන සෙබළුන් පිරිසකගේ ගමන්මලු පරීක්ෂා කෙරෙමින් තිබිණ. එහිදී, එක්තරා ආධුනික සෙබළකුගේ බෑගය පරීක්ෂාකරන අවස්ථාවේ මම ඒ දෙස විමසිල්ලෙන් බලා සිටින්නට වූයේ එහි කිසියම් විශේෂත්වයක් දුටු නිසාය. තරමක් විශාල බෑගයක් වූ එහි එම සෙබළාගේ ඇඳුම්පැළඳුම් සේම සුවඳ ආලේපන, සබන්, මුහුණ බලන කණ්නාඩියක්, පාවහන් යුගල, ලේන්සුව, දත් බුරුසුව, රැවුල කපන උපකරණ ඇතුළු බොහෝ දේ තිබිණ. එවකට සෙබළුන් සෑම අයකුම පාහේ නිවාඩු යාමේදී කඳවුරෙහි පරිහරණය කරන සියලුම දේ රැගෙනයාම පුරුද්දකි. ඕනෑම අවස්ථාවකදී ඕනෑම තැනක හදිසියේ නවාතැන් ගැනීමට සිදුවුවහොත් එදිනෙදා පරිහරණය කරන සෑම භාණ්ඩයක්ම එකම බෑගය තුළ පැවතීම ඔවුනට මහත් පහසුවක්වීම ඊට හේතුවයි. විශේෂයෙන්ම ක්‍රියාන්විත බිමෙහි එවැනි අනපේක්ෂිත අවස්ථා කොතෙකුත් යෙදේ. සෑම සෙබළකුගේම බෑගයෙහි ඇති එම පොදු බඩුභාණ්ඩවලට අමතරව මෙම සෙබළාගේ බෑගයේ කඩදාසි කවරයක ඔතන ලද යමක්ද තිබුණි. මා එය පරීක්ෂාකොට බැලීමේදී එහි තිබුණේ යාපනේ ප්‍රදේශයේ වැවෙන මිදි පොකුරකි. එසේම ඒවා බහාතිබූ කවරයේ පිටපැත්තේ "ආදරණීය අක්කාට" යැයි ලියා තිබුණි. එසේම ඔහු සතුව තිබූ බැංකුපොතක්ද විය. නිකමට මෙන් මම එය පෙරළා බැලුවේ ඔහු ඉතිරි කිරීමට හුරුවඇති යහපත් සෙබළකු නොවේදැයි සිතමිනි. නමුත් එම පොත ගැහැණු ළමයකුට අයිතිව තිබූ එකකි. එහි රුː 1200.00කට වඩා තැන්පත්ව නොතිබිණ. එසේම අලුතින් මිලදීගත් සරමක්ද, චිත්තයක්ද, කාන්තාවකට ඔබින මලකින් හැඩදැමූ පන්කොළ තොප්පියක්ද ඒ අතර විය.

නිවාඩු යන සෙබළුන් බොහෝවිට අවශ්‍ය දෑ මිලදීගනු ලබන්නේ අතරමඟිනි. නමුත්, මෙම සෙබළා දින කිහිපයක සිටම තම අවශ්‍යතා කඳවුරෙහි සිටියදීම රැස්කොට තිබීම පිළිබඳ මාතුළ හටගත්තේ කුතුහලයක් සේම ප්‍රසන්න

**නිවාඩු යන සෙබළුන් බොහෝවිට අවශ්‍ය දෑ මිලදී ගනු ලබන්නේ අතරමගිනි. නමුත්, මෙම සෙබළා දින කිහිපයක සිටම තම අවශ්‍යතා කඳවුරෙහි සිටියදීම රැස්කොට තිබීම පිළිබඳ මතුළ හටගත්තේ කුතුහලයක් සේම ප්‍රසන්න හැඟීමකි. මා ඔහු පසෙකට කැඳවා තොරතුරු විමසීය. එහිදී, මා දැනගත්තේ මේ ඔහුගේ ප්‍රථම නිවාඩුව බවයි. එසේම, තමා සන්තකයේ වූ සියලු තෑගිබෝග තම මවට පියාට සේම පෙම්වතියට වෙන්කළ ඒවා බවයි. බැංකු පොත ඔහුගේ නැගණියගේ විය. සිය පියාට සව්යක් වෙමින් ඔහුද පවුලේ බර කරටගෙන ඇති බැව් පෙනේ. තවත් බොහෝ දේ දැනගත් පසු මා ඔහුව පිටත්කර හරිද්දී ඔහු එම විශාල බෑගයද එල්ලාගෙන ගමන් කරන අයුරු මම හොඳින් නිරීක්ෂණය කළෙමි. තම බෑගය කොතරම් බරවුවද ඔහු අසල වූ ට්‍රක් රථයට ගොඩවූයේ අපහසුතා විනිවිද මුහුණෙහි ඇඳි බලාපොරොත්තු සහගත සිනහවක්ද සමගිනි.**

හැඟීමකි. මා ඔහු පසෙකට කැඳවා තොරතුරු විමසීය. එහිදී, මා දැනගත්තේ මේ ඔහුගේ ප්‍රථම නිවාඩුව බවයි. එසේම, තමා සන්තකයේ වූ සියලු තෑගිබෝග තම මවට පියාට සේම පෙම්වතියට වෙන්කළ ඒවා බවයි. බැංකු පොත ඔහුගේ නැගණියගේ විය. සිය පියාට සව්යක් වෙමින් ඔහුද පවුලේ බර කරටගෙන ඇති බැව් පෙනේ. තවත් බොහෝ දේ දැනගත් පසු මා ඔහුව පිටත්කර හරිද්දී ඔහු එම විශාල බෑගයද එල්ලාගෙන ගමන් කරන අයුරු මම හොඳින් නිරීක්ෂණය කළෙමි. තම බෑගය කොතරම් බරවුවද ඔහු අසල වූ ට්‍රක් රථයට ගොඩවූයේ අපහසුතා විනිවිද මුහුණෙහි ඇඳි බලාපොරොත්තු සහගත සිනහවක්ද සමගිනි.

සවස් යාමයේ කඳවුරෙහි තනි වූ මොහොතක එම සෙබළා කී දේවල් මාහට එකිනෙක මෙනෙහි වන්නට විය. ආධුනික සෙබළකු වුවද ඔහු කෙතරම් අව්‍යාජ අයකු විද. අවසානයේ ඔහු සමග වූ කතා බහෙන් මා උකහා ගත් දේ මෙලෙස අකුරු කරන්නට වූයේ මාද ඔහු බවට පත් වෙමින් විඳි ආශ්වාදජනක හැඟීමෙනි.



සටහන
ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ

තැව් තැව් දුක් විඳින මෑණියන් සනසන්න
හැරි හැරී මගබලන පෙමට යළි පණ දෙන්න
ගිනි අවිය අත රැඳුණු සතියකට සමුදෙන්න
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

වැට බැඳුණු කටුකම්බි මරුළගුල් දැමූ නෙක
මුර කපොලු යුද අගල් දිවා රෑ ගාඩ්එක
දමා තනිකර ගොසින් ගෙවෙන්නට ඉතින් හැක
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

අවසාන වතාවෙදි වෙලාවට නා හින්ද
පමාවට හේතුවක් විනිද එය අනෙ මන්ද
සමාවී හිඳින් සොඳුරියේ ඇස් මග රන්ද
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

කුඹුක්ගහ ළග කඩේ පහළ දං ඕවිටේ
යටි මළුවෙ පන්සලේ ගඟ අයිනෙ පැල්කොටේ
රංචු වැද කියන්නට හපන්කම් තල් වැටේ
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

මාමලගෙ ගේ දිහා නොගියාට කාලෙකින්
නෝක්කාඩුව තවම අඩු නොමැත  අම්මගෙන්
මෙදාවර නොවැරැදී හනික එන්නට  ගොසින්
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

පාළුවී වල්වැදුණ කොහිල කොටුවේ  හේන
තාත්තගෙ ඇවිට්ල්ල නිසා එළිකර  දෙන්න
ඇළ අයිනෙ ඉස්මත්තෙ බඩඉරිඟු  අතුරන්න
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

හිත පුරවගෙන පැතුම් පොදි තරම් මහ මෙරක්
ලොකු අක්කා කුස දරාගෙන හිඳින දරුගැබක්
යාපනෙන් රැගෙන යන්නට ඇයට මිදිමුලක්
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ

දෙතුන් සීයක් පිරුණු නංගිගේ බැංකු පොත
දෙතුන් ගුණයකින් පුරවන්න වගකීම ඇත
ඉතින් දුර නොවේ නැගණියේ නුඹ දකින නෙත
නිවාඩුව මේ මාසෙ අග යළිත් ලැබෙනවනෙ




# 2000 වර්ෂයේදී අලිමංකඩ කඳවුරේ බිඳවැටීම

සටහන:
මේජර් සරත් ජයවර්ධන - ශ්‍රීලංජාආබමු
හමුදා ලේකම් කාර්යාලය - යුආමු

ශ්‍රී ලංකා යුද ඉතිහාසයේ නිරන්තරයෙන් අවධානයට යොමුවන අලිමංකඩ ප්‍රදේශය පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලන යුගවලදීත් නිදහසින් පසුවත් යුදමය වශයෙන් බෙහෙවින් වැදගත් භූමියක් විය. ක්‍රි.ව. 1776 දී ලන්දේසීන් විසින් අලිමංකඩ බලකොටුව ඉදිකරන ලද අතර, එහි සංග්‍රාමික වැදගත්කම පිළිබඳ අවධානය යොමු කළ බ්‍රිතාන්‍යයින් විසින්ද ඔවුන්ගේ ආරක්‍ෂක කටයුතු සඳහා එය යොදාගන්නා ලදී. ඔවුන්ගේ මෙම බලකොටුව යාපනය, පූනරීන් සහ මුලතිව් බලකොටු සමග සබඳකම් පවත්වාගෙන ගියේය. යටත් විජිත සමයෙන් පසුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කඳවුරක් ලෙසද පවත්වාගෙන ගිය වැදගත් ස්ථානයක් වූ අලිමංකඩ, කොටි ත්‍රස්තවාදීන්ට අතිශය වැදගත් උපක්‍රමික ප්‍රදේශයක් විය. යාපනය නගරයට ප්‍රවේශවන ප්‍රධාන දොරටුව වන අලිමංකඩ භූමිභාගය යුද හමුදාව යටතේ පැවතීම ත්‍රස්තවාදීන්ට විශාල බාධාවක් විය. ඒ අනුව ඊළාම් යුද්ධයේදී අලිමංකඩ භූමිය ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ට මෙන්ම ත්‍රස්තවාදීන්ටද අතිශය වැදගත් යුද උපක්‍රමික ස්ථානයක් බව කිව යුතුය.

පූනරීන් සංගුපිටිය ජැටිය හරහා තිබුණු මාර්ගය හැරුණුවිට යාපන අර්ධද්වීපයට දකුණින් ඇතුල් වීමට තිබූ එකම මාර්ගය වූයේ අලිමංකඩ හරහා වැටී තිබුණු මාර්ගය පමණි. ඒ වනවිට ගුවනින් පමණක් සම්බන්ධ වූ අලිමංකඩ කඳවුර යුද උපක්‍රමිකව ඉතා වැදගත් විය. මෙම කඳවුර සිය ග්‍රහණයට ගැනීම, යාපනය අර්ධද්වීපයට බාධාවකින් තොරව ඇතුල්වීමටත් පිටවීමටත් පහසුවීම මගින් ත්‍රස්තවාදීන්ට ඉතා විශාල වාසියක් ගෙන දෙන්නක් විය. එබැවින් අලිමංකඩ ප්‍රදේශය යුද හමුදාව යටතේ පැවතීම ත්‍රස්තවාදීන්ගේ කටයුතුවලට විශාල අවහිරයක් විය.

1958 වසරේදී අලිමංකඩ යුද හමුදා කඳවුර ස්ථාපිත කරන ලද අතර එය 2000 වර්ෂය දක්වාම හමුදාවේ පාලනය යටතේ පැවැතිණි. 1991 වර්ෂයේදී LTTE ත්‍රස්තවාදීන් අලිමංකඩ කඳවුරට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළද එය ඔවුන්ගේ යටතට ගැනීමට නොහැකි වූ අතර, ඒ පිළිබඳව මෙහිදී අවධානයට යොමු නොවේ. අවසන් වරට අලිමංකඩ කඳවුර ශ්‍රී ලංකා හමුදාවට අහිමිවූයේ 2000 අප්‍රේල් මස 22 වන දිනය. නොනවතින රැල්ල තුන මෙහෙය වූ කොටි නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ අදහස වූයේ මුළු යාපනය අර්ධද්වීපයම ඔවුන් අතට පත්කර ගැනීමය. ඒ සඳහා ක්‍රියාත්මක වූ ඔවුහු කිලිනොච්චිය, මාන්කුලම්, පූනරීන් සහ මුලතිවු යන ප්‍රදේශයන්හි පිහිටි යුද හමුදා කඳවුරු දැවැන්ත ප්‍රහාර මාලාවක් එල්ලකර අත්පත් කරගත්හ. ඔවුන්ගේ ඊළඟ ඉලක්කය වූයේ යාපනය සහ යාපනයට දකුණින් වූ ප්‍රදේශ සම්බන්ධ කරන මධ්‍යස්ථානය වූ අලිමංකඩ අල්ලා ගැනීමය. මේ වනවිට බ්‍රිගේඩියර් එගොඩවෙලේ අණදුන් 54

වන සේනාංකය යටතේ අලිමංකඩ හමුදා කඳවුරු සංකීර්ණයේ දස දහසකට  ආසන්න භටපිරිසක් ස්ථානගතව සිටියහ.

ත්‍රස්තවාදීන්ගෙන් එල්ලවුණු ප්‍රබල තර්ජන හේතුකොටගෙන අලිමංකඩ ඇතුළු යාපන අර්ධද්වීපය ශක්තිමත් කිරීම සඳහා වන්නියෙන් සහ නැගෙනහිරින් භටපිරිස් කැඳවනලද අතර, ඒ වනවිට වව්නියාවේ ස්ථානගතකර තිබූ බ්‍රිගේඩියර් ගාමිණී හෙට්ටිආරච්චිගේ නායකත්වයෙන් යුත් 53 වන ප්‍රහාරක සේනාංකය 2000 වර්ෂයේ ජනවාරි මාසයේදී අර්ධද්වීපය වෙත ගෙන්වන ලදී. යාපන අර්ධද්වීපයේ නැගෙනහිර වෙරළේ වෙත්තලකර්නි ප්‍රදේශයේ බලය තහවුරු කරගනිමින් අලිමංකඩ කඳවුර වෙත එල්ල වෙමින් තිබුණු LTTE තර්ජන මැඩපවත්වා ත්‍රස්තවාදීන් පළවාහැරීම එම සේනාංකයේ ආරම්භක කාර්යභාරය විය.

මේ අතර සාම්ප්‍රදායික සටන් උපක්‍රම වෙනස් කරමින් අලිමංකඩ අත්පත් කරගැනීමට LTTE ත්‍රස්තවාදීහු ක්‍රියා කළ අතර එම සංග්‍රාමික සැළසුම විමසීමට ලක්කිරීම වැදගත් වේ. බාල්රාජ්ගේ නායකත්වයෙන් යුත් චාල්ස් ඇන්තනී බලකායේ භටපිරිස් විසින් අලිමංකඩ කඳවුරට ඇති සැපයුම් මාර්ග සියල්ල අක්‍රිය කිරීම ඔවුන්ගේ උපක්‍රමික සැලැස්මේ ප්‍රථම අදියර විය. ඉනික්බිතිව අලිමංකඩ කඳවුරට දකුණින් පරන්තන් දෙසින් ප්‍රහාර එල්ල කිරීමට නියමිත වූයේය. ඊට සමගාමීව යාපන අර්ධද්වීපයේ තැනින්තැනට ප්‍රහාර එල්ල කරමින් එම ප්‍රදේශයේ ආරක්ෂක හමුදාවන් එම ප්‍රහාර මැඩපැවැත්වීමට යොමු කරවීම තුළින් අලිමංකඩ කෙරෙහි ඇති අවධානය අවම කිරීම සැළසුමේ ඊළඟ අදියරයි.

ඒ අනුව ත්‍රස්තවාදීහු මුලින්ම අලිමංකඩ වෙත තිබූ බාහිර සබඳතා හා සැපයුම් මාර්ග අක්‍රිය කරමින් එම කඳවුර හුදකලා කිරීමට පියවර ගත්හ. එහිදී, ත්‍රස්තයන්ගේ ප්‍රධානම අවධානය යොමුවූයේ අලිමංකඩ යුද හමුදා කඳවුරට බීමට ජලය ලබාගත් එම කඳවුරට උතුරින් අයියකච්චි ප්‍රදේශයේ තිබූ ළිං අත්පත්කර ගැනීමයි. ඉන් එම කඳවුරට ජලය ලැබීම ඇනහිටි අතර එම ප්‍රදේශයේ ජලය අධික කිවුල සහිත බැවින් කඳවුරේ සිටි සෙබළ බොහෝ අසීරුතාවට පත්වූහ. ඊට සමගාමීව 2000 මාර්තු 26 වන දින රාත්‍රියේදී LTTE චාල්ස් ඇන්තනී

**අලිමංකඩ කඳවුරට 1991 වර්ෂයේදී ත්‍රස්තවාදීන් ප්‍රබල ප්‍රහාරයක් එල්ල කරමින් එම කඳවුර යටපත් කරගැනීමට දැඩි උත්සහයක නිරත වූවත් දින 53 ක කාලයක් අධාරක භටපිරිස් පැමිණෙන තෙක් මේජර් සනත් කරුණාරත්නගේ නායකත්වයෙන් යුත් 6 සිංහ රෙජිමේන්තුව කඳවුර රැකගත් අයුරු මේ මොහොතේදී සිහිපත් වේ. එහිදී, ත්‍රස්තවාදීන් විසින් වටකර තිබූ අලිමංකඩ කඳවුර, මේජර් ජෙනරාල් කොබ්බෑකඩුව සහ බ්‍රිගේඩියර් විජය විමලරත්න ගේ නායකත්වයෙන් යුතුව "බලවේගය" මෙහෙයුම මගින් බේරාගන්නා ලදී.**

බලකාය සහ මුහුදු කොටි බලකාය එක්ව A 9 මාර්ගයේ චාවකච්චේරි හා අලිමංකඩ අතර මුහමලේ ආශ්‍රිත ඉත්තාවෙලි ප්‍රදේශයේ කිලෝ මීටර් 2 ක පමණ දුර ප්‍රමාණයක් අත්පත් කර ගත්හ. ඒ අනුව අලිමංකඩ කඳවුර හා ඒ අවට අනුබණ්ඩවලට සැපයුම් ලබාදීම සඳහා යුද්ධ හමුදාවට විකල්ප මාර්ග සෙවීමට සිදුවිය. ඊට අමතරව ත්‍රස්තවාදීන් විසින් අර්ධද්වීපයේ නැගෙනහිර වෙරළ තීරයෙහි වෙත්තලකර්නි ප්‍රදේශය අත්පත් කරගෙන තිබීමත් නිසා අලිමංකඩ කඳවුරට තිබූ මුහුදු සැපයුම් මාර්ගයද අවහිර විය.

වෙත්තලකර්නි ප්‍රදේශයෙන් මෙහෙයුම් ආරම්භ කරමින් ත්‍රස්තවාදීන් පළවාහැරීමට 53 වන සේනාංකයට පැවරී තිබුණද, ඒ වෙනුවට ත්‍රස්තවාදීන් විසින් අත්පත් කරගෙන තිබූ A 9 මාර්ගය යළි ප්‍රතිස්ථාපිත කිරීමට ප්‍රමුඛත්වයක් දිය යුතු බව යාපනය ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් දන්වන ලදී. 2000 ජනවාරි මාසයේදී යාපන අර්ධද්වීයට කැඳවන ලද 53 වන සේනාංකය 2000 මාර්තු 26 වන දින ත්‍රස්තවාදීන් විසින් A 9 මාර්ගයෙන් කොටසක් අත්පත් කරගන්නා තෙක් එම කාලවකවානුව තුළ 53 වන සේනාංකය නිවැරදිව මෙහෙයවා ඇති බවක් නොපෙනේ. මෙසේ අර්ධද්වීපයේ වර්ධනය වන ආරක්ෂාව පිළිබඳ අවිනිශ්චිතභාවය මගහැරවා ගැනීම සඳහා මාර්තු 26 දිනෙන් පසුව වවුනියාවේ ස්ථාපිත කර තිබූ බ්‍රිගේඩියර් සීවලී වනිගසේකර අණදුන් 55 වන සේනාංකයද යාපනයට කැඳවන ලදී. ඔවුන්ද කණ්ඩායම් වශයෙන් ත්‍රිකුණාමල වරායෙන් නැව් නැගී යාපනයට ගොඩබසින ලදී. මේ වනවිට 51 වන සේනාංකය (තෙන්නමරච්චි හා වඩමාරච්චි ප්‍රදේශය) හා 52 වන සේනාංකයද (වලිකාමම්) යාපනය අර්ධද්වීපයේ ස්ථානගතව සිටියහ. ඒ අනුව අලිමංකඩ ස්ථානගතව සිටි 54 වන සේනාංකයට අමතරව යුද්ධ හමුදාවේ සේනාංක 4 ක් යාපනය අර්ධද්වීයේ මෙහෙයුම් රාජකාරීන්හි නියුක්ත වී තිබුණි. මීට අමතරව අවශ්‍ය පරිදි  ශ්‍රී ලංකා නාවික හමුදාව, ගුවන් හමුදාව සහ පොලිසිය ක්‍රියාන්විත රාජකාරී සඳහා ස්ථානගත කර තිබුණි.

මෙසේ අර්ධද්වීපය ආවරණය වන පරිදි භටපිරිස් ස්ථානගතව සිටියද එහි ආරක්ෂක තත්වය තවමත් ස්ථාවර බවක් පෙන්නුම් නොකළේය. යාපනය ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති, යාපනය ආරක්ෂක සේනා ආඥපති හා සේනාංකාධිපතිවරුන්ද නිරන්තර වෙනස්කම්වලට භාජනය විය. අලිමංකඩ කඳවුරේ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතභාවය හා යාපන අර්ධද්වීපයට ඇති ත්‍රස්තවාදී තර්ජනය පිළිබඳ ගැටලුව හමුවේ රජය විසින් 2000 අප්‍රේල් 18 වන දින ඒකාබද්ධ මෙහෙයුම් ආඥපති ලෙස මේජර් ජෙනරාල් ජානක පෙරේරා සහ යාපනය ආරක්ෂක සේනා ආඥපති තනතුර සඳහා මේජර් ජෙනරාල් සරත් ෆොන්සේකා පත් කරන ලදී. ඒ වනවිට අලිමංකඩ කඳවුර වෙතින් පසුබැසීම පිළිබඳව තීරණයකට එළඹී සිටි අතර 21 දා රාත්‍රියේදී යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශ්‍රී ලාල් වීරසූරිය විසින් ඒ බව මේජර් ජෙනරාල් ලයනල් බලගල්ල වෙත දන්වා තිබුණි. ඒ අනුව කඳවුරෙන් ඉවත්වීම සඳහා 54 වන සේනාංකාධිපති වෙත අවසන් නියෝග ලබාදෙන ලදී.

අලිමංකඩ කඳවුර අතහැර ප්‍රදේශයෙන් පසුබැසීම පිළිබඳව 22 දා උදෑසන බලසේනාධිපතිවරුන් සමග සාකච්ඡා කළ සේනාංකාධිපතිවරයා එදින 11.30 ට කඳවුරුවලින් ඉවත්වීම

ආරම්භ කළහ. ඒ අනුව අලිමංකඩ සිට කිලෝ මීටර් 11 ක් පමණ දුරින් පිහිටි මුහමලේ ප්‍රදේශය වෙත පසුබැසීමට සැළසුම විය. එහිදී, බ්‍රිගේඩියර් පර්සි ප්‍රනාන්දු යටතේ 542 වන හා 543 වන බලසේනා යාපනයට දිවෙන දුම්රිය මාර්ගය දිගේ (දුම්රිය මාර්ගය අත්හැර දමා තිබුණි) ගමන් කළ අතර 541, 545 සහ 546 වන බලසේනා කර්නල් භාතිය ජයතිලක යටතේ කිලාලි කලපුව ආශ්‍රිත ප්‍රදේශයෙන් පසුබස්නා ලදී. දැඩි හිරු රශ්මිය, පරිසර උෂ්ණත්වය, බිමට ජලය නොමැතිකම ආදි ගැටලු සමගින් ගමන්ගත් සෙබළු ත්‍රස්තවාදීන්ගේ කාලතුවක්කු ප්‍රහාර හා විජලනය හේතුවෙන් මග දෙපස මැරී වැටුනාහ. ඒ අතර ත්‍රස්තයෝ අලිමංකඩ කඳවුරට අඛණ්ඩවම පහර දුන්හ. බාල්රාජ් විසින් අණදුන් චාල්ස් ඇන්තනී බලකායත්, භානුගේ නායකත්වයෙන් යුත් කාලතුවක්කු හා සන්නද්ධ රථ බලකායත්, සෝදියා හා මාලතී යන කාන්තා බලකායන් දෙකත් එම ප්‍රහාරයේදී ප්‍රමුඛත්වය ගත්හ. එසේම නගර්කෝවිල් දෙසින්ද ඇතුළුවී අලිමංකඩ කඳවුරට පහරදීම ඔවුන්ගේ යුද සැලසුමේ තවත් ප්‍රහාරක අංගයක් විය.

දින ගණනාවක් තිස්සේ එල්ල වූ සතුරු ප්‍රහාරවලින් පීඩාවට පත්ව සිටි අලිමංකඩ කඳවුරේ සෙබළුන් කායිකව දුර්වල වූ අතර, බොහෝ දෙනෙක් සතුරාගේ වෙඩි උණ්ඩයට ඉලක්ක විය. අලිමංකඩ කඳවුරේ ආරක්ෂක බලය එන්න එන්නම දුර්වල වූයේය. යුද උපකරණ රැසක් තිබියදීම එහි සිටි හමුදා භටපිරිස් ත්‍රස්තවාදීන් හා ගැටෙමින් කඳවුරෙන් පිටවීමට උත්සහ ගත්හ. එහිදීද, සෙබළු බොහොමයක් සතුරාගේ ඉලක්කය බවට පත්වූහ. මේ වනවිට අලිමංකඩ කඳවුරේ අණදීම බිඳවැටී තිබූ අතර බොහෝ භටපිරිසක් කඳවුරේ තිබූ වටිනා අවි ආයුධ අතහැර දමා ජීවිතාපේක්ෂාවෙන් ඉන් ඉවත්වූහ. මේ ආකාරයට හිස්වූ අලිමංකඩ හමුදා කඳවුර අත්පත්කර ගැනීම LTTE ත්‍රස්තවාදීන් ලැබූ සුවිශාල ජයක් මෙන්ම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අත් වූ අතිශෝචනීය පරාජයක් විය. 2000 අප්‍රේල් මස 22 වන දින හවස් වනවිට අලිමංකඩ යුද හමුදා කඳවුර ත්‍රස්තවාදීන් යටතට පත් වූ අතර, එම සටන මෙහෙය වූ භානුට අවස්ථාව ලබාදීමට ප්‍රභාකරන් තීරණය කළේය. ඒ අනුව LTTE කාලතුවක්කු හා සන්නද්ධ රථ බලකායේ අණදෙන්නා වූ භානු විසින් 2000 අප්‍රේල් 23 වන දින උත්සවාකාරයෙන් අලිමංකඩ කඳවුරේ ඊළාම් ධජය ඔසවන ලදී.

අසාර්ථක නායකත්වය හා අකාර්යක්ෂම ක්‍රමෝපාය නිසා වසර 2000 දී සිදුවූ අලිමංකඩ පසුබැසීම හේතුකොටගෙන හමුදා ජීවිත රාශියක් විනාශ විය. සෙබළුන්ගේ ජීවිත රැකගැනීම උදෙසා අලිමංකඩ කඳවුරේ පසුබැසීම සාධාරණීකරණය කළ හැකි වුවද එය සිදුකරන ලද්දේ උණුසුම් දහවල් කාලයක බැවින් එය උපායශීලී සැලසුමක්ද යන්න පැහැදිලි නැත. බොහෝ සෙබළු විජලනය හා ශරීර අභ්‍යන්තරයේ අධික උෂ්ණත්වය (dehyedration, heat stroke) නිසා හටගත් ආඝාතයෙන් මරණයට පත්වූහ. ඊට අමතරව ත්‍රස්තවාදීන්ගේ සුළු අවි ප්‍රහාර, සැඟවුණු වෙඩික්කරුවන්ගේ ප්‍රහාර හා කාලතුවක්කු ප්‍රහාර මගින්ද බොහෝ පිරිසක් මියගිය අතර තවත් එවැනිම පිරිසක් තුවාල ලැබූහ.

මෙම පසුබැසීමේදී 54 වන සේනාංකයේ නියෝජ්‍ය සේනාංකාධිපති බ්‍රිගේඩියර් පර්සි ප්‍රනාන්දු ත්‍රස්තවාදීන්ගෙන් එල්ල වූ මෝටාර් ප්‍රහාරයකින් මිය ගියේය. සේනාංකාධිපති වූ බ්‍රිගේඩියර් එගොඩවෙලේ ගමන්ගත් සන්නද්ධ රථ පෙළේ හෝ වෙනත් ක්‍රමවේදයකින් බ්‍රිගේඩියර් ප්‍රනාන්දුට මුහමලේ වෙත යාමට හැකිව තිබුණත් ඔහු සේනාංකයේ සෙබළුන් සමග පයින්ම ගමන් ගත්තේය. එසේම 541 වන බලසේනාවේ බලසේනාධිපති කර්නල් භාතිය ජයතිලක, 544 බලසේනාධිපති කර්නල් නීල් අක්මීමන සහ 54 වන සේනාංකයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ලුතිනන් කර්නල් හැරිස් හේවාආරච්චි ඇතුළු තවත් නිලධාරීන් ගණනාවක් හා සෙබළුන් සිය ගණනක් මෙම පසුබැසීමේදී මියගොස් තවත් සිය ගණනක් අතුරුදන් වී දහස් ගණනක් තුවාල ලැබූහ. අලිමංකඩ පසුබැසීමෙන් යුද හමුදාවේ නිලධාරීන්, සෙබළුන් හා සිවිල් සේවකයින් දහසකට ආසන්න සංඛ්‍යාවක් මියගිය බවද ඒ අනුව ජීවිතක්ෂයට පත් වූ සෙබළුන්ගේ මළ සිරුරු 126 ක් LTTE සංවිධානය විසින් වව්නියාවේ රතුකුරුස නිලධාරීන් හරහා යුද හමුදාව වෙත භාරදෙන බවද වාර්තාවිය.

අලිමංකඩ කඳවුරට 1991 වර්ෂයේදී ත්‍රස්තවාදීන් ප්‍රබල ප්‍රහාරයක් එල්ල කරමින් එම කඳවුර යටපත් කරගැනීමට දැඩි උත්සහයක නිරත වූවත් දින 53 ක කාලයක් අධාරක භටපිරිස් පැමිණෙන තෙක් මේජර් සනත් කරුණාරත්නගේ නායකත්වයෙන් යුත් 6 සිංහ රෙජිමේන්තුව කඳවුර රැකගත් අයුරු මේ මොහොතේදී සිහිපත් වේ. එහිදී, ත්‍රස්තවාදීන් විසින් වටකර තිබූ අලිමංකඩ කඳවුර, මේජර් ජෙනරාල් කොබ්බෑකඩුව සහ බ්‍රිගේඩියර් විජය විමලරත්න ගේ නායකත්වයෙන් යුතුව "බලවේගය" මෙහෙයුම මගින් බේරා ගන්නා ලදී.

අලිමංකඩ ස්වකීය ග්‍රහණයට ගත් ත්‍රස්තයින්ගේ ඊළඟ අදියර වූයේ යාපනය නගරය අත්පත් කර ගනිමින් පලාලි දක්වා ඉදිරියට ගමන් කිරිමයි. එහිදී, රජයේ නියෝග අනුව ත්‍රස්ත ගමන් මාර්ගයට එරෙහිව නාගර්කෝවිල් සිට කිලාලි කළපුව දක්වා ආරක්ෂක වළලු යොදමින් ත්‍රස්තවාදීන් නවතාලීමට සැළසුම් කරන ලදී. ඒ අනුව ක්‍රියාත්මක වූ භටපිරිස් කිලාලි සිට නගර්කෝවිල් දක්වා වූ ප්‍රදේශයේ බංකර් සකස් කිරිමට පටන් ගත්හ. එම ආරක්ෂක වළල්ලට රාත්‍රියේ LTTE ප්‍රහාරයක් එල්ල වූ නමුත් යුද හමුදා භටපිරිස් සිදුකළ ප්‍රතිප්‍රහාර හේතුකොටගෙන ත්‍රස්තවාදීහු පසුබැස්සාහ. ඒ අනුව සුප්‍රකට මුහමාලේ ආරක්ෂක වළල්ල ස්ථාපිත වූ අතර, එය යුද්ධය අවසන් වන තෙක්ම මුහමාලේ ආරක්ෂක වළල්ල ලෙසම ව්‍යවහාර විය.

උතුරේ සිටින හමුදා භටයින් ධෛර්යමත් කිරීම පිළිබඳව කුමාරතුංග ජනාධිපතිනිය සහ එවකට හිටපු නියෝජ්‍ය ඇමැති අනුරුද්ධ රත්වත්තේ කල්පනා කළ අතර එහිදී ඉන්දියාවෙන්, පාකිස්තානයෙන් හා චෙක් රාජ්‍යයෙන් යුද්ධෝපකරණ ලබාගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඒ අනුව එවකට පාකිස්තානයේ ජනාධිපතිව සිටි ජෙනරාල් පර්වේස් මුශාරෆ් පැය 24 ක් තුළ මෙරටට මල්ටිබැරල් යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කළේය. එමගින් පොළොව දෙදරමින් නිකුත් වූ රොකට් අවි ප්‍රහාරවලින් උතුරු සටන් බිමේ සිටි සෙබළු ප්‍රමෝදයට පත්වූහ. ඉන්පසුව සටන් බිමට අවතීර්ණ වූයේ ටාටා ට්‍රක් රථවල සවිකර තිබුණු RM-70 වර්ගයේ රොකට් 40 ප්‍රහාරක යන්ත්‍රයයි. එසේම ආරක්ෂක අංශ සියලුදෙනා කළ කැපකිරීම් නිසා මුළු යාපනය ප්‍රදේශයම සතුරාට ආක්‍රමණය කළ නොහැකි විය.



# සෙබළ සිතුවිලි

## සෙබළ සිතුවිලි...

තුවක්කුවේ කොකා පිටුපස
ඇඟිල්ලක් ඇතැයි ඔබ සිතනතාක්
සොල්දාදුවාගේ අගය ඔබට
නොවැටහෙයි
මිතුර.. ඒ පිටුපස සිටින්නේ
හද ගැස්ම ඇති මිනිසෙකි..

ඒ සොඳුරු මිනිසා මිනිස්කම මත දිවි ගෙවයි නම්
කිසි දිනක ඔබ හද තුළට
උණ්ඩයක් වැරෙන් නොම එයි
විනය සිරුරට කා වදින විට
ඉවසීම හදවතේ පැනනගී
ඒ සෙබළ සිතුවිලි මිහිපිට කිසිදිනෙක
හදවත් තුළින් සදා නොමැකෙයි..

සෙ/ජී103000
පාසෙ සෙනවිරත්න එම්අයිඑන්ජී
7(සෙවි) ගරෙ

## පොඩි පුතු...

තනිවී ගෙවෙන හැම තත්පරයක් හිතට
මහ කල්පයක් ගෙවෙනා සේ දැනුනි මට
හුරතල් රස කතා සිහිවී නෙතු අගට
වැටුණා කඳුළු කැට දෙක තුන නොදැනීම

සිහියට නැගෙනවිට පොඩි පුතුගේ මුහුණ
දුවලා යන්න සිත්විය මා හට නිබඳ
කෑකෝ ගසා සුවසේ හුස්මක් ගන්න
මා ගියොතින් රටක් කොයි මගෙ පොඩි පුතුට

දිරිය එඩිය නිබඳව ඔහු වෙත එවා
ගතේ සවිය හැම දිනයෙම වැඩි වේවා
තිස්තුන් කෝටියක් දෙවියෝ රැකදේවා
මගෙ පොඩි පුතුට මා සිහියට නොනැගේවා

සෙ/556348
ලා/කෝ විජේසිංහ ඩබ්ලිව්ඩීසීඑල්
2 කරෙ

## මතු බුදු වෙන්න අම්මේ...

රත්තරන් අම්මේ නුඹේ සෙනෙහස කියම් මම
ඔබේ ඔවදන් මට වටින්නේ මිණි මුතු තරම්ය
ජීවිතයේ සැබෑ අරුත ඔබ හොඳින් මට කියාදුන්
අම්මාගේ ගුණ කඳ සිහිකරමි හදවතින්

ජීවිතයේ අඳුර නසන අම්මාගේ සිනාවට
ලොවට පායන හිරු මඬල උපමා කළ හැකිය මට
නොදෙමි කඳුලක් අම්මාගේ හදවතට
හිරු පායන විටත් වඳිමි ඔබෙ දෙපතුල්
සඳු පායන විටත් වඳිමි ඔබෙ දෙපතුල්
බීපු කිරිවල ණය ගෙවන්නට
ප්‍රාර්ථනා කරමි මම මතු භවයෙ බුදු වන්නට

සෙ/248517 ලා/කෝ මදුවන්ත ආර්ඩීජීඑස්

## ගුරුවරයෙකි මමත් විරුවන් බිහිකරන...

ඇස් මස් ලේ නහර ජීවිත කැප කරපු
පැන්ෂන් යනව රණවිරුවන් රට රැකපු
පසුපෙළ හින නැවතත් ඒ අය හිටපු
උපදේශක මමයි සැම පුහුණුව කරපු

අප වෙත ආවා හැඩිදැඩි උස කළු කොල්ලෙක්
ගෙනවිත් දුන්නා හිස්වුන ඒගෝ කොළයක්
ටික ටික පුහුණු වෙනකොට දුන්නා අවියක්
උපදේශක මමයි දෙන නිවැරදි දැනුමක්

අවි පුහුණුවද සරඹද දේශන කරන
රණබිම් ක්‍රමද සිතියම් සහ උපකරණ
පාසල් බිමට ණය නැති විරුවන් සිටින
පාසල දැනුම උපදේශකයින් සිටින

නවක සෙබළු බිහිකරනට වෙර දරනා
ගුරුවරයෙකි මමත් විරුවන් බිහි කරනා
උපන් බිමට ණය නැති විරුවන් සිටිනා
ආඩම්බරයි ගුරුවරයකු වීම ගැනා

සෙ/482122
කෝප්‍රල් සුමනරත්න ඩීජී
1 ගරෙ

## සමාජය...

ලෝකය ලස්සන වෙන්නේ
ලස්සන පෙනුම ඇති මිනිස්සු නිසා
ලස්සන හිත් ඇති මිනිස්සු නිසයි

සෙ/108149
කෝප්‍රල් ගමගේ
3 සරෙ ශ්‍රීලසසබ

## හෙළ රණබිම...

දෙරණ දියඹ ගුවනේ විරුකම් පෑම
දිවිය දෙවනි මව්බිම වෙනුවෙන් දීම
නිදහස පැළඳු දෙවියන් මේ රට භාර
සිංහ පැටව් ලක්මව් කුසෙන් දාව

සෙ/108072
කෝප්‍රල් වීරසූරිය ඩබ්ලිව්එන්
4 සරෙ ශ්‍රීලසසබ

## අප්පච්චී...

තේජමාන කේෂර රුව
නෙත් දිලෙනා නුඹෙ රන් කඳ
ගජනාද ඇති මිහිරි වදන්
හද සසලයි නුඹ මතකය..

දුන් ඔවදන් සාගරයක්
රැකවරණය අහස් කුසක්
දැය වෙනුවෙන් කළ මෙහෙවර
බුද්ධි නෙතින් නොදැනුවත්..

ආඩම්බර වන්නට නුඹ
අප හට දුන් අනාගතය
නොසැලෙයි අදටත් නුඹ
සැලසුම් කළ අඩිතාලම..

බුදු වදනින් නෙත් පියවුන
පින්කළ මහ රන්කඳ නුඹ
නොමැති වුනත්
අප්පච්චී අද මා ලඟ
පතමි නුඹට
මතු පිවිතුරු නිවන..

නාමල් ප්‍රසන්න කුමාර
ඉඩම්ගෙදර
5 සබුබ

## නුඹට දැණෙනවාද...

මහත්තයෝ දැනෙනවාද
හිත හොයනවා නුඹ
හොයා එන්න දැනෙනවා
රන් සත්තකින්ම මට..

අඩින සිතට සිනා දුන්නේ
සත්තකින්ම නුඹ..
ආසයි එක මොහොතක් හරි
රැදෙන්න නුඹ ලඟ..

සෙ/383653
ලා/කෝ සංජීව ආර්එන්



# ක්‍රීඩා විත්ති

## විවෘත මුහුදු පිහිනුම් තරඟාවලියේ ශූරතාවය යුද්ධ හමුදාවට





ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය මගින් සංවිධානය කරන ලද 84 වැනි වාර්ෂික ජාතික සැතපුම් 2 විවෘත මුහුදු පිහිනුම් ශූරතාවලිය ගල්කිස්ස වෙරළ තීරයේ දී පිහිනුම් ක්‍රීඩා සමාජ කණ්ඩායම් 80 ක ක්‍රීඩක ක්‍රීඩිකාවන් 800 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් ඉකුත් මාර්තු 3 සහ 4 යන දිනයන්හිදී පැවැත්විණ. එහිදී ලකුණු 86 ක් ලබා ගනිමින් තරගාවලියේ ශූරතාවය අඛණ්ඩව 6 වැනි වරටත් දිනා ගැනීමට යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත් වූහ. එහිදී පිරිමි අංශයේ ශූරතා කුසලානය, ආරක්ෂක සේවා කුසලානය, සමස්ත අභියෝගතා කුසලානය, සහ හොඳම කේවල අංශයේ පිහිනුම් කුසලානය හිමිකර ගැනීමට ඔවුන් සමත්වූයේ තරගාවලියේ ඉහළම ලකුණු ලබාගනිමිනි. එහිදී ශාන්ත ජෝසප් විද්‍යාල පිහිනුම් කණ්ඩායම අනුශූරතාවයත් අම්බලන්ගොඩ දේවානන්ද විද්‍යාල පිහිනුම් ක්‍රීඩකයෝ තෙවැනි ස්ථානයත් හිමිකර ගත්හ.

## දෙස් විදෙස් දිනූ ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා ඇගයේ



ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මලල ක්‍රීඩා දක්ෂතා දැක්වූ 2(සෙව්) යුද්ධ හමුදා පොදු සේවා බලකා සාමාජිකාවන් දිරිගැන්වීමේ වැඩසටහනක් පනාගොඩ පිහිටි එම ඒකකයේදී ඉකුත් මාර්තු මස 15 වන දින පැවැත්විණ. එහිදී, "දකුණු ආසියානු රට හරහා දිවීම - 2022" තරගාවලියේ විශිෂ්ට දක්ෂතා දැක්වූ දිගුදුර ධාවක ලාන්ස් කෝප්‍රල් හේරත් එච්එම්පී හා "ඉන්දියානු රාජ්‍ය තරගාවලිය - 2022" තරගාවලියේ දක්ෂතා දැක්වූ කාන්තා සෙබළ ජයමාන්න බීඅයිඑන් වෙත එම ඒකකයේ අණදෙන නිලධාරි මේජර් පීඩීඑස්එන් ගුණරත්න විසින් සුබපැතුම් පිරිනැමීය. තවද, එම ක්‍රීඩිකාවන් වෙත එම ඒකකයේ සියලු සාමාජිකයන්ගේ අනුග්‍රාහකත්වය මත මූල්‍ය දිරි දීමනාවයක්ද පිරිනමනු ලැබීය.

# ජාතික පැරා ගෘහස්ත ඔරු පැදීමේ තරඟාවලිය - 2023 ශූරතාවය ගජබා රෙජිමේන්තුවට

ජාතික පැරා ඔලිම්පික් කමිටුව සමඟ එක්ව ශ්‍රී ලංකා පැරා ඔරු පැදීමේ සංගමය විසින් සංවිධානය කරන ලද ජාතික පැරා ගෘහස්ත ඔරු පැදීමේ ශූරතාවලිය -2023, ඉකුත් පෙබරවාරි මස 28 වන දින සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. පැරා ගෘහස්ත ඔරු පැදීමේ තරඟාවලිය සඳහා දිවයිනපුරා ක්‍රීඩකයින් 58 දෙනෙකු සහභාගී වූහ. එහිදී, ගජබා රෙජිමේන්තු ක්‍රීඩකයින් කේවල හා කණ්ඩායම් ඉසව් දෙකෙන්ම රන් පදක්කම් 02 ක්, රිදී පදක්කම් 02 ක් සහ ලෝකඩ පදක්කමක් දිනා ගනිමින් තරඟාවලියේ ප්‍රථම ස්ථානය දිනා ගැනීමට සමත් වූහ.




# ආරක්ෂක සේවා මෝටර් රථ ධාවන ශූරතාවලිය - 2023







ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සංවිධානය කරනු ලැබූ ආරක්ෂක සේවා මෝටර් රථ ධාවන ශූරතාවලිය - 2023 වැලිසර කොළඹ සුපර්ක්‍රොස් ධාවන පථයේදී ඉකුත් මාර්තු මස 16 සහ 17 දෙදින තුළ පැවති එහි ශූරතාවය ශ්‍රී ලංකා යුද්ධ හමුදා මෝටර් රථ ධාවකයින් විසින් දිනාගනු ලැබිය. එහිදී ඔවුන් ලකුණු 184 ක් රැස්කර ගනිමින් තරඟාවලියේ සමස්ත ශූරතාවය දිනාගත් අතර ලකුණු 126 ක් රැස්කරගත් ශ්‍රී ලංකා ගුවන් හමුදා මෝටර් රථ ධාවකයෝ තරඟාවලියේ අනුශූරතාවය දිනාගත්හ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මෝටර් රථ ධාවකයෝ රන් පදක්කම් 5 ක්, රිදී පදක්කම් 9 ක් සහ ලෝකඩ පදක්කම් 1 ක් දිනාගැනීමට සමත්වූහ. තරඟාවලියේ අදියර 5 සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා මෝටර් රථ ධාවකයින් 7 දෙනක් සහභාගි වූහ. තරඟාවලියේ දක්ෂතම මෝටර් රථ ධාවකයාට හිමි කුසලානය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කෝප්‍රල් ප්‍රේමරත්න එච්එම්පේඑස් විසින් දිනාගන්නා ලදී.

# 12 වන ආරක්‍ෂක සේවා ටයිකොන්ඩෝ තරඟාවලිය





12 වන ආරක්‍ෂක සේවා ක්‍රීඩා උළලේ ටයිකොන්ඩෝ ශූරතාවය ප්‍රදානය කිරීමේ උත්සවය ඉකුත් මාර්තු 16 වන දින පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදා ක්‍රීඩා කමිටුවේ සභාපති සහ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී වූයේය. ටයිකොන්ඩෝ තරගාවලිය මාර්තු මස 14 දින සිට 16 දින දක්වා පනාගොඩ යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දී ත්‍රිවිධ හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩකයින් 47 දෙනකු සහ ක්‍රීඩිකාවන් 37 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. මෙහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි ටයිකොන්ඩෝ කණ්ඩායම පිරිමි කාණ්ඩයේ ශූරතාවය දිනාගත් අතර කාන්තා කාණ්ඩයේ ශූරතාව ගුවන් හමුදා කාන්තා කණ්ඩායම විසින් දිනාගන්නා ලදී.

# ආරක්ෂක සේවා එල්ලේ තරඟාවලිය - 2023






ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කමිටුව විසින් සංවිධානය කරන ලද "ආරක්ෂක සේවා එල්ලේ ක්‍රීඩා තරඟාවලිය - 2023" ඉකුත් මාර්තු 02 සහ 03 යන දිනයන්හිදී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී පැවත්විණ. එහිදී යුද්ධ හමුදා එල්ලේ කණ්ඩායම විසින් අඛණ්ඩව තෙවැනි වතාවටත් ආරක්ෂක සේවා එල්ලේ ශූරතාව දිනාගන්නා ලද්දේ තියුණු තරඟයකින් අනතුරුවය.

අවසන් දින ක්‍රීඩා උත්සවය සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස සපැමිණි ශ්‍රී ලංකා යුද්ධ හමුදා එල්ලේ කමිටුවේ සභාපති සහ ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී ප්‍රුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ජයග්‍රාහී කණ්ඩායම් වෙත ත්‍යාග ප්‍රදානය කරන ලදී. එම තරඟාවලිය නැරඹීම සඳහා ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන්, සෙසු නිලයින් මෙන්ම එල්ලේ ක්‍රීඩා ලෝලීන් විශාල පිරිසක් පැමිණ සිටියහ.

# ගුවන් හමුදා පාපැදි සවාරිය - 2023 සමස්ත ශූරතාවය යුද්ධ හමුදාවට





ගුවන් හමුදාව වෙතින් 24 වන වරටත් සංවිධානය කරනු ලැබූ අදියර තුනකින් සමන්විත "ගුවන් හමුදා පාපැදි සවාරිය" 2023 ඉකුත් මාර්තු 04 වන දින අනුරාධපුරයෙන් අවසන් වූ අතර ඒ සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාපැදි ධාවකයින් තරඟාවලියේ ශූරතාවය දිනාගැනීමට සමත්වූහ. අදියර තුනෙහිම ජයග්‍රහණය හිමිකරගනිමින් සමස්ත ශූරතාවයට හිමිකම් කීමට සමත්වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පාපැදි ධාවකයින් තරඟාවලියේ ප්‍රබලතම පාපැදි ධාවන කණ්ඩායම බවට පත්වූහ. යුද්ධ හමුදා පාපැදි ධාවකයින් තරඟාවලිය ආරම්භයේ සිටම තම දස්කම් දක්වමින් කණ්ඩායම් හැඟීමෙන් යුතුව තරඟවැදී තරඟාවලියේ ශූරතාවය දිනාගත්හ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සමඟ තියුණු ලෙස තරඟවැදුනු ශ්‍රී ලංකා ගුවන් හමුදා පාපැදි කණ්ඩායම තරඟාවලියේ දෙවන ස්ථානය දිනාගැනීමට සමත්වූහ.

# ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අන්තර් ඒකක මළල ක්‍රීඩා තරඟාවලිය

උපකරණ මාස්ටර් ජෙනරාල් මෙන්ම ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු අන්තර් ඒකක මළල ක්‍රීඩා තරඟාවලිය සිංහ රෙජිමේන්තුවට අයත් ඒකක සහභාගීත්වයෙන් යුතුව ඉකුත් මාර්තු 04 සහ 05 යන දෙදින තුළ මධ්‍යම පළාත් ක්‍රීඩා සංකීර්ණය - දිගන හිදී පැවැත්විණ. තවද, 15(සේවා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව එහි අණදෙන නිලධාරී මේජර් ඒඑම්ඩීඑස් තිලකරත්න ගේ අණදීම යටතේ ජවන පිටිය හා සමස්ත ශූරතාවය, මළල ක්‍රීඩා ශූරතාවය හොඳම සහය දිවීමේ කණ්ඩායමට හිමි ශූරතාවය ලබාගනිමින් සිංහ රෙජිමේන්තුවට අයත් ඒකක සියල්ල අභිබවා සමස්ත තරඟාවලියේ ශූරතාව දිනාගන්නට සමත්විය.



**වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි "රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.**



ජාතික ආරක්ෂක විද්‍යාලයේ සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල් ඩීපීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2023 මාර්තු 16 වන දින සිට**



ගැමුණු හේවා බලකායේ බලකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් ඒඑච්ඩීපී එදිරිසිංහ පීඑස්සී**

**2023 මාර්තු මස 04 වන දින සිට**



68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී**

**2023 පෙබරවාරි 27 වන දින සිට**



ප්‍රධාන සංඥා නිලධාරී කාර්යාලයේ ප්‍රධාන සංඥා නිලධාරී ලෙස

**මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එස් රත්නායක එන්ඩියූ**

**2023 මාර්තු මස 01 වන දින සිට**

තවද, ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති ලෙසද හෙතෙම 2023 මාර්තු 04 වන දින රාජකාරී භාරගන්නා ලදී



විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**මේජර් ජෙනරාල් ඒසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී**

**2023 මාර්තු 13 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මූලතිව්) බ්‍රිගේඩියර් (ප්‍රමාණ) ලෙස

**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්පීඑම් විජේසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ**

**2023 මාර්තු මස 08 වන දින සිට**



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී**

**2023 මාර්තු මස 13 වන දින සිට**



පර්යේෂණ විශ්ලේෂණ යෝජනා හා සංවර්ධන අංශයේ අංශ ප්‍රධානී ලෙස

**බ්‍රිගේඩියර් එච්සීඑල් ගලප්පත්ති ආර්එස්පී යූඑස්පී**

**2023 පෙබරවාරි මස 27 වන දින සිට**



තත්ත්ව ආරක්ෂණ හා පිරික්සුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර් යූඑස්එන්කේ පෙරේරා ආර්එස්පී යූඑස්පී**

**2023 මාර්තු 09 වන දින සිට**



1 වන බලකායේ බ්‍රිගේඩියර් (පාලන/හකාස) ලෙස

**බ්‍රිගේඩියර් ඩබ්ලිව්පීඩබ්ලිව්සී පෙරේරා එල්එස්සී**

**2023 පෙබරවාරි මස 22 වන දින සිට**



222 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් එන්එස්එස් ඩයස් ආර්එස්පී**

**2023 මාර්තු 13 වන දින සිට**



සංඥා බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් එච්ඩීජේපී වීරතුංග**

**2023 මාර්තු 17 වන දින සිට**



552 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්
ඩීඑස්එස් රදලගේ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**

**2023 පෙබරවාරි මස 22 වන
දින සිට**



683 වන පාබල බලසේනාවේ
බලසේනාධිපති ලෙස

**කර්නල්
ඩබ්ලිව්ඩබ්ලිව්කේ රොහාන්
ආර්එස්පී යූඑස්පී**

**2023 පෙබරවාරි මස 23 වන
දින සිට**



1 වන බලකායේ
කර්නල් ප්‍රමානි ලෙස

**කර්නල්
ටීඩීපී සිරිවර්ධන පීඑස්සී**

**2023 පෙබරවාරි මස 20 වන
දින සිට**



59 වන පාබල සේනාංකයේ
කර්නල් (පාලන/හකාස) ලෙස

**කර්නල්
ආර්ආර්සී කරුණාරත්න
ආර්ඩබ්ලිව්පී**

**2023 මාර්තු මස 12 වන
දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(බටහිර)
කර්නල් සම්බන්ධීකරණ ලෙස

**කර්නල්
එල්ඒ මෙන්ඩිස්**

**2023 පෙබරවාරි මස 21 වන
දින සිට**



අභ්‍යන්තර විගණන අධ්‍යක්‍ෂ
මණ්ඩලයේ කාර්ය නියුක්ත
අභ්‍යන්තර විගණන
අධ්‍යක්‍ෂක ලෙස

**කර්නල්
ඩී උදය කුමාර් යූඑස්පී**

**2023 මාර්තු මස 09 වන
දින සිට**



1 වන බලකායේ
ප්‍රමානි 1 (පුහුණු) ලෙස

**ලුතිනන් කර්නල්
ආර්පීසීඒ සමරනායක
ආර්එස්පී යූඑස්පී**

**2023 පෙබරවාරි මස 20 වන
දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම)
ප්‍රමානි 1 (සම්බන්ධීකරණ) ලෙස

**ලුතිනන් කර්නල්
එම්ඒසීආර් මාකවිට
ආර්ඩබ්ලිව්පී පීඑස්සී**

**2023 මාර්තු මස 17 වන
දින සිට**



6 වන කාරක රෙජිමේන්තුව ශ්‍රී
ලංකා කාලතුවක්කු හමුදාවේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්
පීආර්ආර්කේඑස් ජයරත්න
ආර්එස්පී පීඑස්සී අයිජී**

**2023 මාර්තු මස 21 වන
දින සිට**



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම)
ප්‍රමානි 1 (ක්‍රියාත්මක) ලෙස

**ලුතිනන් කර්නල්
ඩබ්ලිව්ඩීඑස්ඩී වික්‍රමආරච්චි
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
පීඑස්සී**

**2023 මාර්තු මස 29 වන
දින සිට**



1 වන ගජබා රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්
එම්ඩීපී සමරවික්‍රම යූඑස්පී**

**2023 මාර්තු මස 05 වන
දින සිට**



22 වන බලඇණිය විජයබාහු
පාබල රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්
ඒඑම්පී අමරසිංහ
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී
පීඑස්සී**

**2023 මාර්තු මස 03 වන
දින සිට**



5 වන බලඇණිය විජයබාහු පාබල
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එච්ඒඒපී සත්කුමාර**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2023 මාර්තු මස 04 වන**
**දින සිට**



12 වන බලඇණිය ගජබා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඩබ්ලිව්පීඑන් වෙත්තසිංහ**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එල්එස්සී**

**2023 මාර්තු මස 03 වන**
**දින සිට**



5 වන ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ටීපීඑස්සී තලගහවත්ත**
**යූඑස්පී පීඑස්සී එල්එස්සී**

**2023 පෙබරවාරි මස 10 වන**
**දින සිට**



17 වන විජයබාහු පාබල
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඊආර්පීසීබී ජයවර්ධන**
**ආර්එස්පී**

**2023 මාර්තු මස 27 වන**
**දින සිට**



17(සේවා) බලඇණිය ගජබා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**එල්ඒඑම්එල්ඩබ්ලිව් බංඩාර**

**2023 පෙබරවාරි මස 20 වන**
**දින සිට**



3(සේවා) විජයබාහු පාබල
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ආර්එම්ආර් රණවීර**
**ආර්ඩබ්ලිව්පී**

**2023 මාර්තු මස 06 වන**
**දින සිට**



5(සේවා) ගජබා රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඩීඑස්වයිඑල් කුරුවිට**

**2023 පෙබරවාරි මස 27 වන**
**දින සිට**



14(සේවා) ඉංජිනේරු සේවා
රෙජිමේන්තුවේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ඩබ්ලිව්යූඑස් කරුණාරත්න**

**2023 මාර්තු මස 02 වන**
**දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර) රෙජිමේන්තු
සැරයන් මේජර් ලෙස

**බළලත් නිලධාරී I**

**සෙ/241211**
**බීඑම් විජේපාල**

**2023 මාර්තු මස 09 වන**
**දින සිට**




ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) රෙජිමේන්තු
සැරයන් මේජර් ලෙස

**බළලත් නිලධාරී I**

**සෙ/467974**
**එම්පීජීඑස් සාගර**

**2023 පෙබරවාරි මස 28 වන**
**දින සිට**



සැපයුම් හා ප්‍රවාහන
අධ්‍යක්ෂ මණ්ඩලයේ
ප්‍රධාන ලිපිකරු ලෙස

**බළලත් නිලධාරී I**

**සෙ/578377**
**ඩීඑන් කලංසූරිය**

**2023 ජනවාරි මස 01 වන**
**දින සිට**

# මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශනයක්



අභිමංසල 3 සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන්ගේ පුනරුත්ථාපන/විශේෂ අධ්‍යාපන මාසික වැඩසටහන් මාලාවට සමගාමීව ඉකුත් පෙබරවාරි 24 වන දින මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දේශනයක් පැවැත්විණි. කුරුණෑගල මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යාංශයේ දීපිකා මහත්මිය විසින් මෙම දේශනය මෙහෙයවූ අතර, ඒ සඳහා එම සුවසහන නිකේතනයේ ප්‍රතිකාර ලබන රණඝිතයට පත් නිලධාරීන්, සෙසුනිලයින් සහ කාර්ය මණ්ඩලයද සහභාගී වූහ.

# සංගීතමය වැඩසටහනක්





අභිමසංල 1 සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන්ගේ හා කාර්ය මණ්ඩලයේ සෞන්දර්යාත්මක චින්තනය හා ගීයක රස මිහිර නිවැරදිව විඳගැනීම වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ "ගීයක මිහිර" සංගීතමය වැඩසටහන ඉකුත් මාර්තු 08 වන දින පැවැත්විණි. ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ආයතනයෙහි සංගීත ආචාර්ය අසේල මිත්‍රපාල මහතා සහ කොළඹ විශ්වවිද්‍යාලීය ශ්‍රීපාලි මණ්ඩපයෙහි සිසුන් පිරිසක් සමගින් සිදුකරන ලද මෙම වැඩසටහන සඳහා එම සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන් සහ කාර්ය මණ්ඩලය සහභාගී වූහ.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී
පීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්එච්පීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්ඩබ්ලියු ලක්මිණා

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑම් - 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**ගුප්ත දිගුව**

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# විරු දරු දිරියට සේවා වනිතාවෙන් අත්වැලක්

මියගිය වීරෝදාර රණවිරුවන්ගේ දරුවන්, සේවයේ නියුතු සහ විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් මෙන්ම යුද්ධ හමුදාවේ සේවයේ නියුතු සිවිල් කාර්ය මණ්ඩලයේ දරුවන් සඳහා ලංකා බැංකුව සමග එක්ව ශිෂ්‍යත්ව 140 ක් පිරිනැමීමේ මාහැඟි සත්කාරයක් ඉකුත් මාර්තු 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී සිදුකෙරිණ. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයෙන් ක්‍රියාත්මක කරනු ලබන සුබසාධන කටයුතු තවදුරටත් පුළුල් කරමින් දියත්කළ මෙම වැඩසටහනට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වූයේය. බස්නාහිර පළාත් ලංකා බැංකු සහකාර සාමාන්‍යාධිකාරී රුවින්ද්‍රා පෙරේරා මහත්මිය, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ලංකා බැංකුව, කොළඹ-උතුර මිහිලා දිල්හානි මහත්මිය, කළමනාකරු, ලංකා බැංකුව, ලේක්හවුස් ශාඛාව උදිත පෙරේරා මහතා ඇතුළු ලංකා බැංකුවේ නියෝජිතයින් පිරිසක්ද එම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයට සහභාගී වූහ.

එහිදී, 2021 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සිසුන් 30 දෙනකුට රුපියල් 15,000.00 බැගින් බැංකු තැන්පතු සහ රුපියල් 7,000.00 වටිනාකමකින් යුත් පාසල් උපකරණ පරිත්‍යාග කළ අතර, එම සිසුන්ට දිරි දීමනාවක් ලෙස ලංකා බැංකුවෙන් රුපියල් 2,000.00 ක පරිත්‍යාග මුදලක්ද හිමිගැන්විය. මීට අමතරව 2021 වසරේදී අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත් සිසුන් 71 දෙනකුට රුපියල් 20,000.00 බැගින් බැංකු තැන්පතුවක් සහ රුපියල් 7,500.00 ක වටිනාකමකින් යුත් පාසල් උපකරණ මෙන්ම රුපියල් 2,000.00 බැගින් බැංකු තැන්පතුද පරිත්‍යාග කෙරිණ.

එසේම, 2021 වසරේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 39 දෙනකු සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් රුපියල් 25,000.00 ක බැංකු තැන්පතුවක් සහ රු 3,000.00 ක වටිනාකමකින් යුත් ලිපිද්‍රව්‍යද ලංකා බැංකුව වෙතින් රුපියල් 2,000.00 ක බැංකු තැන්පතුව බැගින්ද ප්‍රදානය කරන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදා විධායක ජෙනරාල් ඇතුළු නිලධාරීන්, සෙසුනිලයන් රැසක්ද සහභාගී වූහ.







# දිවුරුම...

දිවුරන එක අපි හැමෝම කරනව.
පාසල් කාලෙදිත්, විවාහ වෙනකොටත්,
රාජ්‍ය සේවයේදිත්, විවිධ තනතුරු
තාන්නමාන්න දරද්දිත්, තවත් වෙන
බොහෝ අවස්ථාවලදීත් පුරවැසියො හැටියට
අපි හැමෝම දිවුරුම් දෙනව. නමුත්,
ඒ කොහොම දිවුරුවත්
දැනුවත්ව හෝ නොදැනුවත්ව
ඒ දිවුරුම කඩවෙන අවස්ථා ඕනතරම්.



රණබිමේ මතක

මේ අතර හමුදාවෙ අයත් දිවුරුම් දෙනව.
හැබැයි ඒ දිවුරුම හරි වෙනස්.
ඒ තුළ තිබුණෙම මේ මව්බිම රකින බව.
කිසිදු සතුරු බලවේගයකට මේ රටට විනකරන්න
ඉඩ නොදෙන බව. කිව්ව වගේම ඒ දිවුරුම
දිවිහිමයෙන් රැක්ක එකම පිරිස රණවිරුවො විතරයි.
මතුවටත් ඔවුන් ඒ පොරොන්දු කඩකරන්නේ නැහැ.
රණවිරුවො කියන්නෙ එහෙම ජාතියක්.

